URSSSH 2024

# 4th Undergraduate Research Symposium on Social Sciences and Humanities

# SYMPOSIUM PROCEEDINGS



26th November 2024

Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka

4th Undergraduate Research Symposium
Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka

URSSSH 2024

*''Navigating the Future: Interdisciplinary Approaches to Global Challenges"*

# Symposium Proceedings

**26th November 2024**

Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka
Mihintale - Sri Lanka
2024

4th Undergraduate Research Symposium
Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka
URSSSH 2024

*"Navigating the Future: Interdisciplinary Approaches to Global Challenges"*

# Symposium Proceedings

Patron
**Prof. (Mrs.) G.A.S. Ginigaddara**
Vice Chancellor, Rajarata University of Sri Lanka

Advisory Editor
**Prof. E.M.S. Ekanayake**
Dean, Faculty of Social Sciences and Humanities

Editor in Chief
**Dr. A.M.P. Adikari**

Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka
Mihintale - Sri Lanka
2024

4th Undergraduate Research Symposium
Faculty of Social Sciences and Humanities
Rajarata University of Sri Lanka

URSSSH 2024

# Symposium Proceedings

---

**ISSN 2719-2253**

© 2024 Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. All rights reserved.

No part of the material protected by this copyright may be reproduced or utilized in any form or by any means without the prior written permission of the copyright owners unless the use is fair dealing for the purpose of private study, education, research, and review. The authors reserve the right to use their material for purely educational and research purposes.

***The authors are responsible for the content of the papers.***

**Cover design by:**
Mr. D.M.T.U.K. Dissanayaka

**Page layout by:**
Mr. M.D.C.J. Gunathilake

**Published by:**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale, Sri Lanka.

# Message of the Vice Chancellor
## Rajarata University of Sri Lanka



I convey my sincere compliments to the Faculty of Social Sciences and Humanities for organizing the fourth Undergraduate Research Symposium, which aligns with the theme *"Navigating the Future: Interdisciplinary Approaches to Global Challenges."* This event marks a significant milestone in our academic calendar, celebrating our students' innovative ideas and dedication.

Undergraduate research is the foundation of intellectual exploration. It equips students with critical thinking skills, a passion for inquiry, and a deeper understanding of their disciplines. By participating in this symposium, our students demonstrate their commitment to academic excellence and their potential to contribute meaningfully to society.

I commend the faculty and organizing committee for their tireless efforts in fostering a culture of research and discovery. Your guidance and encouragement have empowered our students to achieve remarkable success.

I congratulate our outstanding students on their accomplishments and encourage them to continue pushing boundaries. Your current research lays the foundation for future advancements in the humanities, social sciences, and other fields of knowledge.

As a university, we are committed to creating an environment that nurtures originality, creativity, and academic excellence. This symposium reflects our shared vision of shaping a future driven by curiosity and rigorous academic research.

I wish the symposium great success and look forward to witnessing the inspiring discussions and ideas that will emerge from this gathering.

**Professor (Mrs.) G.A.S. Ginigaddara**
**Vice Chancellor**
**Rajarata University of Sri Lanka**

# Message of the Dean

## Faculty of Social Sciences and Humanities
## Rajarata University of Sri Lanka



It is a great pleasure to send this message to the proceedings of the 4th Undergraduate Research Symposium organized by the Faculty of Social Sciences and Humanities of Rajarata University of Sri Lanka (URSSSH 2024). Under the theme *"Navigating the Future: Interdisciplinary Approach to Global Challenges,"* this event has grown to be a significant event in the Faculty of Social Sciences and Humanities by offering an outstanding and supportive platform for young researchers to present their creative research findings and impart new knowledge about their fields to a diverse and astute audience. In my capacity as the Dean of the Faculty of Social Sciences and Humanities of Rajarata University of Sri Lanka, I am confident that this event will give undergraduate researchers a forum for discussion and presentation of their research findings, enable them to publish their work, and spread the word about their findings to a well-read audience.

Dissemination of knowledge is a part of our responsibility as academics. To that end, Symposia like this will help to fulfill that responsibility. It is certain that this symposium will certainly assist in building a network among undergraduate researchers from different universities, promoting the sharing of their insights and experiences.

As we all know, organizing this kind of event on annual basis is not an easy task. Therefore, I would like to take this opportunity to commend Dr. AMP Adikari, Chair of URSSSH 2024, along with all the organizing committee members for their relentless dedication in making the symposium a triumph, and I express my heartfelt gratitude to all the students and faculty committee members for their tremendous commitment towards the success of this event. Finally, I congratulate the undergraduates who are going to share their research findings at this symposium and wish you a very successful research experience with URSSSH 2024.

**Professor E.M.S. Ekanayake**
**Dean - Faculty of Social Sciences and Humanities**
**Rajarata University of Sri Lanka**

# Message of the Symposium Chair

## The 4th Undergraduate Research Symposium, 2024
## Faculty of Social Sciences and Humanities



I am delighted to welcome you to the 4th Undergraduate Research Symposium on Social Sciences and Humanities (URSSSH 2024), organized by the Faculty of Social Sciences and Humanities at Rajarata University of Sri Lanka. This year, we gather under the compelling theme: *"Navigating the Future: Interdisciplinary Approaches to Global Challenges."*

Our world is changing at an unprecedented rate, with problems and opportunities emerging across environmental, technological, economic, and social fronts. These complexities necessitate novel solutions that transcend traditional boundaries, fostering collaboration across disciplines. This symposium offers a platform for young scholars to explore, discuss, and propose ideas to address these critical global challenges.

Your participation demonstrates not only a commitment to academic excellence but also a dedication to engaging with the broader issues shaping our collective future. As undergraduate researchers, you represent the next generation of thinkers, problem solvers, and leaders. We are confident that your contributions will have a far-reaching impact beyond the walls of this university.

This event celebrates multidisciplinary thinking and innovation. I encourage you to seize this opportunity to learn from your peers, challenge conventional perspectives, and develop fresh, practical solutions.

I extend my heartfelt thanks to the organizing committee and faculty members who have worked tirelessly to make this symposium a success. To all the presenters and attendees, your efforts and enthusiasm are the driving force behind this event.

May this symposium serve as a significant milestone in your academic journey. I wish everyone a rewarding and inspiring experience.

**Dr. A.M.P. Adikari**
**Symposium Chair - URSSSH 2024**
**Faculty of Social Sciences and Humanities**
**Rajarata University of Sri Lanka**

# Keynote Speech

## The 4th Undergraduate Research Symposium



Good morning, respected faculty, distinguished guests, and dear students. It is an honor to be here at the 4th Undergraduate Research Symposium of the Faculty of Social Sciences and Humanities at Rajarata University of Sri Lanka. RUSL holds a special place in my heart, as I've had the privilege to work here as a visiting lecturer for many years, and I also had the opportunity to serve as a lecturer during my sabbatical in 2015 - 2016. It is always a joy to return to this university and witness its growth and the academic energy that fills its halls.

Today's theme, *"Navigating the Future: Interdisciplinary Approaches to Global Challenges,"* speaks to both the opportunities and responsibilities you, as students and emerging scholars, hold. Research is the heartbeat of progress; it drives us forward, challenges our assumptions, and shapes our understanding of the world. As undergraduate students, engaging in research provides you with critical tools that will benefit you throughout your careers - curiosity, analytical rigor, problem - solving skills, and the resilience to face unknowns. In this forum, where we explore tracks as varied as Archaeology and Heritage Management, Communication, Entrepreneurship, Environment, Education, Language, and Tourism and Hospitality Management, you are encouraged to see beyond the limits of your field and engage with the complexity of real - world challenges through multiple lenses.

The importance of research at this stage of your education cannot be overstated. Undergraduate research empowers you to apply what you've learned in the classroom, develop hands-on skills, and explore your interests more deeply. Conducting research gives you the experience of asking difficult questions, seeking evidence, and crafting arguments - qualities that will prepare you for whatever paths you choose. But beyond the practical skills, research is transformative. It teaches you to engage critically with information, to seek clarity in complexity, and to contribute to knowledge that can improve our world.

Today, you have the opportunity not only to conduct research but also to present your findings. Presenting your work at a symposium is an invaluable part of the research process. It is one thing to work diligently on a project in the library or

laboratory; it is quite another to stand before an audience, share your findings, and engage in dialogue about them. This process of sharing and defending your ideas is essential to your growth as a researcher and thinker. When you present your work, you are honing your ability to communicate complex ideas clearly and confidently - a skill that will serve you in any field.

Presenting in a forum like this also opens up avenues for feedback. The questions you'll receive from your peers, faculty, and guests will challenge you to think about your research in new ways, to refine your perspectives, and to address any gaps. This feedback loop is a vital part of research, helping you not only to improve your current work but also to approach future projects with greater insight and precision. Furthermore, forums like this one cultivate a spirit of intellectual community. Research can sometimes feel isolating, but today, as you share your work with others, you will experience the power of collaboration and exchange. You will gain insights not only from your field but also from the diverse disciplines represented here.

Our symposium theme, with its emphasis on interdisciplinary approaches, is a call to recognize the interconnectedness of our fields. Each of you, in your unique disciplines, is exploring crucial aspects of society and culture. Whether in preserving archaeological heritage, enhancing environmental sustainability, advancing education, or driving tourism and economic development, the issues you tackle today have far-reaching implications. And in an interconnected world, these issues do not exist in isolation. For example, effective heritage management draws not only on archaeological expertise but also on communication skills to engage communities, educational frameworks to build awareness, and environmental considerations to protect heritage sites sustainably.

This symposium is an opportunity for you to embrace the richness of these connections. It is a platform to think broadly and to consider how your work might intersect with other fields. RUSL's commitment to interdisciplinary learning reflects a forward-looking vision that is essential for addressing today's global challenges. In fostering interdisciplinary research, the university equips you not only with specialized knowledge but also with the versatility and adaptability to solve complex problems in creative ways.

I want to commend RUSL for encouraging undergraduate research and providing a platform like this symposium. Today, you are not only students but also researchers, thinkers, and contributors to the global academic community. Your research, your questions, and your insights are valuable. By presenting today, you are participating in an essential dialogue that extends far beyond this campus. You are shaping the future.

I congratulate each of you on your work, and I encourage you to approach this symposium with openness and curiosity. Listen to your peers, engage with their ideas, and let today's experience inspire you to continue your journey as researchers and changemakers. Thank you, and I look forward to a day filled with ideas, inspiration, and shared discoveries.

**Professor Aminda Methsila Perera**
**Head - Department of Accountancy**
**Faculty of Business Studies and Finance**
**Wayamba University of Sri Lanka**

# Advisory Board

| | | |
|---|---|---|
| Prof. E.M.S. Ekanayake | - | Dean, Faculty of Social Sciences & Humanities |
| Snr. Prof. A. Lagamuwa | - | Senior Professor, Department of Archaeology & Heritage Management |
| Prof. P.B. Nuwan Abeywardana | - | Head, Department of Archaeology & Heritage Management |
| Prof. S.K.N. Gamage | - | Head, Department of Economics |
| Mr. D.A. Wehella | - | Head, Department of English Language Teaching |
| Prof. Manjula Ranagalage | - | Head, Department of Environmental Management |
| Prof. M.K.L. Irangani | - | Head, Department of Humanities |
| Mrs. L.N.A.B.M. Nissanka | - | Head, Department of Information Technology |
| Prof. Ven. Olaganwaththe Chandasiri Thero | - | Head, Department of Languages |
| Mr. K.G.A.P. Siriwardhana | - | Head, Department of Social Sciences |

# Organizing Committee

| | | |
|---|---|---|
| **Symposium Chair** | - | Dr. A.M.P. Adikari |
| **Symposium Secretary** | - | Mr. D.M.T.U.K. Dissanayaka |
| **Treasurer** | - | Mr. H.G.K.N. Bandara |

# Editorial Board


| | | |
|---|---|---|
| Dr. A.M.P. Adikari | - | Editor-in-Chief |
| Mr. D.M.T.U.K. Dissanayaka | - | Symposium Secretary |
| Prof. P.B. Nuwan Abeywardana | - | Head, Department of Archaeology & Heritage Management |
| Prof. S.K.N. Gamage | - | Head, Department of Economics |
| Mr. D.A. Wehella | - | Head, Department of English Language Teaching |
| Prof. Manjula Ranagalage | - | Head, Department of Environmental Management |
| Prof. M.K.L. Irangani | - | Head, Department of Humanities |
| Mrs. L.N.A.B.M. Nissanka | - | Head, Department of Information Technology |
| Prof. Ven. Olaganwaththe Chandasiri Thero | - | Head, Department of Languages |
| Mr. K.G.A.P. Siriwardhana | - | Head, Department of Social Sciences |

# Department Coordinators

| | | |
|---|---|---|
| Mr. J.M.I.R.K. Jayasekara | - | Department of Archaeology and Heritage Management |
| Mr. H.G.K.N. Bandara | - | Department of Economics |
| Ms. R.M.L.C. Kumari | - | Department of English Language Teaching |
| Ms. H.M.Y.L.P. Herath | - | Department of Environmental Management |
| Mrs. H.G.C. Sampath | - | Department of Humanities |
| Mr. M.D.C.J. Gunathilake | - | Department of Information Technology |
| Dr. M.G.N. Dayananda | - | Department of Languages |
| Mr. P.N. Haputhantri | - | Department of Social Sciences |

## Publication Committee

- Prof. R.P.I.R. Prasanna (Chairman)
- Senior Prof. A. Lagamuwa
- Prof. D.M.W.K. Dissanayake
- Prof. S.W.G.K. Bulankulama
- Prof. D.S.W. Gunawardhane
- Prof. M.K.L. Irangani
- Prof. T.G.A. Thalawaththa
- Prof. W.K.D. Keerthirathna
- Prof. D.M.S.L.B. Dissanayake
- Dr. J.M.S.B. Jayasundara
- Dr. P.S.K. Rajapaksha
- Dr. S.A.U. Niranjala
- Dr. R.M. Danapala
- Mr. M.D.S.S. Kumara
- Ms. R.A.N.N. Ranasinghe
- Mr. M.D.C.J. Gunathilake

## IT Committee

- Ms. R.N.N.N. Ranasinghe (Chairman)
- Mr. G.A.S.M.P.L.N. Abeywardhana
- Mr. J.M.I.R.K. Jayasekara
- Ms. Sharanjah Amirthalingam
- Mr. M.D.C.J. Gunathilake
- Mr. P.N. Haputhantri

## Media Committee

- Dr. R.A.N.M. Jayasinghe (Chairman)
- Prof. Ven. O. Chandasiri Thero
- Mr. A.P. Mallawaarachchi
- Ms. W.M.R.S.K. Wanninayake

## Event Organizing & Decoration Committee

- Mr. M.A.P. Kumara (Chairman - Event Organizing)
- Mr. A.P. Mallawaarachchi (Chairman - Decoration Committee)
- Ms. R.M.L.C. Kumari
- Ms. H.M.Y.L.P. Herath
- Mr. W.A.M.C.M. Adipaththu
- Mr. P.N. Haputhantri
- Mr. J.M.I.R.K. Jayasekara
- Mr. M.D.C.J. Gunathilake
- Mr. D.C.M.S. Dissanayake
- Ms. A.M.T.D. Abeysinghe
- Ms. K.A.R.K. Samarawickrama
- Mr. G.B.P. Chandrarathne

## Refreshment Committee

- Dr. M.M.S.A. Marasinghe (Chairman)
- Mr. I.R.G.D. Ihalagedara
- Mr. N.S.K. Herath
- Mr. A.A.M. Nizam
- Ms. M.T.C.H. Kumari
- Ms. P.N.N.D. Dayarathne
- Mr. P.S.R. Senadheera
- Ms. H.I. Premathilaka
- Ms. P.H.R.A.S. Kumari
- Mrs. N.G.I.M. Wickramasinghe

# Panel of Reviewers

| | |
|---|---|
| Senior Prof. Ariya Lagamuwa | Department of Archaeology & Heritage Management |
| Prof. C.R. Withanachchi | Department of Archaeology & Heritage Management |
| Prof. D.M.W.K. Dissanayake | Department of Languages |
| Prof. Manjula Rangalage | Department of Environmental Management |
| Prof. S.K.N. Gamage | Department of Economics |
| Prof. R.P.I.R. Prasanna | Department of Economics |
| Prof. D.S.W. Gunawardhana | Department of Social Sciences |
| Prof. M.K.L. Irangani | Department of Humanities |
| Prof. T.G.A. Thalwatte | Department of Humanities |
| Prof. W.K.D. Keerthirathna | Department of Humanities |
| Prof. D.M.S.L.B. Dissanayaka | Department of Environmental Management |
| Dr. P.S.K. Rajapakshe | Senior Lecturer, Department of Environmental Management |
| Dr. S.A.U. Niranjala | Senior Lecturer, Department of Economics |
| Dr. A.M.P. Adikari | Senior Lecturer, Department of Economics |
| Mr. G.K.M.C.P.B. Ambanwala | Senior Lecturer, Department of Archaeology and Heritage Management |
| Mrs. M.T.C.H. Kumari | Senior Lecturer, Department of Languages |
| Dr. W.M.T.B. Wijepala | Senior Lecturer, Department of Archaeology and Heritage Management |
| Mr. D.J.K. Ihalagedara | Senior Lecturer, Department of Humanities |
| Mr. H.G.K.N. Bandara | Senior Lecturer, Department of Economics |
| Dr. W.M.S.B. Wanninayaka | Senior Lecturer, Department of Environmental Management |
| Ms. T.G.D. Udayakanthi | Senior Lecturer, Department of Social Sciences |
| Mr. L.M.A.P. Gunawardhana | Senior Lecturer, Department of Environmental Management |

| | | |
|---|---|---|
| Dr. R.A.N.M. Jayasinghe | - | Senior Lecturer, Department of Humanities |
| Mr. M.A.P. Kumara | - | Senior Lecturer, Department of Humanities |
| Mr. P.S.R. Senadheera | - | Lecturer, Department of Social Sciences |
| Mr. K.G.A.P. Siriwardhana | - | Lecturer, Department of Social Sciences |
| Mr. Asitha Mallawarachchi | - | Lecturer, Department of Humanities |
| Ms. P.N.N.D. Dayarathne | - | Lecturer, Department of Languages |
| Ms. T.M.C.D. Senarathna | - | Lecturer, Department of Social Sciences |
| Mr. D.M.T.U.K Dissanayaka | - | Lecturer, Department of Humanities |
| Mr. H.G.C. Sampath | - | Lecturer, Department of Humanities |
| Mr. J.M.I.R.K. Jayasekara | - | Lecturer, Department of Archaeology and Heritage Management |
| Mr. W.A.M.C.M. Adhipaththu | - | Lecturer, Department of Archaeology and Heritage Management |
| Ms. Janeena Nonis | - | Lecturer, Department of Archaeology and Heritage Management |
| Mr. P.N. Haputhantri | - | Lecturer, Department of Social Sciences |
| Ven. Ginikatuwewe Vipula Thero | - | Lecturer, Department of Languages |
| Mr. Prasanga Mabarana | - | Lecturer, Department of Communication & Creative Arts, University of Colombo |
| Ms. N.G.I.M. Wickramasinghe | - | Lecturer, Department of Humanities |
| Ms. K.R. Nilmini | - | Lecturer, Department of Economics |
| Ms. H.M.Y.L.P. Herath | - | Lecturer, Department of Environmental Management |
| Ms. H.M.S.S. Illangakoon | - | Lecturer, Department of Education, University of Peradeniya |
| Ms. S.I. Boralasse | - | Lecturer, Department of Social Sciences |
| Ms. P.H.R.A.S. Kumari | - | Lecturer, Department of Social Sciences |
| Ms. A.M.T.D. Abeysinghe | - | Lecturer, Department of Humanities |
| Ms. K.A.R.K. Samarawickrama | - | Lecturer, Department of Humanities |
| Ms. Amasha Sumanapala | - | Lecturer, Department of Economics |

# Table of Content


පැරණි ලක්දිව ජල කළමනාකරණය තුළ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් වී තිබූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්----------------------------------------3

අම්පාර පුංචි සීගිරිය රජමහා විහාරයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.----------------------------------------4

අභිලේඛන මූලාශ්‍රය තුළින් හෙළිවෙන ආදායම් තැන්පත් කිරීමේ ආයතනවල සමාජ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්----------------------------------------5

යෝධ ඇළේ නිර්මාණය පිළිබඳ සමෝච්ඡ රේඛා ඇසුරින් අධ්‍යයනයක්--------------------6

පොළොන්නරු යුගයේ සිතුවම්වලින් හෙළිවන වස්ත්‍රාභරණවල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්----------------------------------------7

ශ්‍රී ලංකාවේ ගුහා සිතුවම් තුළින් නිරූපිත සත්ත්ව රූප පිළිබඳව ඌව හා නැගෙනහිර පළාත්වල තෝරගත් ස්ථාන කිහිපයක් ඇසුරින් අධ්‍යයනයක්------------------------------8

බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්----------------------------------------9

ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර තුළින් හඳුනාගත හැකි සිතුවම් කලාවේ කලාත්මක සුවිශේෂත්වය පිළිබඳ අධ්‍යයනයක්. (මැදවල ටැම්පිට විහාරය ඇසුරෙන්)------------------10

බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ලංකාවේ උඩරට ක්‍රිස්තියානිකරණය සහ ස්වදේශික සමයාන්තර සමාජ දෘෂ්ටිවාදමය පරිවර්තනයන් පිළිබඳ අධ්‍යයනයක්------------------------------------11

ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන මූලාශ්‍රය මගින් හෙළිවන භික්ෂු සමාජය----------12

පුරාතන ලංකාවේ සාංඝික දේපළ ආරක්ෂා කිරීම උදෙසා පරිහාර ලේඛනවල අන්තර්ගත සංකේත මඟින් සිදු කළ බලපෑම පිළිබඳ විමසුමක්----------------------------------------13

වලපනේ කිතුල් කර්මාන්තය සමග බැඳී පවතින කිතුල් මල මැදීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්----------------------------------------14

බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා සරසවි සඳරැස පුවත්පතින් ලැබුණු දායකත්වය------15

ශ්‍රී ලාංකේය ස්තූපවල උපරිභාගයේ නිරූපිත සංකේතාර්ථ පිළිබඳ විමර්ශනයක්-----------16

ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට ඉන්දියාව මැදිහත්වීම------------------------------------17

හඳගල කන්ද ගල්ලෙන් විහාරය පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්----18

මහනුවර ලෝක උරුම ප්‍රවර්ධනය කිරීම සඳහා උල්පැන්ගේ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ දායකත්වය පිළිබඳ විමර්ශනයක්----------------------------------------19

කැලණි විහාරයේ පැරණි බුදු ගෙහි ඇති මහනුවර යුගයේ සිතුවම් සඳහා නාග රූප බහුලව යොදාගැනීම පිළිබඳ ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටියෙන් අධ්‍යයනයක්-------------------------20

නුවරකලාවියේ උලගල්ල කෝරළයට අයත් කට්ටමුරිච්චාන ග්‍රාමය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්----------------------------------------21

මහනුවර ඩෝසන් කුළුණෙහි සංරක්ෂණ අවශ්‍යතාවය පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යනයක්.----------------------------------------22

තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින් හෙළිවන ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයෙහි ස්වරූපය----------------------------------------23

බුදුරුවගල පුරාවිද්‍යා පරිශ්‍රය සහ තදාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍ර සඳහා උරුම කළමනාකරණ සැලැස්මක්-----------------------------------------------------------------------------24

අල්ගම ග්‍රාමයෙහි ඓතිහාසිකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්------------------25

**THE FEASIBILITY OF PUBLIC RELATIONS STRATEGIES IN EVENT MARKETING - SPECIALIZING TO THE ENTERTAINMENT EVENT 'NAADHAGAMA'**-----------------------------------------------------------------29

ලංකා පෙන්තකොස්ත සභාවේ ආගමික ඇදහිලි හා විශ්වාසයන්හි සන්නිවේදනාර්ථ සහ ඇදහිලි විශ්වාස සමාජගත කිරීමේ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්-------------------------30

ශ්‍රී ලාංකීය රංගන ශිල්පියා තම මහජන සම්බන්ධතාව උදෙසා යූටියුබ් භාවිතය-----------31

ශ්‍රී ලංකාව තුළ 3-ඩී තාක්ෂණය සහිත චිත්‍රපට නිර්මාණ සිදු කිරීමේ දී පැන නගින අභියෝග සහ ගැටලු (ගජමෑන් චිත්‍රපටයට විශේෂිතව)---------------------------------------------32

ලිංගාශ්‍රිත රෝග පිළිබඳව දැනුවත් බව ලබා දීම සඳහා යොදා ගනු ලබන සෞඛ්‍ය සන්නිවේදන ක්‍රමවල උපයෝගීතාව (කුරුණෑගල දිස්ත්‍රික්කයට විශේෂිතව)----------------33

ටික් ටොක් සමාජ මාධ්‍ය තාරුණ්‍යයේ පුද්ගල සබඳතා කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්-----------------------------------------------------------------------------34

මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ මුදල් ඉපයීම සහ බලපෑම (විශ්වවිද්‍යාල සිසුන් ඇසුරින්)--35

සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් ඇතිවන සමාජයීය බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (බොරදිය පොකුණ චිත්‍රපටය ඇසුරෙන්)--------------------------------------------------36

නූතන සිනමා මාධ්‍ය තුළින් ශ්‍රී ලාංකේය ඉතිහාසය කෙරෙහි සිදුව තිබෙන බලපෑම පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් (ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ඓතිහාසික චිත්‍රපටයන් ඇසුරින්)-------------------------------------------------------------------37

දහ අට සන්නි වෙස්මුහුණු තුළින් මතුවන දෘශ්‍යරූපී සෞඛ්‍ය සන්නිවේදනාර්ථ පිළිබඳ අධ්‍යයනයක්-----------------------------------------------------------------------------38

සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය සඳහා පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්------------------------------------------39

ලිංගික හිංසනය තුරන් කිරීමට ශ්‍රී ලාංකේය තරුණියන් සවිබල ගැන්වීම සඳහා ඵලදායී සන්නිවේදන මෙවලමක් ලෙස ප්‍රජාරංගය **(Ethnodrama)** භාවිතයට ගැනීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්.--------------------------------------------------40

ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිවිරෝධී චර්යා ඉගැන්වීමට භූමිකා රංගය භාවිතයට ගැනීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්.--------------------------------------------------41

රූපවාහිනි ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර විවිධත්වය (තෝරාගත් රූපවාහිනී නාලිකා දෙකක් ඇසුරින්)------------------------------------------------------------------------------------------42

වර්තමාන ආර්ථික පසුබිම හමුවේ කුඩා පරිමාණ කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම වෙනස් වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්------------------------45

**RURAL POVERTY AND SMALL-SCALE GEM MINING (SPECIAL REFERENCE TO HOPITIGALA VILLAGE, IN RATNAPURA DISTRICT)**-------------------------------------------------------------------------------------46

විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියාවල නිරත වීම ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යනයක්--------------------------------------------------------47

**AN INVESTIGATION INTO THE IMPACT OF YOUTH UNEMPLOYMENT ON POVERTY IN SRI LANKA: SPECIAL REFERENCE TO GALENBINDUNUWEWA AREA**----------------------------------------------------48

කුඹල් කර්මාන්තකරුවන් තම නිෂ්පාදන අමුද්‍රව්‍යය ලබා ගැනීමේදී සහ නිෂ්පාදන විකිණීමේදී මතුවන ගැටලු පිළිබඳ විමර්ශනයක් (හම්බන්තොට කොහොම් පෝරුව ප්‍රදේශය ඇසුරින්)------------------------------------------------------------------------------------49

**USAGE OF E COMMERCE BY SMALL AND MEDIUM ENTERPRISES IN SRI LANKA**--------------------------------------------------------------------------50

**USAGE OF E COMMERCE BY SMALL AND MEDIUM ENTERPRISES IN SRI LANKA**--------------------------------------------------------------------------51

**STUDY ON HOW THE LEARNING ENVIRONMENT OF PRIMARY GRADES IN SRI LANKA AFFECTS THE EFFECTIVENESS OF THE EDUCATIONAL PROCESS.**--------------------------------------------------------55

**A STUDY ON THE EFFECT OF PROJECT BASED LEARNING ON DEVELOPING ENTREPRENEURIAL SKILLS IN JUNIOR SECONDARY SCHOOL STUDENT** ----------------------------------------------------------56

**TECHNOLOGY ASSISTED LANGUAGE LEARNING: AN ANALYSIS OF THE TEACHER PERCEPTIONS AND CHALLENGES IN COLOMBO DISTRICT, SRI LANKA**------------------------------------------------------57

නූතන ගෝලීය අධ්‍යාපනික අභියෝග විසඳීමෙහි ලා ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනයේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්-------------------------------------------58

විශේෂ අධ්‍යාපන පන්තිකාමරවල භාෂා සහ සමාජ අන්තර්ක්‍රියා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නවීන නාට්‍ය ශිල්පීය ක්‍රමවල සඵලතාවය පිළිබඳව අධ්‍යයනයක්--------------------59

**A STUDY OF HOW EDUCATION IS BEING MODERNIZED THROUGH THE APPLICATION OF NEW TEACHING TECHNIQUES AND CONVENTIONAL IDEAS; BASED ON THE KESĪ SUTTA.**--------------------60

**EXPLORING THE POTENTIAL INTEGRATION OF SCHOOL SOCIAL WORK AS AN INNOVATIVE PRACTICE FOR THE SRI LANKAN EDUCATION SYSTEM**-----------------------------------------------------------61

සුභාෂිතය කෘතියෙන් නිරූපණය වන චරිතායන අධ්‍යාපනයේ මූලධර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්-------------------------------------------------------------62

**COMPARATIVE ANALYSIS OF METEOROLOGICAL DROUGHT IN DRY, WET, AND INTERMEDIATE ZONES: A FOCUS ON POLONNARUWA, KANDY AND KURUNEGALA**------------------------------65

**LEVERAGING ARTIFICAL INTELLIGENCE TO OPTIMIZE ECOLOGICAL RESILIENCE IN ADAPTIVE ENVIRONMENTAL MANAGEMENT SYSTEMS IN SRI LANKA: A CONTEXTUAL ANALYZE----------66**

**BALANCING ECONOMIC GROWTH WITH ENVIRONMENTAL PROTECTION: THE ROLE OF ENVIRONMENTAL LAW IN REGULATING EXTRACTIVE INDUSTRIES AND PROMOTING SUSTAINABLE RESOURCE MANAGEMENT----------67**

**පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ස්වකීයව දායකවීමට පවතින හැකියාව, හිපි ජනතාවගේ ජීවන පැවැත්ම ආශ්‍රයෙන් කෙරෙන දාර්ශනික----------68**

**ECOTOURISM SUITABILITY INDEX FOR SIGIRIYA HERITAGE CITY USING GIS-MULTI CRITERIA DECISION ANALYSIS TECHNIQUES ----69**

**TO WHAT EXTENT PEOPLE IN THE KANDY AREA AWARE OF THE EFFECTS OF AIR POLLUTION ON HUMAN HEALTH----------70**

**A STUDY ON UNDERGRADUATES' AWARENESS OF SUSTAINABLE WATER USAGE: A CASE STUDY ON MIHINTALE HOSTEL PREMISES OF RAJARATA UNIVERSITY OF SRI LANKA----------71**

**පරිසර සංරක්ෂණයෙහිලා යිං - යැං සංකල්පයේ උපයෝගීතාව පිළිබඳ විමසුමක්---------72**

**IMPACT OF TOURISM-DRIVEN LAND-USE CHANGES ON TEMPERATURE PATTERNS IN HIKKADUWA, SRI LANKA----------73**

**පරිසර කළමනාකරණය පිළිබඳව බුදුසමයාගත ආකල්පයඃ සේනාසනක්ඛන්ධකය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්.----------74**

**IMPACTS OF TOPOGRAPHIC AND CLIMATIC FACTORS ON TEMPORAL AND SPATIAL CHANGES OF FLOODING - A CASE STUDY FROM MATARA DISTRICT----------75**

**INTEGRATING TRADITIONAL FARMING PRACTICES WITH MODERN LAND-USE PLANNING FOR SUSTAINABLE AGRICULTURE IN BORALANDA DIVISIONAL SECRETARIAT DIVISION SRI LANKA------76**

**EVALUATING THE IMPACT OF COASTAL EROSION AND HUMAN ACTIVITIES ON THE SUSTAINABILITY OF KALUTARA CALIDO BEACH, SRI LANKA----------77**

**ශ්‍රී ලංකාවේ වියළි හා තෙත් කලාප වල ජලාශයන් හි ජල ව්‍යාප්තිය කෙරෙහි සෘතුමය තත්වයන් තුළදී සිදුවන වෙනස්කම් පිළිබඳව GIS මෘදුකාංගය ඇසුරින් විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්.----------78**

**ASSESSMENT OF INDOOR AIR QUALITY LEVELS IN HOMES: A CASE STUDY FROM KEGALLE DISTRICT----------79**

**A STUDY OF THREATENED FAUNA DUE TO ECOSYSTEM DEGRADATION CAUSED BY DRYING OUT OF A LAKE: A REFERENCE TO WADIGA WEWA, HOROWPOTHANA.**--------------------------------------80

බෞද්ධ ඉගැන්වීම්හි අන්තර්ගත පරිසර සංරක්ෂණය: විමර්ශනාත්මක අධ්‍යයනයක්--------81

නාගරික මතුපිට ජල පරාමිතීන්ගේ කාලීන සහ අවකාශීය විවිධත්වය විශ්ලේෂණය; නිරිතදිග බේරෙ වැව--------------------------------------------------------------------------------82

**THE CONTRIBUTION OF WOMEN TO ECONOMIC GROWTH IN RURAL AREAS: A STUDY BASED ON THE HUMBULUWAAGRAMA NILADHARI DIVISION IN KURUNEGALA DISTRICT**-----------------------------------------83

අම්බොක්ක පත්තිනි දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍රයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්-------------------------------------------------------------------------------87

ඓතිහාසික දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර හා බැඳුණු ජන ජීවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්----------------------------------------------------88

**AN ETHNOGRAPHIC STUDY ON THE ROMAN CATHOLIC CHURCH 'S FEAST CEREMONY IN SRI LANKA.**-----------------------------------------------89

රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමත් සමඟ සිංහල භාෂාවේ ඇති වූ වෙනස්කම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය. (යටත් විජිත සමය ඇසුරින්)-------------------------------------90

**THE SIGNIFICANCE OF LANGUAGE IN INVESTIGATING EPISTEMOLOGY; A STUDY BASED ON BUDDHISM** -------------------------91

බැද්දේගම නවකතාවෙන් නිරූපිත සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ යථාර්ථය පිළිබඳ විමර්ශනයක්.------------------------------------------------------------------------------92

'සිංහබාහු' නාට්‍යයෙහි නිරූපිත ශෝකෝත්පාදක ලක්ෂණ තුළින් පුද්ගල චරිත ශෝධනය සිදුවන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්---------------------------------------93

වත්මන් තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් (සමාජ මාධ්‍ය ඇසුරින්)---------------------------------------------------------------------------------97

මානව ගබ්සාව හා උපත්පාලනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ත්‍රිපිටකය ඇසුරෙන්)------------------------------------------------------------------------------------------98

**FACTORS AFFECTING EDUCATIONAL POVERTY AMONG SCHOOL CHILDREN IN THE ESTATE COMMUNITY: A STUDY IN PUPURESSA, KANDY** ------------------------------------------------------------------------99

ලෝකයේ ගැටුම් නිරාකරණයට මනස උපයෝගී වන අයුරු බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක් -------------------------------------------------------------100

ආත්ම පරිත්‍යාගය, ආගමික ත්‍රස්තවාදය සහ ස්වදේශීය ආරක්ෂාව පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඉස්ලාම් සහ ක්‍රිස්තියානි දේවධර්මීය ආගම් ආශ්‍රයෙනි---------------------101

**THE FOUR BRAHMA VIHĀRĀS IN CHILD SEXUAL ABUSE PREVENTION** ------------------------------------------------------------------102

ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තීය ඒකාකෘති හා රැකියා තෘප්තිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්---------------------------------------103

කුලය යන සාධකය වර්තමානය වන විට සක්‍රීයව පවතින්නේද යන්න වීරගුල ග්‍රාමයේ මුල්කරගත් අධ්‍යයනයක්-------------------------------------------------------------------------------104

විරැකියාව හමුවේ පීඩාවට පත්වන ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්-------------------------------------------------------------------------------105

නාගරික ප්‍රජාව දෛනිකව ආහාර පාලනය කිරීමේ අරමුණු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්-------------------------------------------------------------------------------106

ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක්වන වින්දිතයින්ගේ පුනර්වින්දිතභාවය හා සුරක්ෂණය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්) ------------------------------------------------------------------------------------------107

ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීම සම්බන්ධ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර උත්පලවන්නා ශ්‍රී විෂ්ණු දේවාලය ඇසුරෙන්) -------------------------------------------------------------------------------108

**KANDY ESALA PERAHERA AND ITS POWER RELATIONS**-------------------109

වයස්ගතභාවය හමුවේ වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් -----------------------------------------------------------------------------110

ඕටිසම් දරුවන්ගේ භාෂා හැකියාව වර්ධනය කිරීමට රැකබලාගන්නන් සිදුකරන සංගීත ප්‍රතිකාරයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්--------------------------------------------------111

වැව ආශ්‍රයෙන් ගොඩනැගුණු ග්‍රාම නාමකරණයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්------112

ශ්‍රී ලංකාවේ අවිවාහකත්වය කෙරෙහි බලපාන සාධක හා එහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්-------------------------------------------------------------------113

නව යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම හරහා පවුල් සංස්ථාවට සිදු වී ඇති බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක ඇගයීමක්-----------------------------------------------------------114

අකුරණ ගම්මානයේ පිගාඔය පිටාර ගැලීමෙන් ඇතිවන ගංවතුර තර්ජනයේ සමාජීය බලපෑම හා එය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.-----115

**INTERDISCIPLINARY APPROACHES TO ADDRESSING GLOBAL CHALLENGES IN TOURISM AND HOSPITALITY MANAGEMENT**----------119

**INVESTIGATING THE CHALLENGES FACED BY TOURISTS IN KALPITIYA, SRI LANKA**--------------------------------------------------------120

**INVESTIGATING THE CHALLENGES TO PROMOTE SUSTAINABLE TOURISM IN ELLA, SRI LANKA**----------------------------------------------------121

ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර සේවා පිළිබඳ විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අධ්‍යයනය (ඇල්ල.සංචාරක ප්‍රදේශය ආශ්‍රයෙන්)----------------------------122

**ECO-TOURISM: ANALTERNATIVE TOURISM APPROACH FOR DESTINATION DEVELOPMENT; A STUDY BASED ON THAWALANTHE - NNA, SRI LANKA**-----------------------------------------------------------------------123

**POTENTIAL OF TRANSFORMING SRI LANKAN FOOD INDUSTRY WITH ROBOTIC TECHNOLOGY IN SRI LANKA**----------------------------------------124

# Archaeology, Heritage Management & History



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# පැරණි ලක්දිව ජල කළමනාකරණය තුළ රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් වී තිබූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*අයි.එම්.එම්. මධූෂාන් [1], ඩබ්ලිව්.ජී.එම්. තිවංක [2]*

පුරාණ ලක්දිව ආර්ථික ප්‍රතිපත්තියේ ඉතා වැදගත් ස්ථානයක් ජල සම්පත් කළමනාකරණය කර ගැනීම සඳහා යොමුව ඇත. ලාංකේය ආර්ථිකය මුළුමනින් ම පාහේ කෘෂිකර්මාන්ත පදනම් කරගත් හෙයින් ආර්ථිකය ස්ථාවර ව පවත්වා ගැනීමට ජල කළමනාකරණය වැදගත් විය. එම නිසා ජලය අවශ්‍ය ප්‍රමාණයට ගබඩා කිරීමෙන් ගොවි බිම්වලට අවශ්‍ය ජලය සැපයීම සිදු කරන ලදී. එසේ ක්‍රමවත් කළමනාකරණයකින් යුක්තව ජලය සුරක්ෂිත කිරීමට ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම මේ පර්යේෂණයේ ගැටලුව බවට පත්විය. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ලක්දිව රාජ්‍ය පාලකයන් ජලය කළමනාකරණය කරගත් ආකාරය පෙන්වා දීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. පර්යේෂණය සිදු කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය ප්‍රමුඛ වශයෙන් යොදා ගත් අතර මහාවංසය, දීපවංසය වැනි ප්‍රාථමික මූලාශ්‍රය ඒ අතර භාවිත කර ඇත. එමෙන් ම සෙල්ලිපි මූලාශ්‍රය ද යොදා ගෙන ඇත. අධ්‍යයන සීමාව වසයෙන් අනුරාධපුර හා පොළොන්නරු යුගයයන් තෝරා ගෙන පර්යේෂණ සිදු කර ඇත. ජල කළමනාකරණය කිරීමට අතීත පාලකයන් මහා වැව් නිර්මාණය කළ බවත් එම වැව් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම යොදාගෙන තිබූ බවත් මහාවංසයේ සඳහන් වී ඇත. එ අනුව ජලය එක් රැස් කර කළමනාකරණයකින් යුක්ත ව තබාගැනීමට හෙක්ටයාර 20125ක විශාල කලා වැවත් හෙක්ටයාර 2550ක විශාල මින්නේරිය වැවත් නිර්මාණය කර ඇත. වැව් බැම්ම, පිටවාන, සොරොව්ව වැනි තාක්ෂණික නිර්මාණ හරහා ද ජලය කළමනාකරණයකින් යුක්ත ව පවත්වා ගැනීමට උත්සාහ කර ඇති බවට හඳුනා ගත හැකි විය. එසේ ම ජලය සඳහා බදු අය කිරීමට ද රාජ්‍ය පාලකයන් ක්‍රියා කර ඇති බවට වසභ රජුගේ පෙරිමියන්කුලම ශිලා ලේඛනයෙන් තහවුරු වී ඇත. එහි දැක්වෙන්නේ 'දකපති' යනුවෙන් ජල බද්දක් අය කළ බව යි. එසේ ම ජලය කළමනාකරණය සම්බන්ධව නීති රීති පවත්වා ගැනීමට අතීත රාජ්‍ය පාලකයන් ක්‍රියාකර ඇති බව සමන්තපාසාදිකාව වැනි ග්‍රන්ථවල දැක්වේ. එහි සඳහන් වන්නේ යම් වැවකින් ජලය නියමිත කුඹුරට හැර වෙනත් කුඹුරකට හැරවිය නොහැකි බව ය. මුල්කාලීන බ්‍රාහ්මී ලිපිවල 'වව් හමික' යන පුද්ගලයකු ගැන සඳහන් වී ඇත. එනම්, ජල කළමනාකරණය කර වැව් පාලනය කිරීමට අයිතිය ලැබූ පුද්ගලයා බව සෙනරත් පරණවිතාන විසින් පෙන්වා දී ඇති අදහස් අනුව හඳුනාගැනිමට හැකි විය. අතීත ලක්දිව ජනයාට සිය දෛනික අවශ්‍යතා ඇතුළු බොහොමයක් ආර්ථික කටයුතු සඳහා ජලය ප්‍රමාණවත් පරිදි පවාත්වාගත හැකි වූයේ රාජ්‍ය පාලකයන් ක්‍රියා කළ ආකාරය හා ජනයා තුළ ඒ සඳහා පැවැති අනුගත භාවය නිසා බවත්, එය කළමනාකරණය කර ගැනිමෙන් ජලය ප්‍රමාණවත් වු බවත් මෙම පර්යේෂණය තුළින් නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පදඃ*** ලක්දිව, ජල කළමනාකරණය, පාලකයන්, වැව්, මූලාශ්‍රය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madushanmilinda9@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

# අම්පාර පුංචි සීගිරිය රජමහා විහාරයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*ජේ.එම්.ඩී.එන්. ජයසිංහ* [1]

අම්පාර දිස්ත්‍රික්කයට අයත් කොත්මලේ ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් අනූන ස්ථානයක් ලෙස පුංචි සීගිරිය රජමහා විහාරය පෙන්වා දිය හැකි ය. මූලාශ්‍රයගත කරුණු අනුව හෙළිදරව් වන මෙම ස්ථානයේ ඓතිහාසික පසුබිම කවරාකාර ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක වලට අනුව අනුරාධපුර යුගයේ පටන් ලෙන් විහාර සංකීර්ණයක් ලෙස මෙම පරිශ්‍රයේ පවතින පුරාවිද්‍යාත්මක උරුමය කවරාකාර ද යන්න විමසා බැලීමේ අරමුණ ඇතිව මෙම අධ්‍යයනය සිදු කර ඇත. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ පුංචි සීගිරිය රජමහා විහාරය නිරීක්ෂණය ලක් කළ අතර එහි දී නටඹුන්, සෙල්ලිපි හා අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. ක්ෂේත්‍ර නොවන ගවේෂණය යටතේ පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය යොදා ගත් අතර සාහිත්‍ය මූලාශ්‍රය හා මේ සම්බන්ධ පූර්ව පර්යේෂණ අධ්‍යයනය තුළින් දත්ත ඒකරාශි කරන ලදී. මහාවංසයේ කාවන්තිස්ස රජුගේ ශාසන සේවය පිළිබඳව කරුණු විග්‍රහයේ මෙම විහාරය පිළිබඳව සඳහන් වේ. ජනප්‍රවාද හරහා අනාවරණය වන තොරතුරු වලට අනුව ආරියවංශ සූත්‍ර දේශනාව මෙම ස්ථානයේ දී සිදු කරන්නට ඇති බවට තොරතුරු ලැබේ. මෙම විහාරය තුළ සෙල් ලිපි කිහිපයක්, ද්විත්ව ලෙන්, ලෙන් සිතුවම්, පොහොය ගෙයක නටබුන්, පොකුණු ද්විත්වයක නටබුන්, පියගැට පෙළ, තනි පේසා වළල්ලක් මත බඳින ලද ස්තූපය හා ඒ ආශ්‍රිත සඳකඩපහණ, කොරවක්ගල හා සිරිපතුල් ගල් සහිත මල් ආසන ආදිය දක්නට ලැබේ. ගිරි ලිපි ගණයට අයත් කළ හැකි මෙහි දක්නට ලැබෙන සෙල් ලිපි වල මෙම විහාරයට කරන ලද ප්‍රදානයන් පිළිබඳව සඳහන් වන අතර "අළිකත විහාරය" ලෙස හඳුන්වා ඇත. ද්විත්ව පර්වත ලෙන් තාක්ෂණය යොදාගෙන මෙහි ලෙන් නිර්මාණය කර ඇත. මෙම ලෙන් ආශ්‍රිතව දක්නට ලැබෙන සීගිරි සිතුවම් හා සමාන බිතු සිතුවම් අතර නලඟනකගේ රුව හා බෝධිසත්ව යැයි සැලකෙන පුරුෂයෙකුගේ දර්ශනයක් මනා වර්ණ සංකලනයන්ගෙන් යුක්ත ව සිතුවම් කර ඇත. මූලාශ්‍රයගත කරුණු, ජනප්‍රවාද, කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක නිර්මාණ තුළින් පුංචි සීගිරිය විහාරයේ ඓතිහාසික පසුබිම මැනවින් පිළිබිඹු වන බව නිගමනය කළ හැකි අතර අනුරාධපුර මුල් භාගයට අයත් විහාරස්ථානයක් ලෙස අවධි කිහිපයක් ඔස්සේ වර්ධනය වෙමින් පැවත ආ බවත් තහවුරු වේ.

***ප්‍රමුඛ පදඃ*** ඓතිහාසික , පුරාවිද්‍යාත්මක , පුංචි සීගිරිය , ලෙන් විහාරය, අනුරාධපුර යුගය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
nimanthijayasinghe2000@gmail.com

# අභිලේඛන මූලාශ්‍රය තුළින් හෙළිවෙන ආදායම් තැන්පත් කිරීමේ ආයතනවල සමාජ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩී.කේ.ඒ.එම්.එස්.එස්. බණ්ඩාර [1]*

පුරාතන අවධියේ සමාජ තොරතුරු අනාවරණය කර ගැනීමේ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස අභිලේඛන ක්‍රියාත්මක වී ඇත. ශ්‍රී ලාංකේය අර්ථ ක්‍රමය තුළ ආදායම් තැන්පත් කිරීමේ ආයතන දේශීය සමාජ සංවර්ධනය කෙරෙහි ලබාදුන් දායකත්වය කවරේ ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. පුරාතන ලාංකේය අර්ථ ක්‍රමය තුළ ආදායම් තැන්පත් කළ ආයතන සමාජයීය කටයුතුවලට දැක්වූ දායකත්වය පිළිබඳ අභිලේඛන මූලාශ්‍රය මගින් අනාවරණය කර ගැනීම මූලික අරමුණ වන අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පාදක කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ ලක්දිව සෙල් ලිපි, *Inscription of Ceylon* සහ ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. අතීත ලාංකේය සමාජ ක්‍රමය තුළ ආර්ථික තොරතුරු පිලිබඳ අධ්‍යයනය කිරීමේ දී මෙරට ආදායම් තැන්පත් කළ ආයතන පැවති බව ත්, එම ආයතන තුළින් ආර්ථිකය, ආගමික සංස්ථා නංවාලීමට දායකත්වය ලබා දී ඇති බවත්, අභිලේඛන මූලාශ්‍රයගත තොරතුරු අනුව සනාථ වේ. අභිලේඛන මූලාශ්‍රය තොරතුරුවලට අනුව වර්තමාන බැංකුවලට සමාන ආයතන ලංකාව තුළ පැවැති බව හඳුනාගත හැකි අතර පෙරිමියන්කුලම ලිපිය තුළින් එයට සාක්ෂ්‍ය ලබා ගත හැකි ය. "කම කරනක කොටු තිර ගම අතනේ හිය තියහලක කණියෙහි" සහ " ජීනපටි සතරිය කමකරනක කොටු අමරතනයෙහි කෙතවලක" යන සෙල්ලිපි පාඨවලින් එකල සමාජ බැංකුවලට සමාන ආයතනය පැවැති බව තහවුරු වේ. ඊට අමතර ව තෝනිගල සෙල්ලිපිය, ලබු ඇට බැඳිගල ලිපි ආදිය තුළින් එය වඩාත් තහවුරු වේ. මෙම ලිපිවල අන්තර්ගත තොරතුරුවලට අනුව මෙම ආයතන තුළින් එකල බුද්ධ ශාසන චිරස්ථිතිය උදෙසා දායකත්වය ලබා දුන් බව හෙළි වේ. සෙල් ලිපිවල අන්තර්ගත තොරතුරු වලට අනුව මෙම ආයතන තුළන් ධාන්‍ය තැන්පත් කිරීම, කහවණු තැන්පත් කිරීම මෙන් ම එම තැන්පතු සඳහා පොලී ක්‍රමයක් ද ක්‍රියාත්මක වී ඇති බව දැක්වේ. ඒ අනුව අතීත සමාජ ක්‍රමය තුළ ඉතිරි කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වී ඇති බව ත්, මෙම ආයතන වර්තමාන බැංකු වලට සමාන කාර්යභාරයක් ඉටු කර ඇති බව ත් හඳුනාගත හැක. අභිලේඛන මූලාශ්‍ර පාදක කරගනිමින් අතීත ලාංකේය සමාජ ක්‍රමය තුළ ආදායම් තැන්පතු ආයතනවල කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයේ දී ආර්ථික කටයුතුවලට මෙන් ම ආගමික කටයුතු නංවාලීමට මෙම ආයතන වටිනා කාර්යභාරයක් ඉටු කරන ලද බව නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පදඃ*** අභිලේඛන, ආදායම්, තැන්පත්, ආයතන, ලාංකේය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. shammibandara336@gmail.com

# යෝධ ඇළේ නිර්මාණය පිළිබඳ සමෝච්ඡ රේඛා ඇසුරින් අධ්‍යයනයක්

*එච්.එම්.හෂාන් ප්‍රදීප් රාජකරුණා* [1]

මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ යෝධ ඇළෙහි අවශේෂ ඇසුරින් පුරාණ වාරි තාක්ෂණයේ දී සමෝච්ච රේඛා භාවිත කළ ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම යි. මේ සඳහා යෝධ ඇළෙහි අවශේෂ බහුලව ඇති තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 381 මැදගම තුලාන හා 378 ගල්මඩුව තුලාන යන ග්‍රාම නිළධාරී කොට්ඨාස ආශ්‍රිත කලාපය තෝරා ගන්නා ලදී. කි.මී. 87කින් යුතු යෝධ ඇළෙහි කි.මී. 5ක් මෙහි දී අධ්‍යයනය කරන ලදී. මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය සහ සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය මගින් දත්ත රැස් කරගන්නා ලද අතර සිතියම් සහ චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කරනු ලැබී ය. එලෙස මිශ්‍ර ක්‍රමවේදය යටතේ ලබාගත් දත්ත විශ්ලේෂණාත්මක ව අධ්‍යයනයට ලක් කරන ලදී. ඒ අනුව චන්ද්‍රිකා ඡායාරූප ඔස්සේ හඳුනාගත් යෝධ ඇළේ අවශේෂ ඇති ප්‍රදේශ ගවේෂණය කොට ඒ ආශ්‍රිත ඉඩම් හිමියන්ගෙන් එහි පුරාණ තත්වය විමසා, ඇළෙහි ගමන් මාර්ගය හඳුනා ගන්නා ලදී. එම ගමන් මාර්ගය සමෝච්ච රේඛා සිතියම ඇසුරින් නිරීක්ෂණය කිරීම සිදු විය. අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශයේ යෝධ ඇළ ඉදි වීමට ප්‍රථමයෙන් පැරණි වැව් සම්බන්ධ කළ එල්ලංගා පද්ධතියක් ක්‍රියාත්මක වී ඇති බවට සාධක මෙහි දී හඳුනා ගැණුනි. මෙම පැරණි වැව්වලට ජලය ලබා දීම සඳහා ඉදිකිරීම අරඹා අතරමග නවතා දැමූ පැරණි යෝධ ඇළෙහි මුල් කාලීන සාධක මෙහි දී හඳුනා ගන්නා ලදී. මෙම අත්හැර දැමූ පැරණි යෝධ ඇළ මාර්ගය මුහුදු මට්ටමේ සිට මීටර් 130ක් උසින් ඉදිකර ඇත. පසු කාලීනව එයට පහළින් ඇති වංගු හැඩයෙන් යුත් යෝධ ඇළ ඉදිකළ බව හඳුනාගත හැකි ය. යෝධ ඇළ ආරම්භ වන කලා වැවෙහි උන්නතාංශය මීටර් 130ක් වන අතර එහි ජලය රැගෙන යන තිසා වැවෙහි උන්නතාංශය මීටර් 95කි. මේ අතර ඇති මීටර් 35ක උස ප්‍රමාණය භාවිතා කරමින් යෝධ ඇළ ඉදි කර ඇති අතර අධ්‍යයන කලාපයේ නටඹුන් වී ඇති යෝධ ඇළ මීටර් 120 සමෝච්ච රේඛා මට්ටම අනුව යමින් නිර්මාණය කර ඇති බව මෙම පර්යේෂණයේ දී හඳුනා ගන්නා ලදී. ඒ අනුව මුල් කාලීනව එල්ලංගා පද්ධතියට ඉහළින් යෝධ ඇළ ඉදි කරමින් ඒ ආශ්‍රිත සියලු වැව්වලට ජලය ලබා දීමට උත්සහ කළ ද, එම භූමියේ උන්නතාංශය වැඩි වීම නිසා ඇළ මාර්ගය ඉදිකිරීම ප්‍රායෝගික නොවන හෙයින් එම උත්සාහය අතරමග දී නවතා දැමූ බවට උපකල්පනය කළ හැකි ය. එම ඇළ මාර්ගය ඉදි කළේ නම්, එය මීටර් 10ක් පමණ පොළොව අභ්‍යන්තරයෙන් ඉදි කිරීමට සිදුවන අතර එමගින් අපේක්ෂිත අයුරින් කලාපයේ වැව්වලට ජලය ලබාගත නොහැකි ය. එහෙයින් ඊට පහළින් ඇති යෝධ ඇළ දෙවනුව ඉදිකළ බව හඳුනා ගත හැකි ය. යෝධ ඇළෙහි තෝරාගත් ක්ෂේත්‍රය ඇසුරින් සිදු කළ මෙම අධ්‍යයනය මගින් පැරණි වාරි තාක්ෂණයේ දී නිවැරදි සමෝච්ච රේඛා මට්ටම අනුව යමින් යෝධ ඇළ ඉදිකළ බව තහවුරු වේ.

***ප්‍රමුඛ පද:*** එල්ලංගා පද්ධතිය, යෝධ ඇළ, වාරි තාක්ෂණය, සමෝච්ච රේඛා, සිතියම්

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
hashanpradeep721@gmail.com

# පොළොන්නරු යුගයේ සිතුවම්වලින් හෙළිවන වස්ත්‍රාභරණවල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

*එච්.එම්.ටී.ඩී. කුමාරි* [1]

අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසු ක්‍රි. ව. 1017 දී පොළොන්නරුව කේන්ද්‍ර කර ගනිමින් හින්දු සහ බෞද්ධ සංකල්ප මුසු වූ සංස්කෘතියක් සහිත රාජ්‍යයක් ගොඩ නැගුණි. විශේෂයෙන් මෙම යුගයේ බිතු සිතුවම්වලින් අතීත සමාජයේ ප්‍රකට ව තිබූ වස්ත්‍රාභරණ පිළිබඳ අනාවරණය කර ගැනීමට හැකි වේ. පොළොන්නරු යුගයේ සිතුවම්වලින් ප්‍රකට වන වස්ත්‍රාභරණවල ස්වභාවය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදු කර ඇති මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය, ග්‍රන්ථ සහ පර්යේෂණ වාර්තා අධ්‍යයනය කර ඇත. පොළොන්නරු යුගයට අයත් සිතුවම් හමුවන තිවංක පිළිමගෙය, ලංකාතිලකය, ගල් විහාරයේ සිතුවම්වලින් අතීත පොළොන්නරු යුගයේ වස්ත්‍රාභරණ භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය. පොළොන්නරු ශිල්පියා ස්ත්‍රී පුරුෂ ඇඳුම්-පැළඳුම්, කර්ණාභරණ, මාල පංතිය, අඟදාභරණ, වළලු පංතිය, කුංචදාම, හිස් වැසුම් ආදිය විවිධත්වයක් සහිතව නිරූපණය කර ඇත. එමෙන් ම පොළොන්නරු යුගයට ආවේණික සිතුවම්වල ලක්ෂණ ද හඳුනාගත හැකි ය. තිවංක පිළිමගෙයින් හමුවන සිතුවම්වල සමස්ත ස්ත්‍රී රූපවල උඩුකය ඇඳුම්වලින් තොරව නිරූපණය කර ඇත. විශේෂයෙන් මේ යුගයේ උසස් ස්ත්‍රීන් පියොවුරු නොපෙනෙන සේ ආභරණවලින් උඩුකය සැරසීම ජනප්‍රිය ක්‍රමයක් බව තිවංක පිළිමගෙයි සිතුවම් අධ්‍යයනයෙන් පැහැදිළි වේ. නමුත් සාමාන්‍ය ස්ත්‍රීන් උඩුකය නිරුවත් ව නිරූපණය කර ඇත. පුරුෂ රූපවල ඇඳුම් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී බෝධිසත්ව රූප, දේව රූප, රජ රූප සහ සාමාන්‍ය මිනිසුන්ගේ ඇඳුම්-පැළඳුම් ආදී වශයෙන් කාණ්ඩ කිහිපයක් අනුව වර්ග කළ හැකි ය. උඩුකය ආවරණය කර ඇත්තේ මාල වැනි ආභරණවලින් ය. මෙම යුගයේ පුරුෂ රූපවල වස්ත්‍ර නිරූපණයේ දී චාම් සරල බවක් දක්නට ලැබේ. එහි දී උඩුකය ආවරණය කර ඇති බවක් දක්නට ලැබේ. එමෙන් ම ගෙල පැළඳී මාල මෝස්තර කිහිපයක් ම හඳුනාගත හැකි අතර, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව මාල පැළඳීම සිදු කර ඇත. ඔටුනුවල ආකෘතිය කේතුකාකාර ආකෘතියකින් යුක්ත වේ. විසිතුරු කැටයම් සහිත ඔටුනු තිවංක පිළිමගෙයින් හඳුනාගත හැකි ය. මෙම යුගයේ සමස්ත ඔටුනුවල ආකෘතිය එක සමාන වුව ද, ඔටුනුවල කැටයම්වල විවිධත්වයක් දක්නට ලැබේ. මේ අනුව එකල සමාජයේ පුද්ගල තරාතිරම, කුලය, බලය අනුව පොළොන්නරු යුගයේ සිතුවම්වල වස්ත්‍ර නිරූපණය කර ඇති බව නිගමනය කල හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** පොළොන්නරුව, බිතු සිතුවම්, වස්ත්‍ර, ආභරණ, පුරුෂ රූප

[1] ලලිත කළා අධ්‍යයනාංශය කැළණිය විශ්වවිද්‍යාලය. thakshiladananjani8@gmail.com

# ශ්‍රී ලංකාවේ ගුහා සිතුවම් තුළින් නිරූපිත සත්ත්ව රූප පිළිබඳව ඌව හා නැගෙනහිර පළාත්වල තෝරගත් ස්ථාන කිහිපයක් ඇසුරින් අධ්‍යයනයක්

*ඩී.එම්.කේ.ඩී. දිසානායක* [1]

පූර්ව සාක්ෂර සමාජය විසින් බොහෝ විට සිය වාසස්ථාන ආශ්‍රයයෙන් නිර්මාණය කරන ලද චිත්‍ර, ජ්‍යාමිතික සටහන් හා සංකේත ආදිය ගුහා සිතුවම් ලෙස සරලව හැඳින්විය හැකි ය. වර්තමානය වන විට මෙම සිතුවම් සහිත ස්ථාන 92 ක් පමණ වාර්තා වී ඇත. ඒ අතරින් වැඩි ප්‍රමාණයක් ස්ථානගත වී ඇත්තේ ඌව හා නැගෙනහිර පළාත්වල වීම සුවිශේෂ කරුණකි. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් නැගෙනහිර පළාතේ රජගල, පුළුකුනාව, තරුලෙන්ගල, පියංගල සහ ගොනාගොල්ල යන ස්ථාන ත්, ඌව පළාතේ වෙට්ටඹුගල හා මණ්ඩාගල යන ස්ථානවල සිතුවම් පිළිබඳව ත්, අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. ඒ සඳහා විශේෂයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය හා සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය මගින් දත්ත ලබා ගැනීම සිදු කරන ලදී. එහි දී මෙම සිතුවම්වලින් වැඩි ප්‍රමාණයක් සත්ත්ව රූප නිරූපණය කර ඇති බව හඳුනා ගැනීමට හැකි විය. මෙම සිතුවම් තුළින් නිරූපිත සත්ත්වයින් කුමන සත්ත්ව විශේෂයන්ට අයත් වන්නේ ද? යන පර්යේෂණ ගැටලුවට අදාළ ව මිශ්‍ර ක්‍රමවේදය යටතේ ලබාගත් දත්ත සංසන්දනාත්මක ව විශ්ලේෂණයට ලක් කරන ලදී. එහි දී සත්ත්ව රූපවල දේහ ලක්ෂණ, හැඩය පිළිබඳ ව මූලික අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව ක්ෂීරපායින් හා උරගයන් වැඩි වශයෙන් මෙම සිතුවම් හි වස්තු විෂයන් වී ඇති බව හඳුනා ගැනීමට හැකි විය. වැඩි ප්‍රමාණයක් ක්ෂීරපායි සත්ත්ව විශේෂයට අයත් වූ බව ත්, එයින් ද අලි ඇතුන් (Elephas maximus maximus) වැඩි වශයෙන්ම නිරූපිත සත්ත්ව විශේෂය ලෙස කැපී පෙනේ. එය සංඛ්‍යාත්මක ව සියය ඉක්මවා යන බව හඳුනා ගැනීමට හැකි විය. එයට අමතරව ගෝනා (Carves unicolor), මුවා (Axis axis), කොටියා (Panthera pardus kotiya), වලහා (Melursus ursinus), සුනඛයා (Canis lupus familiaris), කුළු හරකා (Bubalus bubalus) යන ක්ෂීරපායින් සත්ත්වන් සහ උරගයින් වන තලගොයා (Varanus bengalensis), කිඹුලා (Crocodylus porosus), ඉබ්බා (Melanochelys trijunga), මුගටියා (Herpestes edwardsi), කබරගොයා (Iguana iguana) යන සත්ත්වයන්ගේ සිතුවම් මෙම පර්යේෂණය තුළින් අනාවරණය කර ගැනීමට හැකි විය. මෙම ස්ථාන බොහොමයක් වියළි දේශගුණික කලාපයේ පිහිටා තිබීම නිසා එම තත්ත්වයට අදාළ ව මෙම ස්ථාන ආශ්‍රිත පරිසරයේ සුලභව ජීවත් වූ සත්ත්වයින් මෙම සිතුවම් හි ප්‍රධාන වස්තු විෂයයන් වී ඇති බව පෙනී යයි. එහි දී මෙම ස්ථාන ආශ්‍රිතව ජීවත් වූ මානව කණ්ඩායම් පරිසරය පිළිබඳව දැක් වූ ආකල්ප, ඔවුන්ට එල්ල වූ අභියෝග පිළිබඳ ව දැන ගැනීම හා පුරාණ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට මෙම පර්යේෂණය වැදගත් විය.

***ප්‍රමුඛ පද:*** සිතුවම්, වස්තු, සත්ත්ව රූප, සංසන්දනාත්මක

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. kaveeshadeshan112@gmail.com

# බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

*එන්.කේ.එන්.එන්. විජේතිලක [1]*

බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කරනු ලැබූ අතර අධ්‍යයන පහසුව සලකා 1831 සිට 1948 දක්වා කාල පරිච්ඡේදය තෝරාගනු ලැබී ය. කාලානුරූපී ව බටහිර අධ්‍යාපන ක්‍රමය හමුවේ දේශීය අධ්‍යාපනය ක්‍රමයෙන් අකර්මණ්‍ය වීම ත් සමඟ ස්වදේශිකයන් ද ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි නැඹුරු වීම නිසා උද්ගත වූ සමාජ ප්‍රශ්න වර්තමානය තුළ ද දැක ගත හැකි ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක වූ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය ලාංකීය සමාජයට කෙබඳු බලපෑමක් කළේද? යන ගැටලුව ඔස්සේ පර්යේෂණය සිදු කළ අතර" බ්‍රිතාන්‍ය අධ්‍යාපනයට පදනම් වූ හේතු විමසීම, වත්මන් අධ්‍යාපන රටාවට මූලාරම්භය සැපීමට බ්‍රිතාන්‍යයන්ගේ දායකත්වය මෙන් ම ප්‍රගතිය විමර්ශනය කිරීම අරමුණු කර ගන්නා ලදී. පර්යේෂණය" මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල විමර්ශනය හරහා සිදු කර ඇත. ඉංග්‍රීසි යටත් විජිත පාලකයන් විසින් මෙරට ක්‍රියාත්මක කළ අධ්‍යාපන ක්‍රමය සමස්තයක් වසයෙන් ඇගයීමේ දී දිවයින පුරා පාසල් ගොඩනැගිලි ඉදිකිරීම ත්, ගුරුවරුන් පත් කිරීම හා පුහුණු කිරීම, ක්‍රීඩා පහසුකම් ඇති කිරීම මෙන් ම අධ්‍යාපන සුභ සාධක සේවා අනුගමනය කිරීම හඳුනාගත හැකි ය. අනිවාර්ය අධ්‍යාපන ව්‍යවස්ථාව පැනවීමත් සමඟ අධ්‍යාපනික යටිතල පහසුකම් සැපයීමේ ප්‍රමාණය වැඩි කිරීමට බ්‍රිතාන්‍යයන්ට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් වසයෙන් ශිෂ්‍යයන් දෛනික ව පාසලට වාර්තා කිරීම මෙන් ම සාක්ෂරතාව ද ක්‍රමයෙන් ඉහළ ගියේ ය. ලංකාව බාහිර ලෝකයට විවෘත වීම, කාන්තාවන්ට පුරුෂයන්ට මෙන් සමාජයක් ලැබීම, ග්‍රාමීය මෙන්ම වෘත්තීය අධ්‍යාපනය දියුණු වීම, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් පාසල් ඉදිවීම සිදු වූයේ අධ්‍යාපනයෙහි යටිතල පහසුකම් දියුණුවීම නිසා බව නිගමනය කළ හැකි ය. සමස්තයක් ලෙස මෙම අධ්‍යයනය තුළින් බ්‍රිතාන්‍ය පාලන සමයේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙන් ම එහි සංකීර්ණ අධ්‍යාපන-සමාජ විචල්‍යතා අවබෝධ කර ගැනීමට උපකාරී වේ.

***ප්‍රමුඛ පද:*** අධ්‍යාපන, ප්‍රතිසංස්කරණ, බ්‍රිතාන්‍යය, යටිතල, සංවර්ධනය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
nadeekavijethilaka1998@gmail.com

# ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර තුළින් හඳුනාගත හැකි සිතුවම් කලාවේ කලාත්මක සුවිශේෂත්වය පිළිබඳ අධ්‍යයනයක්. (මැදවල ටැම්පිට විහාරය ඇසුරෙන්)

*එච්.ඒ.ටී.එන්. හපුගල [1]*

ශ්‍රී ලංකාවේ 17 වන සියවස ආරම්භයේ සිට 19 වන සියවස අවසාන භාගය දක්වා පැවති ගල් කුළුණු මත කුඩා විහාර ඉදිකිරීමේ සම්ප්‍රදාය ටැම්පිට විහාර සම්ප්‍රදාය යි. මහල් දළදා මාලිගාවල බලපෑම, තෙතමනය සහ වේයන්ගෙන් විහාරය ආරක්ෂා කර ගැනීම ආදී අභිප්‍රායන් වෙනුවෙන් මෙම විහාර ගල් කුළුණු මත ඉදිකළ බවට සැලකේ. එස්. යූ. දැරණියගල මහතාට අනුව ටැම්පිට විහාරය යනු, දේශීය ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් සහ මූර්ති කලාව මෙන් ම බිතු සිතුවම් ද ආරක්ෂා වී පවතින කුඩා කලාගාරයෙකි. මෙම විහාර සම්ප්‍රදායට අයත් පිළිමගෙයි ඇතුළු බිත්තිවල සහ පිටත මාලයේ බිත්තිවල ඇති බිතු සිතුවම් ඊට ම ආවේණික වූ සුවිශේෂ ලක්ෂණවලින් පරිපූර්ණ ය. ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර තුළින් හඳුනාගත හැකි සිතුවම් කලාව තුළ වූ කලාත්මක තත්ත්වය කෙබඳු ද? යන්න මෙහි අධ්‍යයන ගැටලුව වේ. ඒ අනුව මැදවල ටැම්පිට විහාරයේ ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ලබාගත් දත්ත මෙන් ම පූර්ව පර්යේෂණ ඇසුරින් ලබාගත් දත්ත මේ සඳහා උපයුක්ත වෙයි. මෙහි වර්තමානයේ දක්නට ලැබෙන පැරණි සිතුවම්වල කලාත්මක සාධක සමඟ ටැම්පිට විහාර සම්ප්‍රදායේ බිතු සිතුවම් කලාව පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකොට ඒ තුළින් ටැම්පිට විහාර සම්ප්‍රදායේ බිතුසිතුවම්හි කලාත්මක ලක්ෂණ තුළින් නිරූපිත දේශපාලන, සමාජ, ආගමික සහ ආර්ථික පසුබිම ඉස්මතු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මහනුවර රාජධානි සමයේ සිතුවම් කලාවේ බොහෝ ලක්ෂණ ටැම්පිට විහාර සිතුවම් තුළින් අධ්‍යයනය කළ හැකි ය. අනුරාධපුර, පොළොන්නරු යුගවල දක්නට ලැබෙන පුළුල් 'පනේල' චිත්‍ර ක්‍රමය මෙහි පටු චිත්‍ර ක්‍රමයකට පරිවර්තනය වී ඇති බව හෙළි වෙයි. තීරු වෙන්කිරීමේ දී තීරු දෙකක් අතර කුඩා හිස් තීරයන් ද ඉතිරි කර කථාවස්තුව නම් කිරීම සඳහා භාවිත කර ඇත. වියන් සඳහා නෙළුම් මල් යෙදීම මෙකල විශේෂ ලක්ෂණයක් වූ බව හඳුනාගත හැකි ය. කුඩා වපසරියක් තුළ විශාල සිතුවම් ප්‍රමාණයක් නිර්මාණය කරමින් සිදු කළ එකී කලාත්මක සුවිශේෂත්වයේ මුසුව ඇති තත්කාලීන සමාජයීය තත්ත්වය ටැම්පිට විහාර සම්ප්‍රදායේ බිතු සිතුවම් කලාව තුළින් හෙළි වේ.

***ප්‍රමුඛ පද:*** ටැම්පිට, සිතුවම්, කලාත්මක, මහනුවර, පනේල

[1] මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. thusharahapugala@gmail.com

# බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ලංකාවේ උඩරට ක්‍රිස්තියානිකරණය සහ ස්වදේශික සමයාන්තර සමාජ දෘෂ්ටිවාදමය පරිවර්තනයන් පිළිබඳ අධ්‍යයනයක්

*ආර්.එම්.එන්. සඳමාලි [1], වයි.ආර්.එම්. සචිනි පියුමිකා රාජපක්ෂ [2]*

මෙම අධ්‍යයනය හරහා 1825-1945 දක්වා යටත් විජිත ලංකාවේ උඩරට ප්‍රදේශවල ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ ක්‍රියාත්මක ක්‍රිස්තියානි ආගම් ව්‍යාප්තිය මගින් එම ප්‍රදේශ කේන්ද්‍ර කරගත් ස්වදේශික ආගමික හා සමාජ සන්දර්භයන් දෘෂ්ටිවාදමය අතින් මෙන් ම පුද්ගල භාවිතාවන් අතින් වඩාත් පරිවර්තනය වූ ආකාරය විමර්ශනය කරනු ලබයි. විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය ක්‍රිස්තියානි මිෂනාරි ක්‍රියාකාරකම් දේශීය ප්‍රජාවට බලපෑවේ කෙසේද යන්න එහි දී විමසයි. පෙර පැවති ස්වදේශික ආගමික පිළිවෙත් සහිත ප්‍රදේශයක් වන උඩරට තුළ සමාජ පාලනය සහ සභ්‍යත්ව පරිවර්තනය සඳහා බ්‍රිතාන්‍යයන් ක්‍රිස්තියානි ධර්මය මෙවලමක් ලෙස භාවිතා කළේ කෙසේද යන්න මෙන් ම එම ක්‍රියාවලි තුළ ප්‍රදේශ ආශ්‍රිත සමාජ, ආර්ථික හා දේශපාලනික වසයෙන් එල්ල වූ බලපෑම් කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර මෙම සංස්කෘතික හා ආගමික පැනවීම්වලට ප්‍රාදේශීය ආගමික සහ සමාජ කණ්ඩායම්වල ප්‍රතිචාරය ද බ්‍රිතාන්‍ය යටත් විජිත පරිපාලනය විසින් ලංකාවේ උඩරට ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා යොදාගත් උපාය මාර්ග විශ්ලේෂණය කිරීම ද, සමාජ සංස්කෘතිය මත ක්‍රිස්තියානිකරණයේ බලපෑම පරීක්ෂා කිරීම සහ උඩරට ප්‍රජාවගේ ගතිකත්වය මත මිෂනාරි ක්‍රියාකාරකම්වලට දැක් වූ අනුකූලතාවට ප්‍රතිචාර වසයෙන් ස්වදේශික ආගමික කණ්ඩායම් විසින් භාවිත කරන ප්‍රතිරෝධය හා අනුවර්තන යාන්ත්‍රණයන් ගවේෂණය කිරීම ද මෙහි අරමුණු වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයන ක්‍රමවේදය වසයෙන් මෙහි දී යොදා අතර පුස්තකාල විමර්ශනය මඟින් දත්ත රැස් කර ගන්නා ලදී. ඒ අනුව බ්‍රිතාන්‍ය යටත් විජිත උපාය මාර්ග සමාජ පාලනය බලාත්මක කිරීම සඳහා ආගම, පාලනය සමඟ බද්ධ වූ ආකාරය පිළිබඳ පුළුල් අවබෝධයක් අධ්‍යයනය තුළින් විශද කිරීමට හැකියාව ලැබේ. මෙම වෙනස්කම්වලට ප්‍රතිරෝධය දැක්වීමට සහ ඒවාට අනුගත වීමට දේශීය ප්‍රජාවගේ නියෝජිතායතන හා සමාජ ක්‍රියාවලිය ප්‍රශස්ත භූමිකාවක් සිදුකර ඇති බව ද හඳුනා ගැනිමට හැකියාව ලැබේ. ආගමික පරිවර්තනයේ සහ සමාජ විපර්යාසයේ සංකීර්ණතා ආමන්ත්‍රණය කරමින් මෙම අධ්‍යයනය යටත් විජිත ඉතිහාසය සහ පශ්චාත් යටත් විජිත ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි එහි දිගු කාලීන බලපෑම පිළිබඳ අගනා අවබෝධයක් සපයන පදනම මත වැදගත්කමක් දරනු ඇත.

***ප්‍රමුඛ පද:*** උඩරට, ක්‍රිස්තියානිකරණය, දෘෂ්ටිවාදමය, යටත්විජිත, සමයාන්තර

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ugcnimesha4@gmail.com

[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. piyumikasachiniugc@gmail.com

# ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන මූලාශ්‍රය මගින් හෙළිවන භික්ෂු සමාජය

*ඩබ්.ජී.එස්. මන්තිසි* [1]

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේ දී සාහිත්‍ය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද වැදගත් වේ. එකී පුරාවිද්‍යා මූලාශ්‍රය අතර අභිලේඛන මූලාශ්‍රයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. අභිලේඛන ක්ෂේත්‍රයේ මූල බ්‍රාහ්මිය යුගය වසයෙන් හඳුන්වනුයේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය යි. මෙම අවධියට අයත් ශිලා ලේඛන මගින් හෙළිවන සමකාලීන ආගමික තොරතුරු රැසකි. එම තොරතුරු ආශ්‍රයෙන් හෙළිවන භික්ෂු සමාජයේ තත්ත්වයන් හා ශාසනයේ උන්නතියට භික්ෂූන් ලබා දුන් දායකත්වය පිළිබඳ විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ය. මෙහි ගැටළුව වන්නේ අතීතයේ භික්ෂූන් විසින් දැරූ තනතුරු, තත්ත්වයන් හා ඔවුන් භික්ෂු ශාසනයේ උන්නතියට ලබා දුන් දායකත්වය භික්ෂු ශාසනයේ චිර පැවැත්මට මහෝපකාරී වූයේද යන්න ය. Inscription of Ceylon ප්‍රථම කාණ්ඩය හා Epigraphia Zeylanica ග්‍රන්ථවල එන ශිලා ලේඛන ප්‍රධාන මූලාශ්‍රය ලෙස මෙහි දී ගනු ලැබේ. පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන තුළ භික්ෂුව හැඳින්වීම උදෙසා බිකුතෙර, අශ, සමණ, බත යනාදී විවිධ නම් භාවිත කර ඇති බව පෙනී යයි. පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළින් ගම්‍යමාන වන භික්ෂුවකගේ තත්ත්වය, ශාසනික තත්ත්වය හා නිපුණතා තත්ත්වයන් යටතේ ප්‍රධාන වශයෙන් ආකාර දෙකක් ඔස්සේ හඳුනාගත හැකි ය. ශාසනික තත්ත්වය නියෝජනය වන පද කිහිපයක් ඉහත මූල බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළ හඳුනාගත හැකි ය. එනම්, තෙර, බත, සද්ධිවිහාරික හා අන්තේවාසික වසයෙනි. සංඝයාගේ තවත් සාමාජිකයකු පුහුණු කිරීමේ වගකීම බාර ගැනීම සඳහා භික්ෂුවක් උපසම්පදා වී දස අවුරුදු ඇවෑමෙන් තෙර යන ශාසනික තත්ත්වයට පත් වේ. මෙවැනි ශාසනික තත්ත්වයක් ඇතුළත් ශිලා ලිපි කඳුරුවැව, රජගල යන ස්ථාන වලින් හඳුනාගත හැකි වේ. එසේම පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛන තුළ බහුල වශයෙන් යෙදී ඇති භික්ෂූන්ගේ ශාසනික තත්ත්වය හඟවන තවත් පදයකි; බත එනම් පාලි භාෂාවේ භන්තේ යන්නට වඩා සමීප "ස්වාමී" යන්න හැඟවෙන පදයකි. තව ද තෙර හෝ බත යන ස්ථවිරයන් සමීපයෙහි පැවිදිව වත්පිළිවෙත් මනා ලෙස පුගුණ කළ සාමණේර හෝ උපසපන් භික්ෂූන් සද්ධිවිහාරික හා අන්තේවාසික යනුවෙන් දක්වා ඇත. සමස්තයක් වසයෙන් බත සද්ධිවිහාරික අන්තේවාසිකයන් පිළිබඳව මිහින්තලය ගොනාගල යන ස්ථාන කිහිපයකින් ම තොරතුරු වාර්තා වේ. එසේ ම මෙකල භික්ෂුවගේ නිපුණතා තත්ත්වය ද ඉහත ශිලා ලිපි තුළින් හෙළි වේ. එක් එක් ආගමික ක්ෂේත්‍රයන් හි නිපුණ වූ භික්ෂූන් ඒ ඒ විෂයයන් හි ප්‍රමුඛයෝ විය. ශිලා ලේඛන තුළ භික්ෂූන්ගේ නමට ඉදිරියෙන් ආගමික විරුදාවලි දක්නට ලැබීමෙන් එය තවදුරටත් පැහැදිලි වේ. මේ අනුව ආචාර්ය, මජ්ඣිම භාණක, සංයුක්ත භාණක, විනයධර යනාදී විරුදාවලී ඔවුන්ගේ නිපුණත්ව මට්ටම් අනුව ලැබී ඇත. බුදුන් දෙසූ ධර්මය මුඛ පරම්පරාවෙන් රැගෙන ආවෝ බාණකවරු විය. මෙවැනි මජ්ඣිම නිකායෙන් ධර්මය දේශනා කළ තිස්ස නම් තෙරුන් කෙනෙකු පිළිබඳ ව දඹුලු ලිපියක සඳහන් වේ. ඒ හැරුණු විට සංයුක්ත භාණකවරයකු පිළිබඳ ව ගෝනගලින් ද තොරතුරු හමු වේ. කෙසේ වෙතත් භික්ෂූන්ගේ තනතුරු තත්ත්වයන් මගින් මෙන් ම ශාසනයේ උන්නතියට  භික්ෂූන් ලබා දුන් දායකත්වය ඔස්සේ ද භික්ෂු ශාසනයේ චිර පැවැත්ම තහවුරු වූ ආකාරය හඳුනාගත හැකි ය. මේ අනුව මෙකල භික්ෂූන් ලෙන්, ස්ථූප යනාදිය තනිව ම හෝ සමූහයාගේ දායකත්වය ඇතුව සිදු කළ බවට පවතින හොඳම නිදසුන රජගල ආරාම සංකීර්ණයෙන් හමුවූ සෙල්ලිපි සාධක ය. ඒ තුළ ලෙන් විස්සක් ම භික්ෂූන්ගේ මැදිහත්වීම මත ඉදි විය. මීට අමතර ව මහාඇලගමුව, රිටිගල, කොටාදැමූහෙළ යන සෙල්ලිපි ඔස්සේ ද ඉදිකළ එවැනි මනාපදර්ශන, අඩ්ඩචන්ද නම් ලෙන් කිහිපයක් ද හඳුනාගත හැකි ය. ඉහත ආකාරයෙන් භික්ෂූන්ගේ තත්ත්වය හා ඔවුන් විසින් ශාසනයේ උන්නතියට සිදු කළ මෙහෙවර නිසාවෙන් භික්ෂු ශාසනයේ චිර පැවැත්ම තහවුරු වූ බව පෙනේ.

***ප්‍රමුඛ පද:*** බ්‍රාහ්මීය, අභිලේඛන, භික්ෂුව, සදිවිහරිය, අන්තේවාසික

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. sakithmagamage10.07@gmail.com

# පුරාතන ලංකාවේ සාංඝික දේපළ ආරක්ෂා කිරීම උදෙසා පරිහාර ලේඛනවල අන්තර්ගත සංකේත මඟින් සිදු කළ බලපෑම පිළිබඳ විමසුමක්

*යූ.එල්.එන්.එස්. දයාරත්න* [1]

සාංඝික දේපළ හා විවිධ පරිහාර දීමනා ඇතුළත් අත්තාණි කණු ශිලා ලේඛන මූලාශ්‍රය තුළ අන්තර්ගත වන්නේ කිසියම් රජකුගේ ආඥාවට අනුව රාජ සභාවට අයත් රජයේ උසස් නිලධරයකු විසින් යම් පුද්ගලයකුට හෝ ආයතනයක් වෙත ප්‍රදානය කරනු ලබන සුවිශේෂී වරප්‍රසාද, අයිතිවාසිකම් ආදිය හා ඒවා සුරක්ෂිත කරගත යුතු ආකාරය පිළිබඳව මෙන් ම නීති උල්ලංඝනය කරන අයට ලබා දෙන දඬුවම් ආදිය යි. අත්තාණි කණුවල එන ශිලා පාඨවලට ඉහළින්, පහළින් මෙන් ම ශිලා ලේඛනයේ දෙපැත්තෙහි මෙන් ම ඇතැම් විටෙක සතර පැත්තෙහි ම හිරු, සඳු, බලු, කපුටු, නාග, වටාපත වැනි විවිධ සංකේත සලකුණු කොට තිබේ. අත්තානි කණු ශිලා ලේඛනවල ඉහත සඳහන් කළ සංකේත භාවිත කළ ඇති ආකාරය ත්, ඒවා යෙදීමෙන් අපේක්ෂා කළේ කුමක් ද යන්න ත් විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ යි. පුරාතන ලංකාවේ සාංඝික දේපළ ආරක්ෂා කිරීම උදෙසා අත්තානි පරිහාර ලේඛනවල අන්තර්ගත සංකේත මඟින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි ගැටලුව වේ . මෙම පර්යේෂණය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට කේන්ද්‍රගත වන අතර බුද්දන්නෙහෙල, මොරගොඩ, ඇල්ලේවැව, අයිතිගේවැව, කොන්ගොල්ලෑව ආදි අත්තානි කණු ශිලාලේඛන මූලාශ්‍රයට මූලිකත්වය දෙමින් කරුණු එක්රැස් කරන අතර එම මූලාශ්‍රයයේ එන කරුණු ත්‍රිපිටක සාහිත්‍යයේ හා බ්‍රාහ්මී ශිලාලේඛන වැනි මූලාශ්‍රය තොරතුරු සමග සංසන්දනාත්මක ව විමසුමට ලක් කෙරේ. ආරාම ආශ්‍රිත පරිහාර ප්‍රදානයන්හී දී විශේෂයෙන් ම මෙම දේපළ සාංඝික දීමනාවක් යැයි තහවුරු කිරීමට වටාපත සංකේතාත්මක ව භාවිත කෙරූ බවක් දක්නට පුළුවන. මෙම අත්තානි කණු ලිපි අතර බල්ලන් හා කපුටන්ගේ සංකේත වැඩි වසයෙන් පැවතීම මඟින් පරිත්‍යාග කරන ලද සාංඝික හෝ පෞද්ගලික දේපළ සොරකම් කිරීම මහත් පාපිෂ්ඨ ක්‍රියාවක් වන බවත්, එලෙස සොරකම් කළ හෝ පැහැර ගැනීම මතු භවයන් හි බල්ලන් කපුටන්  ව ඉපදීමට හේතු සාධක වන බව එයින් කියැවේ. බුදුදහමට අනුව මිනිසා එවැනි සත්ත්ව ආත්ම අපේක්ෂා කරන්නේ නැත. එසේ වන්නේ නම් එය දුක්ඛිත උප්පත්තියකි. බුද්දන්නෙහෙල ලිපියේ දී සුනඛ සංකේතය යොදා ඇත්තේ කරපටි සහිතව ය. දුන්න හා ඊතල, හෙණ්ඩුව හා හක්ගෙඩිය වැනි සංකේත මෙම ශිලා ලේඛනවල භාවිත කිරීමෙන් පෙන්නුම් කරනුයේ දේපළ පරිත්‍යාග කරන ලද ස්ථානවලට ඇත්ගොව්වන්ට, අස්ගොව්වන්ට හා හේවායන්ට ඇතුළත් වීමට අවසර නොමැති බව ය. ඇතැම් අත්තාණි කණුවල ඉර-හඳ වැනි සංකේත භාවිත කර ඇති අතර එයින් කියැවෙන්නේ මේ කියනු ලබන දීමනා ඉර-හඳ පවතින තාක් පවතින බව ත් ඒවා කිසිසේත් වෙනස් නොකළ යුතු බවත් ය. මේ කියනු ලබන දීමනා කවරකු විසින් හෝ විනාශ කරන්නේ ද, පැහැර ගන්නේ ද, බලහත්කාරයෙන් භුක්ති විඳින්නේ ද හේ සසර තුළ දක්ඛිත ආත්ම සහිත ව උපදින්නේ යැයි පෙන්වා දී තිබේ. සාංඝික දේපළෙහි සුරක්ෂිතතාව සඳහා රජය රාජ්‍ය නීතියත්, ආගමික සංකල්පත් භාවිත කිරීමට කල්පනා කර ඇති බවක් පෙනී යයි. අත්තානි කණුවල දී ක්‍රියාවට නැංවූ මෙම ක්‍රමවේදය බොහෝ විට සාර්ථක වූ වැඩපිළිවෙළක් ලෙස පෙන්වා දිය හැකි ය. අත්තාණි කණු මඟින් තත්කාලීන සමාජය තුළ මුල් බැසගත් විවිධ අදහස් පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි ය. අත්තාණි කණු වල කරුණු දැක්වීමේ දී ආරම්භයේ හා අවසානයේ යහපත නිරෝගී බව සහ සෞභාග්‍ය ආදිය ප්‍රාර්ථනා කොට ඇත. එමෙන් ම පරිත්‍යාග කරන ලද සාංඝික හෝ පෞද්ලික දෙය සොරකම් කිරිම මහත් පාපිෂ්ඨ ක්‍රියාවක් බවට සමාජ මතයක් පැවති බව අධ්‍යයනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** අත්තාණි, දීමනා,  රාජ ආඥා, සංකේත, සාංඝික

[1] ඉතිහාස අධ්‍යයනාංශය කැළණිය විශ්වවිද්‍යාලය. shashikalanuwanthi118@gmail.com

# වලපනේ කිතුල් කර්මාන්තය සමග බැඳී පවතින කිතුල් මල මැදීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ජානක වීරසිංහ* [1]

ශ්‍රී ලංකාවට ආවේණික සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස කිතුල් කර්මාන්තය හඳුන්වා දිය හැකි ය. නුවරඑළිය, මහනුවර, මාතලේ, රත්නපුර වැනි ප්‍රධාන දිස්ත්‍රික්ක රාශියක මෙම කර්මාන්තය ව්‍යාප්තව පවතී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිතුල් කර්මාන්තය සමග බැඳී පවතින කිතුල් මල මැදීමේ ක්‍රියාවලිය ආශ්‍රිත ව ඇති සුවිශේෂතා කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙහි දී කිතුල් මල මැදීම පිළිබඳ අධ්‍යයනය කිරීම මූලික අරමුණ වන අතර පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මිශ්‍ර ක්‍රමවේදය භාවිත කළ අතර දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණය යොදා ගන්නා ලදී. වර්තමානයේ මෙම කර්මාන්තයෙන් ග්‍රාමීය ආර්ථිකයට යම් රුකුලක් ද ලැබේ. මල පදම් කිරීමට විවිධ ක්‍රම භාවිත කරන අතර වඩාත් ප්‍රචලිත සහ බහුලව භාවිත කරන ක්‍රමය වන්නේ මලට අත්බෙහෙත් තැබීම ය. ඊට අමතරව මලෙහි වෘන්තය තැලීම, මලට උල් ගැසීම, මලෙහි වෘන්තය අග පිළිස්සීම හා දුම්ගැස්වීම සිදු කරයි. මෙම විවිධ ක්‍රම ප්‍රදේශයෙන් ප්‍රදේශයට හා මල් මදින්නාගෙන් මල් මදින්නාට වෙනස් වේ. මල පදම් කිරීම සඳහා අත් බෙහෙත් තැබීම සිදු කරනු ලබන අතර ඒ සඳහා කුළුබඩු වර්ග, කොළ වර්ග, පොල් හනුසු වල අළු සහ ලුණු මිශ්‍රණය ආදි ද්‍රව්‍ය භාවිත කරනු ලැබේ. ගම්මිරිස්, ඉඟුරු, වියළි මිරිස්, සුදුළුණු, මුරුංගා පොතු, කුරුඳු, විනාකිරි, කැප්පෙට්ටියා කොළ කොටා සකස් කරගත් මිශ්‍රණය, මලෙහි නටුව සිදුරු කිරීමෙන් සාදා ගනු ලබන කුහරය "ඔහුවල" නමින් හඳුන්වයි. එම කුහරය තුළ මෙම මල් බෙහෙත් තැන්පත් කරයි. මීට අමතරව මල් කඳේ සහ කිනිතිවල ද බෙහෙත් ආලේප කරනු ලබයි. අනතුරුව මල මැදීමෙන් ලබාගන්නා තෙලිදිය මගින් කිතුල් පැණි, කිතුල් හකුරු නිෂ්පාදනය කිරීම ගැමි කාන්තාව විසින් සිදු කරයි. සමස්තයක් වශයෙන් ගත් කළ මෙලෙස මෙම කර්මාන්තය සමග බැඳී පවතින කිතුල් මල මැදීම සිදු කරන අතර එහි දැනුම වියැකී යමින් පවතින බව නිගමනය කල හැකි ය.

***ප්‍රමුඛ පද:*** කිතුල් කර්මාන්තය, වලපනේ, තාක්ෂණය, සාම්ප්‍රදායික දැනුම

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සාමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. weerasinghemalisha054@gmail.com

# බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා සරසවි සඳරැස පුවත්පතින් ලැබුණු දායකත්වය

*ඩබ්.ඩී. අමාලි* [1]

ශ්‍රී ලංකාවේ සිංහල පුවත්පත් පිළිබඳ ඉතිහාසය සියවසකුත් දශක හතරක අතීතයකට හිමිකම් කියනු ලබයි. 19 වන සියවසෙහිදී සිංහල ජනතාව අතර ජාතික ආගමික උද්යෝගයක් ජනිත කරවීමෙහිලා අද්විතීය මෙහෙවරක් ඉටු කරන ලද්දේ පුවත්පත් මගිනි. එහිදී සරසවි සඳරැස පුවත්පත ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා සරසවි සඳරැස පුවත්පතින් ලැබුණු දායකත්වය කෙබඳු වූවක්ද යන්න අනාවරණය කිරීමයි. සමකාලීන සමාජ පරිසරය තුළ සරසවි  සඳරැස පුවත්පතට බෞද්ධාගමික පුනර්ජීවනයක් ඇති කිරීමට හැකියාව ලැබුණි ද යන්න මෙහි ගැටලුවයි. මෙහි දත්ත රැස් කිරීමෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද යටතේ ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස සරසවි සඳරැස පුවත්පත භාවිතා කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. 1880 වන විට මිෂනාරීන් විසින් ආගම ප්‍රචාරණය කිරීමේ ප්‍රකට මාර්ගයයක් ලෙස පුවත්පත් යොදා ගන්නා ලදී.  ඔවුන්ගේ ධනය, බලය නිසා පුවත්පත් මගින් සිංහල ජනයා අතර ඔවුන්ගේ ආගම ව්‍යාප්ත කිරීමට කටයුතු කළේය. රෝමානු කතෝලිකයන් බුදුදහම හෙළාදැකීම වැලැක්වීමට ගත් උත්සහයක් ලෙස පුවත්පතක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. සරසවි සඳරැස පුවත්පත 1880 දෙසැම්බර් මස 3 වන සිකුරාදා ආරම්භ කරන ලද බෞද්ධ පුවත්පතක් වන අතර ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් ඇරඹි මෙම පුවත්පත සිංහල බෞද්ධයන්ට පුවත්පතක් නොමැතිවීමේ අඩුව පූර්ණය කරන ලදී. එකල බෞද්ධ බලය නගාසිටුවීමට බෞද්ධ පුවත්පතක අවශ්‍යතාව ඉස්මතුව පැවතුණි. මෙම පුවත්පත ආරම්භය සමඟ එම අවශ්‍යතාවය ඉටු වූ බව පෙනේ. සරසවි සඳරැස ආරම්භ වූ මුල් අවධියේ ක්‍රිස්තියානි ධර්මය විවේචනය කරමින් ලිපි පළ විය. මෙම අවධියේ බෞද්ධ මහජන මතය කෙරෙහි සරසවි සඳරැසෙහි කටයුතු බෙහෙවින් බලපෑවේය. මෙම සරසවි සඳරැස පුවත්පත තුළ අන්තර්ගත තොරතුරු අනුව බෞද්ධ ආගමික ප්‍රචාරණය සිදුව ඇති ආකාරය එහි දැක්වෙන දැන්වීම්, ධර්ම දේශනා ආදිය මෙන්ම සිල් සමාදන්වීම ,සූදුවෙන් තොරව කටයුතු කළයුතු ආකාරය පිළිබඳව අන්තර්ගත ලිපි මගින්  ආගමික ප්‍රචාරණය සිදුව ඇති ආකාරය මෙන්ම සෑම පුවත්පත් කලාපයකම අන්තර්ගත කවිය තුළින් මෙම පුවත්පතේ අරමුණ සඳහන්ව ඇත. මේ අනුව සරසවි සඳරැස පුවත්පත මගින් බෞද්ධ ආගමික පුවර්ජීවනයට විශාල දායකත්වයක් දක්වා ඇති ආකාරය ඉහත තොරතුරු තුළින් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පදඃ*** පුනර්ජීවනය, පුවත්පත්, ප්‍රචාරණය, බෞද්ධාගමික, සරසවි සඳරැස

---

[1] ඉතිහාස අධ්‍යයනාංශය කැළණිය විශ්වවිද්‍යාලය. amalidolinika@gmail.com

# ශ්‍රී ලාංකේය ස්තූපවල උපරිභාගයේ නිරූපිත සංකේතාර්ථ පිළිබඳ විමර්ශනයක්

*කේ. සංජුක නයනජිත්* [1]

බෞද්ධ ආරාමික වාස්තුවිද්‍යාවේ ප්‍රධාන පූජනීය වාස්තු නිර්මාණය වූ ස්තූපය, මානව සුසාන සංස්කෘතියේ සංකල්පීය පරිවර්තනයක ප්‍රතිඵලයක් වේ. එය බුදුන් වහන්සේගේ රූපකාය ත්, ධර්මකායත් මානවරූපීව හෝ අමානවරූපීව හෝ භක්තිවන්ත ජනයා හට සම්ප්‍රේෂණය කරවීම කි. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලාංකේය ස්තූපවල උපරිභාගයේ නිරූපිත සංකේත හඳුනාගැනීම ය. ඒවා සමස්ත ස්තූපයේ සංකල්පීය තේමාවට කෙතරම් සහසම්බන්ධ වන්නේ ද යන්න විමර්ශනය කිරීම පර්යේෂණ ගැටළුව යි. ඒ සඳහා සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනය මූලික ක්‍රමවේදය ලෙස යොදා ගෙන ඇත. ස්තූප උපරිභාගය මුද්ධවේදී, හර්මිකාව, ගජස්ථම්භ, ඡත්‍ර යෂ්ඨි හා ඡත්‍ර ලෙස මුල් කාලයේ දී නිර්මාණය කෙරිණි. ස්තූපයේ විකාසනයේ දී එම අංග අභාවයට ගිය අතර, ඒ සඳහා සතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල, කොත හා චූඩාමාණික්‍යය ආදී නව අංග එකතු වී තිබේ. සමස්ත ස්තූපයෙන් බුදුන් වහන්සේ හා විශ්වය සංකේතවත් කොට තිබේ. ලක්දිව ස්තූපයේ උපරිභාගය නිර්මාණය කිරීමේ දී කලාකරුවා විසින් පංචාංගුලික පංක්ති, චන්ද්‍රසූර්ය සලකුණු, පූර්ණ ඝට සලකුණු, ශාක පත්‍ර සලකුණු, නෙලුම් මෝස්තර හා සතරවරම් දෙවිවරු මෙන් ම වාමන නිරූපණ ද ධජ පතාක ආදිය ද සංකේත ලෙස භාවිත කොට ඇත. මුද්ධවේදී නමින් හඳුන්වන ලද සතරැස් කොටුවෙහි චන්ද්‍රසූර්ය සලකුණු නිරූපණය කෙරේ. ලක්දිව මහාථූප නිර්මාණ විස්තරයේ දී සද්ධාතිස්ස රජු විසින් දුටුගැමුණු රජු හට වැඩ අවසන් ස්තූපය පෙන්වීමේ දී චන්ද්‍ර-සූර්ය සලකුණු මෙන් ම අවශේෂ සලකුණු ද සතරැස් කොටුවේ නිරූපණය කළ බව දැක්වේ. ක්‍රි.පූ දෙවන ශතවර්ෂය වන විටත් ලක්දිව ස්තූපවල සතරැස්කොටුවේ චන්ද්‍ර-සූර්ය සලකුණු ද්විත්වය දැක්වූ අතර ක්‍රි.ව හතරවන සියවසින් පසු ඇතැම් අවස්ථාවල සූර්ය සංකේතය පමණක් භාවිත වීම සැලකිය යුත්තකි. මධ්‍යකාලීන ස්තූපයක් වන රන්කොත් වෙහෙරේ දක්නට ලැබෙනුයේ හිරු-සඳු වෙනුවට පෙති අටෙකින් යුතු පිපුණු පියුම් මෝස්තරය කි. මේවා බුදුන්වහන්සේගේ ධර්මාලෝකය සන්නිවේදනය කිරීම සඳහා යොදාගෙන ඇත. පැරණි ගජස්ථම්භය, ඡත්‍ර යෂ්ඨිය හා ඡත්‍රය, විශ්වයත් බුදුන් වහන්සේත් හැඟවීම සඳහා යොදාගත් සංකේත වේ. බුදුන් වහන්සේ දේවාතිදේව බව හැඟවීම ඉන් අදහස් කර ඇත. ලක්දිව ස්තූපවල දේවතා කොටුවේ වැඩිමනක් දේව රූප ද ඇතැම් ස්තූප වල එහි උපරිභාගය දරා සිටින සේ නිරූපිත බහිරව රූප ද වේ. එවිට එය දේවතා කොටුව නොව, බහිරව කොටුව ලෙස ද හැඳින්විය හැක. මේවා සමස්ත ස්තූපයේ අභිමතාර්ථය වන විශ්වය හා බුදුන් වහන්සේ පිළිබඳ සංකල්පය සමාජගත කිරීමේ දී නිර්මාණ ශිල්පියා විසින් යොදාගත් සංකේත නිරූපණ බව සිතීම යුක්ති යුක්ත වේ.

***ප්‍රමුඛ පද:*** උපරිභාගය, සංකේත, බුදුන්, නිරූපණය, ධර්මාලෝකය

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bs2020067@bpu.ac.lk

# ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට ඉන්දියාව මැදිහත්වීම

*පී.කේ. අචිනි ශෂින්තා ජයරත්න [1]*

සිංහල හා දෙමළ ජනවාර්ගික අනන්‍යතාව මත ධ්‍රැවීකරණය වූ ශ්‍රී ලංකාවේ සිවිල් අර්බුදය 20 වන සියවසේ මැද භාගයේ සිට මතවාදීමය ජනවාර්ගික ගැටුමක් බවට පත්වීමෙන් පසු ඒ සඳහා කැපී පෙනෙන අන්තර්ජාතික මැදිහත්වීම් සිදු විය. එම මැදිහත්වීම් අතරින් දකුණු ආසියාතික කලාපයෙන් මැදිහත් වූ ඉන්දියාව සුවිශේෂ මැදිහත්කරුවෙකු විය. ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට ඉන්දියාව මැදිහත්වීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ එය කලාපීය අස්ථාවරත්වයක් ඇති කළ මානුෂීය අර්බුදයක් වීමය. ඒ අනුව ශ්‍රී ලාංකික දෙමළ ජනයාගේ ගැටලු විසඳීම සහ කලාපීය ස්ථාවරත්වය පවත්වා ගැනීම ස්වකීය අරමුණු ලෙස දක්වමින් ඉන්දියාව මෙම යුද්ධයට මැදිහත් විය. ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට ඉන්දියාව මැදිහත්වීම ඇසුරින් කළ මෙම පර්යේෂණයේදී "ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයේ ගමන් මග තීරණය කිරීමට ඉන්දියාවේ මැදිහත්වීම කොතෙක් දුරට බලපෑවේ ද'' යන්න පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව ලෙස යොදා ගත් අතර යුද්ධයට ඉන්දියාව මැදිහත්වීමේ ඓතිහාසික පසුබිම හඳුනාගැනීම සහ එම මැදිහත්වීම්වල සාර්ථක අසාර්ථකභාවය අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ අරමුණ විය. මේ සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පර්යේෂණයන්හි භාවිත කරනු ලබන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනු ලැබීය. ඒ අනුව ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට ඉන්දියාව මැදිහත්වීම තුළ ඔවුන් 1980 දශකයේ අග භාගයේ දී සාම සාධක හමුදාව යටතේ මිලිටරි සහයෝගය ලබා දීම ආරම්භ කළ නමුත් ගැටුමේ ස්වභාවය මත රාජතාන්ත්‍රික භූමිකාවක් වෙත ප්‍රවේශ වීමට යොමු වූ ආකාරය දැකගත හැකි විය. නමුත් මෙහිදී නෝර්වේ වැනි යුරෝපීය රටවල් ශ්‍රී ලංකාවේ ගැටලුව සමථයකට පත් කිරීමේ අරමුණින් මැදිහත්වීම ඉන්දියාවට කලාපීය බලවතා ලෙස තවදුරටත් බලා සිටීමට නොහැකි වීම පාදක කරගෙන ඔවුන් සිය ක්‍රියාමාර්ග වෙනස් කරමින් රාජතාන්ත්‍රික ප්‍රවේශයකින් මැදිහත් වූවා මිස ඔවුනට යුද්ධය නැවැත්වීමේ හෝ සාමය ඇති කිරීමේ හෝ පැහැදිලි අභිප්‍රායක් නොතිබූ බවත් ඔවුනට අවශ්‍ය වූයේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය තවදුරටත් වර්ධනය කරවීම බවත් මෙම පර්යේෂණයේදී අනාවරණය විය.

***ප්‍රමුඛ පද:*** මැදිහත්වීම්, ඉන්දියාව, රාජතාන්ත්‍රික, කලාපීය, ජනවාර්ගික අර්බුදය

[1] ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. a18271@arts.pdn.ac.lk

# හඳගල කන්ද ගල්ලෙන් විහාරය පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

*කේ. සංජුක නයනජිත් [1], බී. ඒ. ධම්මික ලක්සිරි [2]*

හඳගල කන්ද ඓතිහාසික ක්ෂේත්‍රය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය මැතිවරණ බල ප්‍රදේශයේ රත්මල්ගහවැව නම් පුරාණ ග්‍රාමයේ පිහිටා ඇත. මැදවච්චිය සිට කැබිතිගොල්ලෑව නගරය පසු කරමින් හොරොව්පතාන මාර්ගය හරහාත්, මිහින්තලයේ සිට කහටගස්දිගිලිය මාර්ගය හරහාත්, රත්මල්ගහවැවට පැමිණ මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රයට පිවිසිය හැකි ය. හඳගල විහාර ක්ෂේත්‍රයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක විභවතා කවරාකාර ද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටළුව යි. උක්ත ක්ෂේත්‍රයේ ස්මාරක, පුරාවස්තු වාර්තා කිරීම හා සමාජ සන්නිවේදනය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙහි දී මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර දත්ත රැස් කිරීම සඳහා ඓතිහාසික මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා ජනශ්‍රැති විමර්ශනය ආදිය සිදු කරන ලදී. විහාර නාමයේ සඳහන් 'හඳගල' යන්න කෙසේ ව්‍යවහාරයට පැමිණියේ දැයි කිව නොහැකිමුත් ජනප්‍රවාද හා විද්වත් මත අනුව ප්‍රධාන මත දෙකක් නාමකරණය හා කාලය සිහි ගන්වයි. ඉන් පළමුවැන්න මෙය මහානාග යුවරජු විසින් කරන ලද 'චන්ද්‍රගිරි විහාරය' යන්න යි. දෙවැන්න විශුද්ධිමාර්ගයේ දැක්වෙන අතීත 'පාචීනඛණ්ඩරාජිනිය' යන්න යි. එච්. සී. පී. බෙල් මහතාගේ පාලන වාර්තා තුළත් එඩ්වඩ් මුලර් හා සී. ඩබ් නිකලස්ගේ වාර්තා තුළත් අවධානයට ලක්ව ඇති උක්ත ක්ෂේත්‍රය මුල් කාලීන භාවනායෝගී භික්ෂූන් වහන්සේලාගේ කේන්ද්‍රස්ථානයක් බවට සාක්ෂ්‍ය විද්‍යමාන ය. කටාරම් කොටා සකස් කරගත් ස්වභාවික ගල්ලෙන් 45ක් පමණ ඇති මෙහි පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ලෙන් ලිපි රාශියක් ද දැකගත හැකි ය. අනුරාධපුර අවධියේ සිතුවම් ශෛලිය විෂද කරන සිතුවම් තලයක් ද මහ ලෙන නමින් හඳුන්වන ලෙන් බිත්ති අතර ශේෂව පවතී. සංසන්දනාත්මකව බැලූ කල සීගිරි, වෙස්සගිරි ආදී ක්ෂේත්‍ර සිහිගන්වන මෙම බිතු තලය අදවන විට බොහෝ සෙයින් හායනයට ලක්ව ඇත. වර්තමාන බෝධිඝරය පිහිටා ඇති අවකාශය තුළ ජීර්ණයට ලක්ව ඇති ශෛලමය හිටි බුද්ධ ප්‍රතිමාවක් ද වේ. ශෛලීය අනුව අනුරාධපුර දෙවන භාගයට අයත් යයි සිතිය හැකි මෙය පරිමාණය අතින් මධ්‍යම ප්‍රමාණ වූවකි. හඳගල විහාරයේ ප්‍රතිමා මන්දිරය මහනුවර යුගයේ දී නිර්මාණය කොට තිබේ. අරටු සහිත දාරුමය සැකිල්ල සකසා ඒ මත මැටි උපයෝගී කර ගනිමින් ප්‍රතිමා නිර්මාණය කොට වර්ණ ගන්වා ඇත. හිටි, හිඳි හා සැතපෙන ඉරියව් ත්‍රිත්වය බුද්ධ ප්‍රතිමා නිරූපණයේ දී භාවිත කොට තිබේ. සුළු මැදිහත් වීමකින් සංරක්ෂණය කර ඇති ප්‍රධාන ස්තූපය අවකාශයේ ඉහළ ස්ථානයේ පිහිටා ඇත. මේ වටා විසිරී ඇති පුරාවස්තු අතර ශෛලමය මල් ආසන හා පැරණි ගජස්ථම්භය දක්නට ලැබේ. අනුරාධපුර මුල් භාගයේ සිට මහනුවර අවධිය දක්වා විවිධ කාල අවකාශ සිහි ගන්වමින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධන කාර්යයන් සිදුවී ඇති බව පෙන්වා දිය හැක.

***මුඛ්‍ය පද:*** හඳගල විහාරය, පාචීණඛන්ඩරාජිනිය, ස්මාරක, බිතුතලය, ගජස්ථම්භය

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bs2020067@bpu.ac.lk

[2] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. bs2020058@bpu.ac.lk

# මහනුවර ලෝක උරුම ප්‍රවර්ධනය කිරීම සඳහා උල්පැන්ගේ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ දායකත්වය පිළිබඳ විමර්ශනයක්

*බී.ආර්.අයි. විනෝදනී බෝරදෙනිය [1], එස්.එන්. කන්කානම්ගේ [2]*

මහනුවර දළදා මාළිගාව හා නුවර වැව අතර පිහිටා ඇති "උල්පැන්ගේ" ඓතිහාසික වටිනාකමකින් යුත් ස්මාරකයකි. අතීතයේ දී රාජකීය බිසෝවරුන්ගේ ස්නානය සඳහා නිමවූවක් ලෙස සැළකෙන මෙය බිසෝ උල්පැන්ගේ, නානුමුරගෙය යන නම්වලින් ද හඳුන්වයි. මුල් කාලීනව තනි මහලක් ලෙස තිබූ මෙය බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දෙමහල් ඉදිකිරීමක් ලෙස පරිවර්තනය කර ඇත. ඒ අනුව වර්තමානයේ මෙහි ඉහළ මහල මහනුවර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. මහනුවර නගරයේ උරුමය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය සඳහා උල්පැන්ගේ තොරතුරු මධ්‍යස්ථානයේ දායකත්වය කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. පුස්තකාල අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය යන ක්‍රම ඔස්සේ මේ සඳහා තොරතුරු ලබා ගන්නා ලදී. වර්තමානය වන විට උල්පැන්ගේ දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනා ඇති ස්ථානයක් ලෙස හඳුනා ගත හැකි ය. එසේම පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යන උල්පැන්ගේ ඉහළ මහළ තුළ නරඹන්නන් වෙනුවෙන් පුස්තකාලයක්, පුරාවිද්‍යා සහ ඉතිහාසය සම්බන්ධ ග්‍රන්ථ අළෙවි සැලක් දක්නට ලැබේ. එසේම මෙම තොරතුරු මධ්‍යස්ථාන හරහා මහනුවර ඉතිහාසය, මහනුවර උරුම ස්ථාන, උල්පැන්ගේ ඉතිහාසය සහ එහි සංරක්ෂණ කටයුතු සිදු වූ ආකාරය පිළිබඳව වීඩියෝ සහ ඡායාරූප ප්‍රදර්ශනය කරනු ලබන අතර නරඹන්නන්ට නිදහසේ පැමිණ ඒවා නරඹමින් තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබේ. තව ද මෙම තොරතුරු මධ්‍යස්ථානය තුළ මහනුවර පුරාවිද්‍යා කාර්යාලය මගින් මහනුවර කලාපයේ සිදු කරන ලද ගවේෂණ, කැණීම්, නිරීක්ෂණ, සංරක්ෂණ, සහ නඩත්තු කටයුතු පිළිබඳ වාර්තා පරිශීලනය කිරීමට හැකි අතර අධ්‍යයන කටයුතු සිදු කරන ඕනෑම අයෙකුට නිදහසේ සිය කටයුතු සිදු කරගැනීම සඳහා මෙම ස්ථානයේ අවස්ථාව සලසා ඇත. එසේම 90 දෙනෙකුට එකවර භාවිත කළ හැකි සම්පූර්ණ පහසුකම් සහිත දේශන ශාලාවක් ඇති අතර එහි මහනුවර පුරාවිද්‍යා කාර්යාලය මගින් මහනුවර උරුමය ප්‍රවර්ධනය සඳහා විවිධ දේශන ආදිය පවත්වනු ලබයි. එමෙන්ම මෙම තොරතුරු මධ්‍යස්ථානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් හට අවශ්‍ය තොරතුරු සැපයීමට සඳහා සුහදශීලීව කටයුතු කරන නිළධාරී පිරිසක් මෙහි සිටීම සහ පැමිණෙන්නන් හට තම අදහස් සටහන් කිරීමට අදහස් හා යෝජනා පොතක් ද තිබීම විශේෂ වේ. මෙම උල්පැන්ගේ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයට දෛනිකව 100 කට ආසන්න දෙස් විදෙස් සංචාරකයන් පැමිණෙන අතර පුරාවිද්‍යා ප්‍රකාශන අලවිය තුළින් මාසිකව රුපියල් 50,000 ක පමණ ආදායමක් උපයා ගනී. ඒ අනුව වයස් භේදයකින් තොරව මෙහි පැමිණෙන සියලු දෙනාටම මහනුවර උරුමය පිළිබඳ තොරතුරු රැසක් ලබා ගැනීමට හැකි වේ. මෙලෙස මහනුවර ලෝක උරුම ප්‍රවර්ධනය සඳහා උල්පැන්ගේ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය විශාල දායකත්වයක් ලබා දෙන බව මෙම අධ්‍යයනය මගින් පැහැදිලි වේ.

***ප්‍රමුඛ පදඃ*** මහනුවර, උරුමය, උල්පැන්ගේ, පුරාවිද්‍යා, තොරතුරු මධ්‍යස්ථානය

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. imeshavinodani332@gmail.com

[2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. sasanthi99@gmail.com

# කැලණි විහාරයේ පැරණි බුදු ගෙහි ඇති මහනුවර යුගයේ සිතුවම් සඳහා නාග රූප බහුලව යොදාගැනීම පිළිබඳ ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටියෙන් අධ්‍යයනයක්

*කේනුර ගීසර* [1], *ගයාන් මධුසංක* [2]

පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණයේ දී අවධාරණයට ලක්වන වස්තුවක නියමානුකූල තේරුම හඳුනාගැනීමටත් එය අයත් ආරම්භක සන්දර්භයන් අධ්‍යයනය කිරීම වැදගත්ය. එය ප්‍රසාංගික පුරාවිද්‍යාව ලෙස හඳුන්වයි. 1980 දශකයේ දී පශ්චාත් සංස්ලේශි වාදයේ පියා වූ ඉයන් හොඩර් විසින් මෙම සංකල්පීය ප්‍රවේශය සාකච්ඡාවට ලක්කර ඇත. මෙම අධ්‍යනය තුළ දී සිතුවම් සම්ප්‍රදායන් අතරින් කැලණි විහාරයේ සිතුවම් හා මූර්ති සඳහා නාග රූප බහුලව යොදාගැනීමට එවකට පැවති සමාජ සංස්කෘතියෙහි බලපෑම අධ්‍යයනය කිරිම අරමුණ වේ. ඒ සඳහා හේතු වූ සංකල්ප මොනවාද? යන්න ප්‍රධාන පර්යේෂණ ගැටළුව වේ. මේ සඳහා අධ්‍යයන ප්‍රදේශ ලෙස බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැලණිය රජමහ විහාරයේ පැරණි බුදු ගෙය තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරිමට භාවිත කළ ක්‍රමවේද අතර සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය, සම්මුඛ සාකච්ඡා, සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය, ඡායාරූප අධ්‍යයනය ආදී ක්‍රම යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටිය ට අනුව පුරාතන කාලයට අයත් මනුෂ්‍ය ක්‍රියාවලීන්ට අදාල පාරිසරික හා චර්යාත්මක අංශ මත අවධාරණය කිරීම හා මෙම සිතුවම් ස්ථානගත ව පැවැති පසුබිමෙ අන්තර්ජාලය තුල තිබෙන තොරතුරු අනුව හඳුනාගන්නා ලදී. එහි දී පර්යේෂණ ප්‍රතිඵල ලෙස මෙම ප්‍රදේශයේ ජනතාව තුළ කාලාන්තරයක් මුළුල්ලේ පැවැති ජනප්‍රවාද ගත කරුණු මෙම සිතුවම් නිර්මාණය සඳහා හේතු වූ බව අධ්‍යයනයෙන් පෙනී ගියේ ය. මෙම අධ්‍යයනය මගින් කැලණි විහාරයේ සිතුවම් හා මූර්ති සඳහා නාග රූප බහුලව යොදාගැනීමට හේතු වූයේ එවකට පැවති සාමාජයීය හා සංස්කෘතික කාරණා බව ත්, එය ප්‍රසංගික පුරාවිද්‍යා දෘෂ්ටිය මගින් සනාථ වන බව ත් පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** කැලණි විහාරය, නාග රූප, ප්‍රසංගික පුරාවිද්‍යාව, සංස්කෘතිය, සිතුවම්

[1] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. kenura.00@gmail.com

[2] ව්‍යවහාරික පුරාවිද්‍යා අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. galwate2000@gmail.com

# නුවරකලාවියේ උලගල්ල කෝරළයට අයත් කට්ටමුරිච්චාන ග්‍රාමය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

*එස්.එස්.අයි.එම්. සෙනෙවිරත්න [1], බී.ආර්.විමලසේන [2], පී.ටී.සී. මධුවන්ති [3]*

කට්ටමුරිච්චාන ග්‍රාමය උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වියළි කලාපීය දේශගුණයක් සහිත කුඩා ලඳු කැලෑවලින් වට වී තිබෙන අතීතයේ උලගල්ල කෝරළයට අයත් වූ ත්, වර්තමානයේ මරදන්කඩවලට ආසන්නව පිහිටා තිබෙන ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ග්‍රාමයකි. වත්මන් සමාජය තුළින් වියැකී යන ලාංකිකයන්ට ආවේණික වූ ගැමි සංස්කෘතිය නැවත ඉස්මතු කර ගනිමින් එම ග්‍රාමීය පරිසරය පිළිබඳ ඓතිහාසික තතු හඳුනාගැනීම, ග්‍රාමීය භූගෝලීය පිහිටීම හඳුනාගැනීම, ග්‍රාමය ආරම්භ වූ ආකාරය සහ විකාසනය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. නුවරකලාවියේ උලගල්ල කෝරළයට අයත් ග්‍රාමීය පරිසරයකට උරුමකම් කියන කට්ටමුරිච්චාන ග්‍රාමයේ ඓතිහාසිකත්වය කෙබඳුද යන්න විමර්ශනය කිරීම පර්යේෂණයේ ගැටලුව වේ. කට්ටමුරිච්චාන ග්‍රාමය මූලික කරගෙන පර්යේෂණ සිදු කර නොමැති අතර නුවරකලාවියේ උලගල්ල කෝරළයට නොහොත් උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට කට්ටමුරිච්චාන ග්‍රාමය අයිති වන නිසා ඒ ආශ්‍රිතව සිදු කර ඇති පර්යේෂණ සාහිත්‍ය විමර්ශන යටතේ අධ්‍යයනය කරනු ලැබේ. තව ද ක්ෂේත්‍ර අධ්‍යයනය ඔස්සේ ග්‍රාමය පිළිබඳ තොරතුරු එක් රැස් කරනු ලැබේ. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පොත්පත්, සිතියම් සහ ඡායාරූප පිළිබඳව අධ්‍යයනයක නිරත වෙමින් දත්ත එක් රැස් කිරීම ද කට්ටමුරිච්චාන ග්‍රාමයේ වැඩිහිටි පිරිසක් අහඹු ලෙස තෝරා ගනිමින් සම්මුඛ සාකච්ඡාවලට බඳුන් කරමින් ද ලබාගන්නා තොරතුරු හා දත්ත විශ්ලේෂණ විධික්‍රමවේද යොදා ගනිමින් විමර්ශනය කෙරේ. කට්ටමුරිච්චාන ග්‍රාමයේ භෞතික පරිසරය, වර්තමානයේ පවතින ගොඩනැගිලි, විවිධ ස්ථාන, නටඹුන් සහිත ස්ථාන සහ පාරිසරික සාධක පිළිබඳ සොයා බලා දත්ත විවරණය කිරීමට යොමු විය. මානව ක්‍රියාකාරකම් සහ සමාජ බලපෑම් නිසා කට්ටමුරිච්චාන ග්‍රාමයට සිදු වී තිබෙන බලපෑම්, අහිමි වූ දේවල්, වියැකී යන ඉතිහාසය, මිනිසුන්ගේ සාමූහිකත්වය පදනම් කරගෙන ගොඩ නැගුණු සමාජ ක්‍රමය සහ සංස්කෘතිය පිළිබඳ ව මෙම පර්යේෂණය තුළින් හඳුනා ගැනීමට හැකි විය. ගොවිගම කුලය මූලික වූ සමාජ ක්‍රමය නිසා අසල්වැසි ග්‍රාමයන් සම්බන්ධතා පවත්වා ගැනීම විවිධ සීමාවලට ලක් වී තිබීම මුල්කාලීන ලක්ෂණයක් වුව ත්, වර්තමානය වන විට එම කාරණාව යටපත් වී ආවාහ විවාහ කටයුතුවල දී පමණක් සීමා වී ඇත. පූජනීය වශයෙන් මහ දේව වන්දනය වැනි අභිචාර විධි පාරම්පරිකව පවත්වාගෙන ගිය ද වර්තමානය වන විට එම පරම්පරාව වියැකී යාම ගමේ සාමූහිකත්වයට බලපෑම් කර තිබේ. එමෙන් ම කට්ටමුරිච්චාන මහ විදුහලේ පරිහානීය තත්ත්වය ග්‍රාමයේ පැවැත්මට පවා බලපෑම් කර තිබේ. මෙම භූමිය තුළ ඓතිහාසික සිද්ධීන් පිළිබඳ තොරතුරු හඳුනාගැනීමට හැකි වූ අතර මෙතෙක් කාලයක් ඒ පිළිබඳ කිසිවෙකුගේ අවධානයක් යොමු නොවී තිබෙන බවත් ඓතිහාසික නුවරකලාවීය සම්බන්ධ ඉතිහාසයේ මිනිසුන් තුළ ඇති සාමූහිකත්වය, අභියෝග සඳහා මුහුණ දුන් ආකාරය, ඔවුන්ගේ සමාජ සම්බන්ධතා සහ පරිසරය සමග මුසු වූ ජීවනාවලිය ආදී ලක්ෂණ මෙම ග්‍රාමීය පරිසරය තුළ දැක ගත හැකි බවත්, පැවතුණු අතර වර්තමානය වන විට ඒවා වියැකී යන තත්ත්වයට පත් වී තිබෙන බව නිගමනය කළ හැකි ය.

***මුඛ්‍ය පද:*** අනුරාධපුර දිස්ත්‍රික්කය, කට්ටමුරිච්චාන ග්‍රාමය, නුවරකලාවිය, සමාජ ක්‍රමය, සංස්කෘතිය

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. isharamad56@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
[3] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.

# මහනුවර ඩෝසන් කුළුණෙහි සංරක්ෂණ අවශ්‍යතාවය පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යනයක්.

*එම්.එස්.එන්. විජේසිරි [1]*

බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ඉදිකළ මුල් ම මහාමාර්ගය වූ කොළඹ-මහනුවර මාර්ගයේ වැඩ කටයුතු අරඹනු ලැබුවේ 1820 වර්ෂයේදීය. වරකාපොළ සිට අඹන්පොළ දක්වා වූ සැතපුම් 11ක් පමණ දුර ප්‍රමාණය මේජර් තෝමස් ස්කිනර් යටතේ ද, මාර්ගයේ ඉතිරි සම්පූර්ණ සැතපුම් 36ක ප්‍රමාණය කපිතාන් ඩෝසන්ගේ අධීක්ෂණය යටතේ ද සිදු වීමට නියමිත වූ නමුදු කපිතාන් ඩෝසන් අභාවප්‍රාප්ත වූ බැවින් ඔහු සිහිකරනු වස් බ්‍රිතාන්‍ය පාලකයින් ශ්‍රී ලංකාවේ කඩුගන්නාව පිහිටි කපොල්ල ආසන්නයේ ඉදිකොට තිබෙන ස්මාරකය ඩෝසන් කුළුණ ලෙස නම් කරන ලදී. ඩෝසන් කුළුණ මේ වනවිට යම් හානියකට ලක්වී ඇති ආකාරයක් පෙනෙන බැවින් හානිකාරක මොනවාද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගැණුනි. ඩෝසන් කුළුණෙහි හානිකාරක සඳහා ලබාදිය යුතු සංරක්ෂණ පිළියම් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමත් එහි හානිකාරක පිළිබඳව වාර්තාගත කිරීමත් පර්යේෂණ අරමුණ වේ. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද භාවිත කරන අතර එහිදී පුස්තකාල අධ්‍යනයන්, ක්ෂේත්‍ර අධ්‍යනයන් සහ පුරාවිද්‍යා සංරක්ෂකයින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිළධාරීන් සමග සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරන ලදී. ස්වභාවිකව මෙන්ම මානව ක්‍රියාකාරකම් මත ද නිසි සංරක්ෂණයකින් තොරව ද ඩෝසන් කුළුණ අවදානමක පවතී නියමිත පරිදි පිළිස්සුණු ගඩොල් භාවිතා නොකිරීම බදාමවල ශක්තියට වඩා අඩු ශක්තියකින් ඇති ගඩොල් භාවිතා කිරීමෙන්ද ස්මාරකය හායනයට ලක්වී ඇත. එමෙන්ම ස්මාරකයෙහි බෝ (*Ficus religiousa*), නුග වැනි ශාක වර්ධනය වීමෙන් ඉරිතැලීම්, ඉදිරියට නෙරා යාමක් සිදුවේ. ඇල්ගී, දිලීර සහ පෙදපාසි හේතුවෙන් අවපැහැ ගැන්වී ඇති බැවින් මෙහි සෞන්දර්යාත්මක අගය විනාශ කරයි.මිනිස් ක්‍රියාකාරකම්වල බලපෑමෙන් ස්මාරකය නැරඹීම තහනම් කළද එය සංරක්ෂණ කටයුතු සඳහා බාධාවක් වේ. ඩෝසන් කුළුණෙහි සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ස්මාරකයේ අගයන්ගේ වෙනස්කමකින් තොරව අවට ඇති තත්ත්වයන් පාලනය කරමින් එය ආරක්ෂා කර ගැනීම සිදු කළ යුතුය. වර්ෂාව, සුළඟින් සිදුවන හානි වළක්වා ගැනීමට ක්‍රියාකර කොල්ලකෑම් සහ අනෙකුත් මානව හානි වලින් ආරක්ෂා කර ගැනීමට නීතිරීති ක්‍රියාත්මක කිරීම, මුරකරුවන් යෙදවීම සහ ජාතික උරුමයක් සහ ස්මාරකයක් ලෙස ගැසට් කර නඩත්තු කළ හැකිය. එබැවින් මෙය නිසිපරිදි සංරක්ෂණය කරමින් එහි ගැබ්ව පවතින අගයන් ආරක්ෂා කරගත හැකි බව පර්යේෂණයෙහි නිගමනයයි.

***ප්‍රමුඛ පද:*** ඩෝසන් කුළුණ, සංරක්ෂණය, හායනය, උරුමය, බ්‍රිතාන්‍ය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණු විශ්ව විද්‍යාලය. sanduniwijesiri1998@gmail.com

# තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින් හෙළිවන ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයෙහි ස්වරූපය

*ජේ.පි.ඊ.එස්. ජයසූරිය [1]*

ශ්‍රී ලාංකේය අතීතය විවරණය කරන මූලාශ්‍රයක් වසයෙන් සැලකිය යුතු දායකත්වයක් සපයන ශිලාලේඛනයන් හි ලාංකේය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන් හි ඓතිහාසික තොරතුරු අන්තර්ගත ය. මූලාශ්‍රයගත සාධක මගින් කාන්තාවන් ඉහත කී විවිධ ක්ෂේත්‍ර තුළ සක්‍රීය දායකත්වයක් සැපයූ ආකාරය හඳුනාගත හැකි වේ. ශිලාලේඛන සාධක ඇසුරින් අනුරාධපුර යුගයේ කාන්තාව ඉටු කළ කාර්යයන්, ආගමික කටයුතු උදෙසා ඔවුන්ගේ දායකත්වය කෙසේ ද යන්න පර්යේෂණ ගැටලුව කරගනිමින් සිදු කර ඇති මෙම පර්යේෂණයේ අරමුණ, ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය ශිලාලේඛන සාධක ඇසුරින් අනාවරණය වන්නේ කෙසේදැයි විශ්ලේෂණය කිරීම ය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර එහි දී පුස්තකාල අධ්‍යයන සහ විද්‍යුත් මාධ්‍ය භාවිතය සිදු විය. විශේෂයෙන් අභිලේඛන සංග්‍රහය ග්‍රන්ථමාලාව පරිශීලනය කරනු ලැබී ය. නීලගිරි ගිරිලිපි අංක 01, අංක 02 දරණ කරදියනාරු ශිලාලේඛනය, දීඝවාපී පුදබිමෙන් හමුවන පැරණි ශිලාලේඛන අංක 4634 පුවරු ලිපිය, ගල්වැව ගිරිලිපිය, බම්බුකුලියවත්ත ශිලාලේඛනය, අභයගිරි දීඝපාෂාණ ලෙන ඉදිරිපිට දිගල්ලෙන් ගිරිලිපිය සහ වෙහෙරගල ආරණ්‍යය සේනාසන ගිරිලිපිය ආදී තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින් ආගමික කටයුතු උදෙසා කාන්තාවගේ දායකත්වයෙහි ස්වරූපය විශ්ලේෂණය කරන ලදී. ශිලාලේඛනයන් හි බහුල වසයෙන් සඳහන් වන්නේ ලෙන් පූජා කිරීම සම්බන්ධයෙන් වන අතර පර්යේෂණයට සම්බන්ධව තෝරාගත් මෙම ශිලාලේඛනයන් හි විවිධත්වයකින් කරුණු අනාවරණය කරයි. උපයාගත් ධනය, හිමිකාරීත්වයක් තිබූ වැව් සහ ඒවායේ බදු ආගමික ස්ථාන සහ ආගමික කටයුතු උදෙසා ප්‍රදානය, ලෙන් පූජා කිරීම එපමණක් නොව සලපතලමළුවට පූජා කරන ලද පාෂාණ පුවරු ආදියෙහි නම් සටහන් කරවීම, ස්තූප ඉදිකරවීම, වෙහෙර විහාරස්ථානවලට පූජා කිරීම උදෙසා පහන් ආදිය කරවා ඒවාට කරන ලද ප්‍රදානයන් පිළිබඳ ව ආවරණය වේ. ඒ අනුව අතීත ලාංකේය කාන්තාව බෞද්ධාගමික වෙහෙර විහාරස්ථාන සමග පැවැත්වූ ආගමික සබඳතා සහ දායකත්වයෙහි ස්වරූපය අනාවරණය වන අතර තවදුරටත් දේපළ හිමිකාරීත්වය, තනතුරු, සමාජ භූමිකාව, පරිපාලන කටයුතු පමණක් නොව ස්වාධීනත්වයකින් කටයුතු කළ බව ත්, ධනවත් සහ උත්සාහයෙන් මුදල් උපයාගත් කාන්තාවන් සිටි බව ත්, අතීත ලාංකීය කාන්තාව තම ගෘහයට පමණක් සීමා නොවී ආගමික කටයුතුවලට සක්‍රීය දායකත්වයක් සපයමින් පුණ්‍ය කටයුතුවල නිරත වූ බැව් පර්යේෂණ කරුණු මගින් පසක් වේ. පර්යේෂණයෙන් අනාවරණය කරගන්නා ලද කරුණු අනුව ඉහත කී ශිලාලේඛන කිහිපය ඇසුරින් හෙළිවන ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය විවිධත්වයකින් යුතුව අනාවරණය වේ.

***ප්‍රමුඛ පද:*** අනුරාධපුර, ආගමික, ලාංකේය කාන්තාව, ශිලා ලේඛන

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. erandathi.18271@uhss.ruh.ac.lk

# බුදුරුවගල පුරාවිද්‍යා පරිශ්‍රය සහ තදාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍ර සඳහා උරුම කළමනාකරණ සැලැස්මක්

*එච්.ඩී.එස්. ප්‍රනාන්දු [1], එම්.සී.එස්. කෝස්තා [2], එච්.වී.ටී.ඒ. සුදර්මන් [3], ඩබ්.ඒ.එන්.ඒ. වික්‍රමසිංහ [4]*

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා පරිශ්‍රය උරුම සංචාරක සන්දර්භයක් වශයෙන් සුවිශේෂත්වයක් උසුලනු ලබයි. ඒ අනුව බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් හි සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින උරුම කළමනාකරණ සැලසුම වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පර්යේෂණ ගැටලුව වනුයේ බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා පරිශ්‍රයන් සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ වශයෙන් ප්‍රවර්ධනය කිරීමට පවත්නා ගැටලු හා අවස්ථා කවරේද? යන්න හඳුනා ගැනීම යි. පර්යේෂණ ක්‍රමවේදය යටතේ බුදුරුවගල, මාලිගාවිල, දඹේගොඩ, යුදගනාව, දෙමටමල් විහාරය හා කුරුල්ලන්ගල කේන්ද්‍ර කර ගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන, පූර්ව පර්යේෂණ හා සාහිත්‍ය විමර්ශන ඇසුරෙන් දත්ත රැස් කිරීම සිදු වූ අතර දත්ත විශ්ලේෂණයේ දී අදාළ දත්ත පාදක කර ගනිමින් උක්ත ක්ෂේත්‍රයන් හි සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමට පවත්නා ගැටලු හා අවස්ථා කවරේද යන්න හඳුනා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් යතෝක්ත ක්ෂේත්‍රයේ ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික අවධිවලට අයත් උරුම රැසක් හඳුනා ගැනීමට හැකි විය. එම උරුම අතර ප්‍රාග් ඓතිහාසික සිතුවම්, අල්ප උන්නත මහායානික බෝධිසත්ව ප්‍රතිමා, ශ්‍රී ලංකාවේ විශාලතම අනාබද්ධ හිටි බුද්ධ ප්‍රතිමාව, ශ්‍රී ලංකාවේ විශාලතම අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව, ශ්‍රී ලංකාවේ දැනට හමුවන එකම යුගල මුරගල වැනි වැදගත් උරුමයන් රැසක් හඳුනාගැනීමට හැකි විය. කෙසේ නමුත් ස්මාරක පාදා ගැනීම හා සංරක්ෂණය සිදු නොකිරීම, යටිතල හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය නොවීම, පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් සඳහා පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවැසි විධි විධාන ක්‍රියාත්මක නොවීම සහ උරුම අගයන් පිළිබඳ ප්‍රචාරණය හා ප්‍රවර්ධනය නිසි ආකාරව සිදු නොවීම යනාදී ගැටලු හඳුනා ගැනීමට හැකි විය. මෙහි ප්‍රවර්ධන අවස්ථා ලෙස අධ්‍යයන ප්‍රදේශ තුළ පවතින ලෝක උරුම වටිනාකමකින් යුතු නිර්මාණ වන බුදුරුවගල බෝධිසත්ව ප්‍රතිමා පන්තිය, දෙමටමල් විහාර මුරගල වැනි උරුමයන් ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කොට සංචාරක ආකර්ෂණය ලබා ගැනීම, සංචාරකයන්ට අවට ඇති ස්වභාවික නිර්මිතයන් (බුදුරුවගල වැව, කුරුල්ලන්ගල පර්වතය) ආශ්‍රිතව ත්‍රාසජනක හා විනෝදාත්මක ක්‍රීඩා (බෝට්ටු සේවා, කඳු නැගීම) ආදිය සිදුකිරීමට පහසුකම් සැලසීම යනාදිය පෙන්වා දිය හැකි ය. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරගත් දත්ත ඇසුරෙන් පවතින කෞතුකාගාර යාවත්කාලීන කිරීම, ආරක්ෂක විධි විධාන වැඩි දියුණු කිරීම හා ප්‍රාදේශීය ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම වැනි යෝජනා ද ඉදිරිපත් කළ හැකි ය. මේ අනුව උක්ත ප්‍රදේශය මනා උරුම කළමනාකරණ සැලසුමක් තුළින් සංචාරක ආකර්ෂණය සහිත ක්ෂේත්‍රයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට ඉහළ අවකාශයක් පවතින බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** කළමනාකරණය, උරුමය, ඌව පළාත, බුදුරුවගල, සංචාරක

[1,2,3,4] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. sadaruwanchandu74@gmail.com

# අල්ගම ග්‍රාමයෙහි ඓතිහාසිකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඉහළගම බුද්ධප්‍රිය* [1]

සබරගමු පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අල්ගම ග්‍රාමයෙහි පිහිටා තිබේ. කොළඹ නුවර මාර්ගයේ හොරගස්මංකඩ සිට ගොඩවෙල, තාඹුගල ආදී ග්‍රාම සේවා වසම් පසුකොට කි.මී 06 ක් පමණ ගිය තැන අල්ගම ග්‍රාමයට පිවිසිය හැකි ය. දැනට මහනුවර විෂ්ණු දේවාලයේ ඇති ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් ශක වර්ෂ 1631 දී ප්‍රකාශයට පත් කරන ලද රන් ආලේපිත සන්නසේත්, එච්. සී. පී බෙල් මහතා විසින් සම්පාදිත කෑගලු වාර්තාවේත් මෙම ප්‍රදේශය පිළිබඳව සඳහන් කොට තිබේ. මෙකී මූලාශ්‍රය පාදක කොටගෙන මෙම ග්‍රාමයෙහි ඓතිහාසිකත්වය පිළිබඳව ප්‍රමාණික දත්ත ක්‍රමානුකූල විකාශනයක් නොතිබීම මත ඇති වි තිබු ගැටලුකාරී තත්වය සඳහා විධිමත් විසඳුමක් ලබා දීම මෙමගින් සිදුවේ. ඒ සඳහා සාහිත්‍ය විමර්ශන, ජනප්‍රවාද උපයෝගී කර ගැනුණි. සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ වැනි ගුණාත්මක දත්ත වාර්තා කරන ක්‍රමවේද යොදා ගන්නා ලදී. දුරාතීතයේ සිට මෙම ප්‍රදේශයෙහි ඇල් සහල් වගා කර ඇති බවත්, එම සහල් දළදා තේවාව සඳහා රැගෙන ගොස් ඇති බවත්, ඇල් සහල් වගා කළ ගම ඇල්ගම වී පසුව අල්ගම වූ බවත් කියැවේ. තව ද ශක වර්ෂ 1631 දී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මහනුවර විෂ්ණු දේවාලය සඳහා සතර කෝරළයේ තත් ප්‍රදේශයෙන් සියලු ඉඩම්, වගාකෙත්, උස්බිම්, පහත්බිම්, වැව්, වගා නොකළ ඉඩම් මෙන්ම ඒවාට සේවා උපස්ථායකයන්ද ඇතුළුව ගම් දොළහක් ප්‍රධානය කළ බවට සාක්ෂ්‍ය දරයි. බෙලිගල් කෝරළයේ කීරවැලි පත්තුවේ (බටහිර) ප්‍රදේශයට අයත් මෙම ප්‍රදේශය තුළ අල්ගම (ඉහළගම) ටැම්පිට විහාරය, මැදගම පහළ විහාරය, දොරවක, ගණේගම රජමහා විහාරය, උඩුවක රජමහා විහාරය හා තාඹුගල ගල රජමහා විහාරය පිහිටා ඇත. එමෙන්ම මෙම ප්‍රදේශයට ආසන්නව පෞරාණිකත්වයෙන් යුත් කටාරම් සහිත ගල් ලෙන් කිහිපයක් ද දක්නට ඇති අතර බඹරගල කන්ද තුළ පිහිටි ගල්ලෙන් සංඛ්‍යාව දෙකකි.ඉන් එකක් 'පූජා ගල' ලෙස හැඳින් වේ. කස්තුරි කන්ද නම් ස්ථානයෙහි ද ගල් ලෙනක් දක්නට ලැබේ. බඹරගල ගලෙහි ඇටවූ ගල් උගුල් කිහිපයක් ද වන අතර ජනප්‍රවාදයේ එන මතයක් වනුයේ වළගම්බා රජු බඹරගල කන්දෙහි වනගතව වාසය කළ බව යි. එසේ ම මෙම ප්‍රදේශයේ උමං මාර්ග ඇති බවත්, අල්ගම ඇල්ල නම් ප්‍රදේශයේ පෘතුගීසීන් ලැගුම් ගෙන ඇති බවත් ජනප්‍රවාදයේ කියැවේ.සතර කෝරළේ අතපත්තුවේ ලේකම් පොත තුළ සඳහන් කීරවැලි පත්තුවේ හේවා නම් අතර 'අල්ගම හේවායා' නම් පුද්ගලයෙකු පිළිබඳ සඳහන් ය. ගම්පොළ යුගයේ රචිත තිසර සංදේශයෙහි තිසරා අල්ගමට පැමිණි බව හා එහි කාන්තාවන් පිළිබඳව සඳහන් කර තිබේ. දොරවක ප්‍රාග් ඓතිහාසික ස්ථානයට හා අලවල ප්‍රාග් ඓතිහාසික ස්ථානයට මධ්‍යගතව පිහිටි බැවින් මෙම ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික වශයෙන් වැදගත් ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි අතර ආගමික, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වටිනාකමකින් යුත් ප්‍රදේශයක් වශයෙන් විද්‍යමාන ය.

***ප්‍රමුඛ පදඃ*** අතපත්තුවේ, අල්ගම, කෑගලු, සන්නස

---

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. ihalagamabuddhapriya@gmail.com

# මහනුවර යුගයේ දෙල්දෙණිය සිත්තර පරපුරට අනන්‍ය වූ සිතුවම් කලාව පිළිබඳ සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය ඇසුරෙන් කළ අධ්‍යයනයක්

*අයි.ජී.එච්.ටී. මදුමාදරී [1] , කේ.ඕ.ඒ.එස්.බී. අබේසේකර [2]*

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ පෞරාණිකත්වය හා දේශීය සාම්ප්‍රදායිකත්වය ඉස්මතු කෙරෙන පුරාණ විහාරස්ථානයක් ලෙස සූරියගොඩ නරේන්ද්‍රසිංහ රජමහා විහාරස්ථානය හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟ පළාත සූරියගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ සියලු විහාරාංගයන්ගෙන් පරිපූර්ණ ව මහනුවර යුගයේ කලා සම්ප්‍රදායයන් අනුව නිමවා ඇති ඓතිහාසික සූරියගොඩ රජමහා විහාරය පිහිටා ඇත. විහාරස්ථානයේ ඉතිහාසය කෝට්ටේ යුගය දක්වා දිව යන අතර ක්‍රිස්තු වර්ෂ 1757 දි මහනුවර රාජධානියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මූලිකත්වයෙන් ද, වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමිගේ අනුශාසකත්වයෙන් ද ප්‍රතිසංස්කරණය කොට ඇත. පර්යේෂණ ගැටලුව වන්නේ සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය තුළ විද්‍යාමාන දෙල්දෙණිය සිත්තර පරපුරේ සිතුවම්කරණයට ආවේණික ලක්ෂණ කෙබඳු ද යන්න පිළිබඳව යි. සූරියගොඩ රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහය ඇතුළත දෙල්දෙණිය සිත්තර පරපුරට අනන්‍ය වූ සිතුවම් කලාව පිළිබඳ සිදු කළ මෙම පර්යේෂණයේ අධ්‍යයන අරමුණ වන්නේ සූරියගොඩ රජමහා විහාරය ඇසුරෙන් දෙල්දෙණිය සිත්තර පරපුරේ සිතුවම් කලාවට අනන්‍ය වූ ලක්ෂණ හඳුනා ගනිමින් සූරියගොඩ රජමහා විහාරය ජාතික උරුමයක් ලෙස වැදගත් වන බවත්, එය සංරක්ෂණය කිරීමේ වගකීම සමාජයට අවධාරණය කිරීම යි. ක්ෂේත්‍ර අධ්‍යයන සහ ග්‍රන්ථ විශ්ලේෂණ ක්‍රම යන පර්යේෂණ ක්‍රමවේද යටතේ රාජමහා විහාරය පිළිබඳ සිදුකරන ලද මෙම පර්යේෂණයෙන් ලබාගත් සොයාගැනීම් අනුව දෙල්දෙණිය සිත්තර පරම්පරාවට අනන්‍ය වූ ලක්ෂණ ලෙස, මෙම සිතුවම්හි බාහිර රේඛාකරණය දක්නට ලැබුණත් මහනුවර යුගයේ අනෙකුත් විහාරස්ථානවල සිතුවම්හි මිනිස් රූපවල දක්නට ඇති සියුම් රේඛාකරණය මෙහි දී දක්නට ඇත්තේ අල්ප වසයෙනි. මූලික වසයෙන් රතු, සුදු, කහ සහ නිල් වර්ණ භාවිත කොට ඇත. කොළ වර්ණය භාවිත නොකිරීම මෙම සිතුවම්කරණයට අනන්‍ය වූ ලක්ෂණයකි. මහනුවර යුගය තුළ අනෙකුත් විහාරස්ථානවල දක්නට නොලැබෙන ජීව ස්වරූපයක් දක්නට ඇත. එනම් මානව රූපවල අත්-පා චලනය වන ස්වරූපයක් දක්නට ඇත. මහනුවර යුගයේ අනෙක් සිත්තරුන් සත්ව රූප හා මානව රූපවලට එක ම උසකට ශෛලගත ස්වරූපයක් ලබා දී ඇත. නමුත් මොවුන් මිනිස් රූපවලට වඩා සත්ව රූප විශාල ව ඇඳ ස්වභාවිකත්වයට මුල් තැනක් ලබා දී ඇත. මහනුවර යුගයේ ශාක ඇඳීමේ දී පත්‍ර හා අතු වෙන් වෙන් වසයෙන් ඇඳ බාහිර රේඛණය කර තිබුණ ත්, පින්සල් පාරවලින් ශාක ඇඳ තිබීම නූතනවාදී සිත්තරුන් භාවිත කරන තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකි ය. සිතුවම් සම්පීඩනයේ දී මොවුන් පසුබිම වැඩි වසයෙන් හිස් ව තැබීම නිසා එය මහනුවර යුගයේ අනෙක් සිත්තරන් සමග සැසඳීමේ දී මොවුන් සතු ප්‍රබල දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකි ය. පර්යේෂණ අධ්‍යයනයට අනුව පෙනීගිය කරුණ නම් දෙල්දෙණිය සිත්තර පරපුරේ චිත්‍ර ශෛලියෙහි සිතුවම් දැකිය හැකි එකම ස්ථානය සූරියගොඩ රජමහා විහාරය වන බව යි. මහනුවර යුගයේ අනෙකුත් බෞද්ධ විහාරස්ථානයන් හි දක්නට ඇති චිත්‍ර සමග සූරියගොඩ විහාරස්ථානයේ ඇති සිතුවම් සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම දුෂ්කර වන බව මෙ මගින් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** දෙල්දෙණිය සිත්තර පරපුර, මහනුවර යුගය, විහාරස්ථානය, සිතුවම්කරණය, සූරියගොඩ රජමහා විහාරය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. hhiru1223@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
anupamaabeyasekara318@gmail.com

URSSSH 2024

# Communication & Mass Media




FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# The Feasibility of Public Relations Strategies in Event Marketing - Specializing to the Entertainment Event 'Naadhagama'

*A.M.S.V. Alahakoon* [1]

Public relations in event marketing for the Sri Lankan entertainment industry plays a crucial role in driving event success, particularly in creating unique and high-quality musical experiences. 'NaadhaGama' stands out as an exceptional musical event in Sri Lanka, successfully engaging a young audience through innovative concepts and maintaining quality by blending cultural and emotional strategies with outstanding musical performances. The research aimed to identify diverse PR strategies utilized within Sri Lankan entertainment event marketing, evaluate their effectiveness, and develop tailored recommendations for optimizing these strategies. The core problem addressed was whether the PR strategies employed in NaadhaGama's event marketing contributed to the event's success. Methodologically, the study employed semi-structured in-depth interviews with organizers, and the event attendees, analyzed through thematic analysis. Purposive sampling was used to select event organizers and attendees. The findings revealed that 'NaadhaGama' created connections by appealing to the nostalgic "village" settings that reached back into the cultural history of its audiences. The added elements of celebrity endorsements and interactive hosting raised the event beyond a concert into the celebration of cultural interest in traditional Sri Lankan lifestyles. These employed a PR strategy, including emotional connections, cultural engagements, Interactive atmosphere, unique approach methods, decision making process for quality maintaining and leveraging social media platforms significantly contributed to continuous high audience engagement, overcome recognized challenges, enhance the quality from every corner, recommendations for the improvement in entertainment event industry in Sri Lanka. The conclusions affirm that the PR strategies were pivotal in achieving NaadhaGama's success, highlighting their feasibility and impact within the Sri Lankan entertainment event industry. This study offers valuable insights for event organizers and marketers, emphasizing the importance of strategic PR practices in achieving event success in Sri Lankan contest.

***Keywords:*** Public Relations Strategies, Event Marketing, Entertainment Events in Sri Lanka, 'Naadhagama' Musical Event

[1] Department of Mass Communication, Faculty of Social Science, University of Kelaniya. sandinivishwanee@gmail.com

# ලංකා පෙන්තකොස්ත සභාවේ ආගමික ඇදහිලි හා විශ්වාසයන්හි සන්නිවේදනාර්ථ සහ ඇදහිලි විශ්වාස සමාජගත කිරීමේ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

*ජේ.ඒ. රශාංගි මධුශිකා* [1]

ආගම යනු සංස්කෘතික පද්ධතියකි. සංස්කෘතික පද්ධතිය පවත්වාගෙන යාමට සමාජය විසින් තෝරාගත් පිරිසක් ද සිටියි. ඒ අනුව වර්තමානයේ ලංකාවේ සීඝ්‍රයෙන් ව්‍යාප්තවන්නා වූ ආගමක් ලෙස ලංකා පෙන්තකොස්ත සභාව පිළිබඳ ජනතාවගේ දැනමුතු භාවයේ අවශ්‍යතාවය ඉතාමත් වැඩි වී තිබේ. එය 1924 වර්ෂයේ මතු වූ අතර එතැන් සිට දේශීය සංස්කෘතීන් සහ සන්දර්භයන් අනුව හැඩගැසුණු විවිධ ප්‍රකාශන සමඟින් ගෝලීය වසයෙන් ව්‍යාප්ත වී ඇත. රූපවාහිනී නොබැලීම, ඖෂධ නොගැනීම, ආබරණ නොපැළඳීම, රූප වන්දනයෙන් තොරවීම වැනි විවිධ ඇදහිලි, විශ්වාසයන් පෙන්තකොස්ත බැතිමතුන් රක්ෂා කරමින් ක්‍රියාකිරීම දැඩිව සමාජයේ දැකගත හැකි වුව ද එහි යටි අර්ථය සමාජගත නොවීම ගැටලු සහගත ය. එනම් කුමනාකාරයේ අසනීපයකට ලක්වුව ද පෙන්තකොස්ත ආගමිකයන් ඖෂධ ලබානොගන්නා අතර එවැනි ඇදහිලි විශ්වාසයන් එම ආගම තුළ කුමනාකාරයේ යටි අර්ථයක් ලබාදෙන්නේ ද යන්න සමාජමය ගැටලුවකි. එනිසා ම සමාජයෙන් පෙන්තකොස්ත ආගමිකයින්ට එල්ලවන බලපෑම දැඩි ය. එය පෙන්තකොස්ත ආගමිකයින් වසයෙන් ඔවුන්ට පවත්නා ගැටලුවකි. ඒ අනුව සමාජයේ කැපී පෙනෙන්නා වූ ලංකා පෙන්තකොස්ත සභාවේ ආගමික ඇදහිලි හා විශ්වාසයන් හි පවත්නා වූ සන්නිවේදනාර්ථ හඳුනාගැනීම පර්යේෂණයේ මූලික අරමුණ වන අතර, එම යටි අරුත් සමාජගත කළ හැකි ක්‍රමවේද මොනවාද යන්න ත්, ඒවා පෙන්තකොස්ත සභාවේ ඇදහිලි හා විශ්වාස සමාජගත කිරීමට යොදාගත හැකි ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වෙයි. ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලෙස පෙන්තකොස්ත බයිබලය, පෙන්තකොස්ත සඟරා, පෙන්තකොස්ත බැතිමතුන්, පෙන්තකොස්ත දේවගැතිවරු, අධ්‍යයනය සඳහා මිශ්‍ර ප්‍රවේශයෙන් ඍජු නිරීක්ෂණය, ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලී මගින් දත්ත රැස්කරන ලදි. රැස්කරගන්නා නිරීක්ෂණ දත්ත ක්ෂේත්‍ර සටහන් ලෙස පවත්වාගෙන යමින් සහ සම්මුඛ සාකච්ඡා පිටපත් කරගැනීමෙන් අනතුරුව තේමාත්මක විශ්ලේෂණයට ලක්කරන ලදී. ප්‍රශ්නාවලිය වී ෘංජක හරහා විශ්ලේෂණයට ලක්කරන ලදී. එහි දී ආගමික බැතිමතුන් බොහෝමයක් උපතින් ම පෙන්තකොස්ත ආගමිකයන් නොවන බව ත්, බහුතරයක් දෙනාගේ ජීවිතයේ අංක එක තම ආගම බව ත් පැහැදිලි විය. එමෙන් ම බහුතරයක් දෙනා ආගමික ඇදහිලි විශ්වාස නිසි ආකාරයෙන් රකින බවත්, එම ආගමික ඇදහිලි හා විශ්වාස තුළ පවතින යටි අරුත් ඉතාම අර්ථාන්විත බවත් අනාවරණය විය. තම ආගම පෙන්තකොස්ත ආගම නිසා සමාජයෙන් වූ බලපෑම පිළිබඳව ත්, ආගමික ඇදහිලි හා විශ්වාස රැකීම නිසා සමාජයෙන් එල්ලවන බලපෑම් පිළිබඳවත් හෙළි විය. ඇදහිලි හා විශ්වාසවල යටි අරුත් සමාජගත කිරීමේ ක්‍රමවේද ලෙස බයිබල් දේශනා, පෙන්තකොස්ත දහම්පාසල්, සංවිධානාත්මක ප්‍රචාරක වැඩසටහන්, ගෙයින් ගෙට ශුභාරංචිය පැතිරවීම, මාධ්‍ය හා සබැඳි භාවිතය සහ යාච්ඤා රැස්වීම් යොදාගත හැකි බව ත් අනාවරණය විය.

***මූඛ්‍ය පදඃ*** ආගම, පෙන්තකොස්ත, ඇදහිලි, සන්නිවේදනාර්ථ

---

[1]මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.ashangimadhushika09@gmail.com

# ශ්‍රී ලාංකීය රංගන ශිල්පියා තම මහජන සම්බන්ධතාව උදෙසා යූටියුබ් භාවිතය

*ඒ.පී.එල්.එස්. අතපත්තු* [1]

මෙම අධ්‍යයනය ශ්‍රී ලාංකේය විනෝදාස්වාද ක්ෂේත්‍රයේ නැගී එන ඩිජිටල් මාධ්‍ය භාවිතය තුළ ශ්‍රී ලාංකේය රංගන ශිල්පියා විසින් තම මහජන සම්බන්ධතාව උදෙසා YouTube අවකාශය තුළ Vlogs භාවිත කිරීම විමර්ශනය කරයි. අභිප්‍රේරණ, උපාය මාර්ග, රසික නියැලීම සහ රසිකයින්ගේ අන්තර් ක්‍රියා මට්ටම් ගවේෂණය කිරීම යන අරමුණු තුළින් පර්යේෂණය ඉලක්ක කරනුයේ ජනප්‍රිය රංගන ශිල්පීන් තම රසිකයින් සමඟ ඵලදායි ලෙස අව්‍යාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා YouTube Vlogs භාවිත කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දීම යි. මෙම පර්යේෂණය සඳහා සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන මිශ්‍ර එළඹුම යටතේ දත්ත රැස් කරගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේ දී සමාජ හුවමාරු න්‍යාය සහ භාවිත හා තෘප්තිමත් න්‍යාය භාවිත කරනු ලැබී ය. මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාවේ YouTube Vlogs ක්ෂේත්‍රයේ නියැලෙන ජනප්‍රිය රංගන ශිල්පීන් දෙදෙනෙකු යොදා ගනිමින් සම්මුඛ සාකච්ඡා ඔස්සේ ගුණාත්මක දත්තද, ශ්‍රී ලංකාව තුළ සිටින Vlogs රසිකයින් සිය දෙනෙකුගේ සමීක්ෂණයක් ඔස්සේ ප්‍රමාණාත්මක දත්තද එක් රැස් කරනු ලැබී ය. මෙම සොයාගැනීම් මගින් රසිකයන්ගෙන් ප්‍රබල ධනාත්මක ප්‍රතිචාරයක් අනාවරණය වන අතර, රංගන ශිල්පියාගේ මහජන ප්‍රතිරූපය සහ ඔවුන්ගේ රසිකයින් සමඟ ඇති සබඳතාව වැඩිදියුණු කිරීමට Vlogs සැලකිය යුතු ලෙස දායක වන බව පෙන්නුම් කරයි. Vlogs මගින් රසිකයින්ට රංගන ශිල්පීන්ගේ එදිනෙදා ජීවිතය දැකීමට ඉඩ සැලැස්වීමෙන් විනිවිදභාවය, අව්‍යාජත්වය, සත්‍යතාව සහ සාපේක්ෂතාව යන පොදු ප්‍රතිරූපයේ වැඩිදියුණු කරන ලද විශේෂිත අංග පෝෂණය කරයි. රසිකයින් ඔවුන්ගේ අපේක්ෂාවන්, අදහස් දැක්වීම් හරහා ප්‍රකාශ කරන අතර එය රංගන ශිල්පියා විසින් ක්‍රියාකාරීව පිළිගෙන ඔවුන්ගේ Vlogs අන්තර්ගතයට ඇතුළත් කරයි. මෙම අන්තර් ක්‍රියාකාරී ප්‍රවේශය අව්‍යාජ සම්බන්ධතා පෝෂණය කරන අතර රංගන ශිල්පියා සහ රසික පිරිස අතර ඇති බැඳීම ශක්තිමත් කරයි. පර්යේෂණයේ නිගමනය YouTube Vlogs භාවිත කිරීම ශ්‍රී ලාංකීය රංගන ශිල්පීන්ට තම මහජන සම්බන්ධතාව වැඩිදියුණු කිරීමට සහ ඔවුන්ගේ රසිකයින් සමඟ අව්‍යාජ සම්බන්ධතා වර්ධනය කිරීමට ප්‍රබල ලෙස දායක වන බව ය. රංගන ශිල්පියාට තම මහජන සම්බන්ධතාව තමා විසින්ම ගොඩනගා ගැනීමට හැකි ප්‍රබල ඩිජිටල් වේදිකාවක් ලෙස YouTube Vlogs මතුවී ඇති බව සහතික කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අනෙකුත් රංගන ශිල්පීන්ට ද සිය මහජන සම්බන්ධතාවය ගොඩනගා ගනිමින් පවත්වා ගැනීම සඳහා YouTube Vlogging වෙත යොමුවීම යෝග්‍ය වේ.

***ප්‍රමුඛ පද:*** මාධ්‍යය, Vlog, සම්බන්ධතාව, රංගන

[1] ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. leeshanshaveen@gmail.com

# ශ්‍රී ලංකාව තුළ 3-ඩී තාක්‍ෂණය සහිත චිත්‍රපට නිර්මාණ සිදු කිරීමේ දී පැන නගින අභියෝග සහ ගැටලු (ගජමෑන් චිත්‍රපටයට විශේෂිතව)

*ඊ.එම්. සුපිපි විහගිකා කාවින්දි දිසානායක* [1]

ලෝකයේ බහුලව භාවිත කළ ද ලංකාව තුළ ඉතා සීමිත වශයෙන් භාවිත වන තාක්ෂණික ක්‍රමයක් ලෙස ත්‍රිමාණ සජීවීකරණ තාක්ෂණය හඳුනා ගත හැකි ය. සම්පූර්ණ වශයෙන් ත්‍රිමාණ සජීවීකරණ තාක්ෂණය යොදාගනිමින් ලංකාවේ නිර්මාණය කළ ප්‍රථම චිත්‍රපටය වන්නේ පුවත්පත තුළින් පාඨක ආකර්ෂණයට පාත්‍ර වූ ප්‍රකාශනාත්මක චරිතයක් ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද ගජමෑන් චිත්‍රපටයයි. මෙම චිත්‍රපටය නිර්මාණයේ දී නව තාක්ෂණික ක්‍රමයක් වූ ත්‍රිමාණ සජීවීකරණ තාක්ෂණය භාවිත කිරීම තුළ විවිධ ගැටලු සහ අභියෝග පැන නැගී ඇත. ඒ අනුව පර්යේෂණ ගැටලුව වශයෙන් ශ්‍රී ලංකාව තුළ ත්‍රිමාණ සජීවීකරණ තාක්‍ෂණය සහිත චිත්‍රපට නිර්මාණ සිදු කිරීමේ දී පැන නගින අභියෝග සහ ගැටලු මොනවාද යන්න මෙහි විමර්ශනය කර ඇත. පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ වශයෙන් ශ්‍රී ලංකාව තුළ ත්‍රිමාණ සජීවීකරණ තාක්ෂණය සහිත චිත්‍රපට නිර්මාණ සිදු කිරීමේ දී පැන නගින අභියෝග සහ ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම සිදුවිය. පර්යේෂණය සඳහා දත්ත රැස්කර ගැනීමට පරමාර්ථගත නියැදුම් ක්‍රමය යටතේ ලංකාවේ චිත්‍රපට අතර වර්තමානයේ ජනප්‍රිය වූ ප්‍රථම ත්‍රිමාණ සජීවීකරණ චිත්‍රපටය වන ගජමෑන් චිත්‍රපටය නියැදිය ලෙස තෝරා ගෙන ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ දීර්ඝ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් ගජමෑන් චිත්‍රපටයේ ප්‍රධාන භූමිකා දැරූ පුද්ගලයින් හත් දෙනෙකු යටතේ අවශ්‍ය දත්ත රැස් කර ගන්නා ලදී. එම දත්ත භාවිතයෙන් පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. ඒ අනුව මෙහි පර්යේෂණ සොයාගැනීම් වූයේ ගජමෑන් චිත්‍රපටය නිර්මාණය කිරීමේදී තාක්‍ෂණික ගැටලු සහ සංස්කරණ ගැටලු ඇතිවීම, චරිත නිරූපණය සහ ඒ සඳහා ප්‍රමාණවත් රංග වස්ත්‍ර නොමැති වීම යි. එමෙන්ම නව චිත්‍රපට කණ්ඩායමක් සහ චලන ග්‍රහණ තාක්‍ෂණය භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමැති මානව සබඳතාවල හිඟකම නිසා ඔවුන් විසින් ම සතතාභ්‍යාසයේ යෙදෙමින් අවශ්‍ය අත්දැකීම් ලබා ගැනීමත් සිදු විය. චිත්‍රපටය සංස්කරණයේ දී 3D Rendering සඳහා වැඩි කාලයක් වැය වන නිසා අවශ්‍ය පරිදි ප්‍රමාණාත්මක සංස්කරණ උපකරණ භාවිත කිරීමටත් සිදු වීම වැනි අභියෝග සහ ගැටලුකාරී තත්ත්වයන් ඇති වූ බවයි. එහිදී අවසාන පර්යේෂණ නිගමනය ලෙස ලංකාව තුළ ත්‍රිමාණ සජීවීකරණ චිත්‍රපට නිර්මාණ සිදු කිරීමේදී විවිධ අභියෝග සහ ගැටලුකාරී තත්ත්වයන් ඇතිවිය හැකි බව සනාථ වූ අතර එම නිසා පූර්ව සූදානමක් සහිතව චිත්‍රපට නිර්මාණ කාර්යය සඳහා සම්බන්ධ වීම වැදගත් බව තහවුරු විය.

***මුඛ්‍ය පද:*** ත්‍රිමාණ, Motion Capture තාක්‍ෂණය, ගජමෑන් චිත්‍රපටය

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. kavindiems@gmail.com

# ලිංගාශ්‍රිත රෝග පිළිබඳව දැනුවත් බව ලබා දීම සඳහා යොදා ගනු ලබන සෞඛ්‍ය සන්නිවේදන ක්‍රමවල උපයෝගීතාව (කුරුණෑගල දිස්ත්‍රික්කයට විශේෂිතව)

එච්.එල්.එස්.බී හේරත් [1]

මිනිසාට වැළඳෙන බෝවෙන හා බෝ නොවන රෝග යන කාණ්ඩ ද්විත්වයෙන් බෝවන රෝග අතර ප්‍රබලතම රෝග විශේෂයක් වශයෙන් ලිංගාශ්‍රිත රෝග හඳුනාගත හැකි ය. අනෙකුත් රෝගවලට සාපේක්ෂව මෙම රෝග වැළඳීමේ වැඩි අවධානමක් පවතිනුයේ ඒ පිළිබඳව නිසි දැනුවත් භාවයක් නොමැති වීම පදනම් කරගෙන ය. ශ්‍රී ලාංකේය සංස්කෘතිය ලිංගික අධ්‍යාපනයට ඉහළින් ඉස්මතු වූ ඇතැම් අවස්ථා හේතු කොටගෙන විධිමත් අධ්‍යාපනය තුළ දී ත් අවිධිමත් අධ්‍යාපනය තුළ දී ත් දරුවාට ඒ පිළිබඳව ලැබිය යුතු දැනුම ගිලිහී ඇත. ලිංගිකත්වය පිළිබඳව කුතුහලයෙන් පසුවන නව යොවුන් දරුවන් ඉන් අනතුරුව ස්වයං අධ්‍යනයන්ටත්, ද්විතියික සමාජානුයෝජන කාරකයක් වන සම වයස් මිතුරන් ආශයුයෙනුත් මේ පිළිබඳව විවිධ අත්දැකීම් සහ අත්හදා බැලීම්වලට යොමු වීමේ දී ඔවුන්ගේ සෞඛ්‍ය සන්නිවේදනයන් හි පවත්නා දුර්වලතාව හේතු කොටගෙන නොයෙකුත් රෝගකාරකයන්ට ගොදුරු වනු ඇත. මේ හේතුවෙන් එය වළක්වා ගැනීමේ ප්‍රමුඛතම පියවරක් වසයෙන් සමාජයේ විවිධ මට්ටමෙන් දැනුවත් භාවයට පත් කිරීම වැදගත් වේ. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ භාවිත කරන ලද සෞඛ්‍ය සන්නිවේදන ක්‍රම ලිංගාශ්‍රිත රෝග ව්‍යාප්තිය අවම කිරීමට ඵලදායී වී තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව වේ. එම සෞඛ්‍ය සන්නිවේදන උපක්‍රම භාවිතය ඔස්සේ අධ්‍යතනය වන විට ලිංගාශ්‍රිත රෝග ව්‍යාප්තියේ පසු බැසීමක් පවතී ද යන්නත්, එම උපක්‍රම සාර්ථක වී ඇතිද යන්නත් මෙහි දී අධ්‍යයනය කරනු ලබ යි. කුරුණෑගල දිස්ත්‍රික්කය අධ්‍යයන ප්‍රදේශය වේ. කරුණෑගල ශික්ෂණ රෝහලේ "ලිංගාශ්‍රිත රෝග ඒකකය හා සායනය" (සහන් පියස) මගින් දත්ත රැස් කරගත් ගත් අතර ගුණාත්මක අධ්‍යයනය ප්‍රවේශයකින් අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයනයේ දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය ඔස්සේ දත්ත රැස් කරගනු ලැබිණ. නිරීක්ෂණ සියල්ල ක්ෂේත්‍ර සටහන් ලෙස පවත්වාගෙන ගිය අතර සම්මුඛ සාකච්ඡා පිටපත් කරන ලදී. පසු ව එම සියල්ල තේමාත්මක ව විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව ලිංගාශ්‍රිත රෝගවල ව්‍යාප්තියේ වර්ධනයක් පෙර වසරවලට වඩා හඳුනාගත හැකි විය. විශේෂයෙන් ම පුරුෂයින් පුරුෂයින් අතර පවත්නා සමලිංගික සබඳතා හේතුවෙන් ලිංගාශ්‍රිත රෝග පැතිරීම වර්ධනය වී ඇත. ඒවා පාලනය සඳහා යොදාගනු ලබන උපක්‍රම මඟින් ඒවායේ පාලනයක් සිදු වී ඇති බව හඳුනාගත හැකි විය. සාම්ප්‍රදායික දැනුවත් කිරීමේ ක්‍රමවලට අමතරව ඔවුන් සතුව පවත්නා නවීන දැනුවත් කිරීමේ ක්‍රම ලෙස සමාජ මාධ්‍ය ඔස්සේ උපාය දූතයන් යෙදවීම, නිල වෙබ් අඩවිය හරහා පෞද්ගලිකත්වය සුරකිමින් උපකාර කිරීම, නාට්‍යානුසාරයෙන් දැනුවත් කිරීම් පැවැත්වීම වැනි ක්‍රමෝපායන් පවතින බව තහවුරු කර ගැනීමට හැකි විය.

***ප්‍රමුඛ පද:*** ලිංගාශ්‍රිත, සෞඛ්‍ය, සන්නිවේදනය, උපයෝගීතාව, වැළකීම

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh1819121@ssh.rjt.ac.lk

# ටික් ටොක් සමාජ මාධ්‍ය තාරුණ්‍යයේ පුද්ගල සබඳතා කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*එච්.පී. මධූෂා දිල්ෂානි [1], එච්.එම්. ගායනා නිර්මාණි හේරත් [2], අසිත මල්ලවච්චි [3]*

සන්නිවේදනය යනු ක්‍රියාවලියකි. සන්නිවේදනයේ අවශ්‍යතාව සමාජයේ පැවැත්ම සඳහා කෙතරම් බලපාන්නේ ද යන්න විවිධ විද්වතුන් විසින් පර්යේෂණ සිදු කොට ඇත. එහෙයින් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ අවශ්‍යතාව තීව්‍ර ලෙස පවතින යුගයක එහි අවශ්‍යතාව පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කළ අතර ඒ සම්බන්ධ විද්වතුන් දෙදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන් ම ද්විතීයික මූලාශ්‍රය වසයෙන් සන්නිවේදනය හා සමාජය, මාධ්‍යයේ ප්‍රවණතා, නූතන සමාජය සම්බන්ධ ග්‍රන්ථ ද, තෘතීයික මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ආදිය ද පරිශීලනය කිරීම මගින් දත්ත ඒකරාශී කර ගැනීම සිදු විය. මෙසේ ගොනු කරගත් දත්ත ආශ්‍රයෙන් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ දැඩි අවශ්‍යතාව ඇති බව අනාවරණය විය. සන්නිවේදනය හා සමාජය අතර පවතින්නේ අවියෝජනීය වූ සම්බන්ධතාවකි. එනම් එම සම්බන්ධතාව වෙන් කළ නොහැකි ය. එසේ ම මෙම සම්බන්ධතාව ප්‍රබල වේ. සමාජයේ පැවැත්මට මෙන් ම බිඳ වැටීමට ද මෙය හේතු වේ. පුද්ගලයන් අතර පවතින සම්බන්ධතාව වර්ධනය වීමට ශක්තිමත් සන්නිවේදනයක් අවශ්‍ය වේ. මිනිසාට ඇති ප්‍රධාන අවශ්‍යතාවන් ලෙස ආහාරපාන, සනීපාරක්ෂණය, වාසස්ථාන ආදියට අමතර ව අනෙකුත් සියලු කටයුතු කරගැනීම සඳහා සන්නිවේදනය අවශ්‍ය වේ. සමාජයක් පැවැත්මට මෙන් ම එහි ක්‍රියාකාරිත්වයට සන්නිවේදනය අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසා ය. මේ අනුව බලන කළ සමාජයේ පැවැත්මට සන්නිවේදනය පැවතීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුනාගත හැකි ය. වත්මනේ නව තාක්ෂණය සමඟ හුදකලා වී ඇති මිනිස් සමූහයා සමාජයෙන් වෙන් වී සිටිනු දැකගත හැකි ය. ඔවුන් නිසි පරිදි සමාජානුයෝජනය වන්නේ ද නැත. සන්නිවේදනය නොමැති ව සමාජයේ පැවැත්ම තහවුරු කරගත නොහැකි මෙන් ම සන්නිවේදනයේ පැවැත්මට ද සමාජයක් අවශ්‍ය වේ. අවශ්‍යතාව අනුව යෝග්‍ය ම සන්නිවේදන ක්‍රමය උපයෝගී කරගැනීම මගින් නිවැරදි ප්‍රතිඵල ළඟා කරගත හැකි බව ද හඳුනාගත හැකි ය. ඒ අනුව සන්නිවේදන කුසලතා වර්ධනය, මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී මාධ්‍ය පරිහරණය, අවස්ථෝචිත භාෂා භාවිතය, මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය, මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම, තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය, මාධ්‍ය ආචාරධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය සහ යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම ආදිය සන්නිවේදනය තුළින් නූතන සමාජයක් යහපත් ලෙස ගොඩනඟා ගැනීමට අවශ්‍ය බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** සන්නිවේදනය, සමාජය, තාක්ෂණය, සමාජානුයෝජනය, අවියෝජනීය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madhushadilshani977@gmail.com
[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. gayananirmani12@gmail.com
[3] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. asithaprabhath@ssh.rjt.ac.lk

# මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ මුදල් ඉපයීම සහ බලපෑම (විශ්වවිද්‍යාල සිසුන් ඇසුරින්)

*ඩී.ජී. නිපුනි හංසිමා ගමගේ[1], අසිත මල්ලවආරච්චි [2]*

භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා ඕනෑම දෙයක් මුදල් වශයෙන් සලකනු ලබයි. මුදලේ ඉතිහාසය භාණ්ඩ හුවමාරුවෙන් ඇරඹුණක් බව හඳුනාගත හැකිය. නවීකරණය වූ ලෝකය තුළ මුදලේ නවමු මුහුණුවරක් ලෙස E-Money පත්ව තිබේ. මුල් යුගයන්හි සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිත කළ ද ඩිජිටල්කරණය වූ ලෝකයේ මිනිසුන් අන්තර්ජාලය මුදල් ඉපයීමේ මෙවලමක් බවට පත්කරගෙන තිබේ. 2000 සහ 2010 යන කාල පරාසය තුළ ඊ- වාණිජ්‍යයේ නැගීම අන්තර්ජාලය හරහා මුදල් ඉපයීමේ වැදගත් අවස්ථාවක් සනිටුහන් කරනු ලැබිණි. Facebook, Instagram සහ Pinterest වැනි සමාජ මාධ්‍ය වේදිකා ද ව්‍යාපාර සඳහා ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමටත්, නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ විකුණුම් වැඩි කිරීමට නව ක්‍රමයක් ලබාදෙමින් ඊ-වාණිජ්‍ය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ තාරුණ්‍යය නියෝජනය කරන පිරිසක් වශයෙන් විශ්වවිද්‍යාල සිසුන් මෙම මාර්ගගත ක්‍රමවේදයන් මුදල් ඉපයීමට යොදාගන්නා ආකාරය කෙබඳුද සහ එහි බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ බවට පත් වේ. අධ්‍යයනයේ ගැටලුව වන්නේ මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ මුදල් ඉපයීම සහ එහි බලපෑම කෙබඳුද? යන්නයි. අධ්‍යයනය සඳහා අහඹු නියැදිය භාවිත කර විද්‍යාර්ථීන් සියය බැගින් (n=200) කැලණිය විශ්වවිද්‍යාලය සහ රජරට විශ්වවිද්‍යාලයෙන් තෝරාගෙන ප්‍රශ්නාවලි යොමු කිරීමට පෙර ඔවුන් මාර්ගගත ක්‍රමයට මුදල් උපයන්නන් බව පූර්වයෙන් සහතික කර ප්‍රශ්නාවලිය යොමු කරන ලදි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් මේ පර්යේෂණය සිදු කළ අතර එහි දී, ප්‍රශ්නාවලි අසුරෙන් ලබා ගන්නා ලද දත්ත MS-Excel හරහා විශ්ලේෂණය කෙරුණු අතර මුදල් ඉපයීම සඳහා යොදා ගනු ලබන මාර්ගගත ක්‍රමවේදයන්, ඒවායෙහි බලපෑම, අත්දැකීම්, අදහස් යන මූලික තේමා ඔස්සේ සිදුකළ සම්මුඛ සාකච්ඡා තේමාත්මක විශ්ලේෂණය කොට නිගමනවලට එළඹෙන ලදී. මෙම පර්යේෂණය ඔස්සේ විශ්වවිද්‍යාල සිසුන් මෙම මාර්ගගත ක්‍රමවේද භාවිත කොට මුදල් ඉපයීම සඳහා යොමු වී ඇත්තේ අධ්‍යයන කාලසීමාව තුළ මුදල් අවශ්‍යතාව සහ අධ්‍යයන වැඩ කටයුතු සමඟ සමබරව කරගෙන යාමේ පහසුව නිසා බවත් මුදල් ඉපයීම සඳහා වැඩි වශයෙන් Freelancing, Content Creating සහ E-commerce වැනි පැතිකඩ වෙත වැඩි වශයෙන් යොමු වී ඇති ආකාරය මේ පර්යේෂණය හරහා හඳුනාගත හැකි විය. ඒ මෙන් ම මාර්ගගත ක්‍රමවේදය හරහා මුදල් ඉපයීමේ දී මූල්‍යමය වංචනයන්ට හසු වීම් කිහිපයක් හඳුනාගැනීමට හැකි වූ අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ කුසලතාවයන් වර්ධනය සඳහා මෙම ඩිජිටල් වේදිකා හේතු වී ඇති ආකාරය ද හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** E-money, අන්තර්ජාලය, මාර්ගගත, ශ්‍රී ලංකාව, ඊ-වාණිජ්‍ය

[1]මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
[2]මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. asithaprabhath@ssh.rjt.ac.lk

# සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් ඇතිවන සමාජයීය බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (බොරදිය පොකුණ චිත්‍රපටය ඇසුරෙන්)

*ඩී.එස්. කුමාරසිංහ* [1]

සිනමාව යනු, කලාවක් මෙන්ම කර්මාන්තයක් වන අතර ප්‍රබල සමාජ ප්‍රතිචාරයක් ගෙනහැර දැක්විය හැකි මාධ්‍යයකි. නමුත් ඇතැම් නිර්මාණ වාරණය හේතුවෙන් සමාජයට සිදුවන බලපෑම ප්‍රබල ය. සත්‍යජිත් මායිටිපේ අධ්‍යක්ෂණය කරන ලද බොරදිය පොකුණ වූ කලී කාන්තාව හා ලිංගිකත්වය තේමා කොටගත් 90 දශකය මැද භාගයේ වාරණයට ලක් වූ සමාජමය බලපෑමක් ඇති කළ නිර්මාණයකි. සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් ඇතිවන සමාජ බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මෙහි දී යොදා ගන්නා ලදී. දත්ත ලබා ගැනීම සඳහා සඟරා, ලිපි, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය වැනි ද්විතීයික මූලාශ්‍රය උපයෝගී කරගන්නා ලදී. බොරදිය පොකුණ වාරණය කිරීමට හේතු වූයේ ලිංගිකත්වය, අසභ්‍ය වචන භාවිත කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැනි කරුණු ය. මෙම නිර්මාණය සඳහා පාදක වූයේ 1977 විවෘත ආර්ථිකයත් සමඟ බියගම කටුනායක වෙළෙඳ කලාපය ආශ්‍රිත ව සේවය කළ ග්‍රාමීය කාන්තාව ලිංගිකව රැවටිලිකාරයන්ට ගොදුරු වීම හා අනිසි බලපෑමට ලක්වීම ය. නමුත් මෙම චිත්‍රපටය සමාජය තුළ වැඩි වශයෙන් කතා බහට ලක්වන්නේ වාරණයට ලක්වූ පසුව ය. වැඩිහිටියන්ට පමණක් සුදුසු නිර්මාණයක් වන මෙය වාරණයට ලක් කිරීම හේතුවෙන් කාන්තාව හා ලිංගිකත්වය යන ප්‍රධාන ගැටලු පිළිබද ප්‍රේක්ෂකයා හට ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රතිචාරයක් සමාජගත කිරීමේ ඉඩකඩ ඇහිරී ගොස් ඇත. මෙවන් සිනමා නිර්මාණ වාරණය හේතුවෙන් සිංහල සංස්කෘතිය තුළ සාකච්ඡාවට ලක්විය යුතු ලිංගිකත්වය වැනි තේමා යටපත් වීම, ප්‍රේක්ෂකයා තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමට නොහැකි වීම හා සම්මානයට පාත්‍ර විය යුතු රංගන ශිල්පීන්ගේ දක්ෂතා ඇගයීමට නොහැකි වීම වැනි සෘණාත්මක බලපෑම් රැසකට හේතු වේ. මෙම අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකි වන්නේ ලංකාවේ සිනමා නිර්මාණවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ලිහිල් වාරණයක අවශ්‍යතාව මෙන්ම ප්‍රේක්ෂකයා ආකල්පමය වසයෙන් වෙනත් දෘෂ්ටිකෝණයකින් චිත්‍රපට නැරඹීමට යොමු කිරීමට චිත්‍රපට නිෂ්පාදකයන්ට හැකි වන ලෙස නිර්මාණශීලී ව සමාජගත ගැටළු ප්‍රකාශ කිරීමට අවශ්‍ය පරිසරය සකස් කර දීමේ අවශ්‍යතාව දැඩි ලෙස පවතින බව ය.

***මූඛ්‍ය පදඃ*** සිනමාව, වාරණය, ලිංගිකත්වය, කාන්තාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය

[1]සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය. dileshakumarasingha@gmail.com

# නූතන සිනමා මාධ්‍ය තුළින් ශ්‍රී ලාංකේය ඉතිහාසය කෙරෙහි සිදුව තිබෙන බලපෑම පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් (ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ඓතිහාසික චිත්‍රපටයන් ඇසුරින්)

*ජී.ඩී.ටී. ධනංජනී රූපසිංහ [1], එච්.ජී. නෙත්සර අශේන් හේවගේ [2]*

සිනමාව රසවින්දන මාධ්‍යයක් මෙන්ම ආදායම් උත්පාදක කර්මාන්තයකි. සිංහල සිනමාව කාලානුරූපිව නව දිශානතින් ඔස්සේ ගමන් කරයි. ලාංකේය සිනමා කර්මාන්තය තුළ ඓතිහාසික සංධිස්ථානයන් ස්පර්ශ කරමින් චිත්‍රපට නිර්මාණය වීම විශේෂිත අවධානයක ලක් වී ඇත. නූතන සිනමා මාධ්‍ය තුළින් ශ්‍රී ලාංකේය ඉතිහාසය කෙරෙහි සිදුව තිබෙන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් කිරීම මෑත කාලීනව වැදගත් ය. මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ වර්ෂ 2000 සිට 2023 තෙක් කාලසීමාව තුළ නිර්මාණය වූ ඓතිහාසික චිත්‍රපට (N=20) තෝරාගත් අතර ප්‍රධාන අරමුණ වූයේ සිංහල සිනමාව ශ්‍රී ලාංකේය ඉතිහාසයට බලපාන ආකාරය අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ ගැටලුව ලෙස යොදාගෙන තිබෙන්නේ නූතන සිනමා මාධ්‍ය ශ්‍රී ලාංකේය ඉතිහාසයට කොතෙක් දුරට බලපානවාද? යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයෝගි කරගනිමින් සිදුකරන ලදි. මෙහි දත්ත රැස් කිරීමේ පළමු අධියර යටතේ යු ටියුබ් සමාජ මාධ්‍ය තුළින් චිත්‍රපට තෝරාගත් අතර ඓතිහාසික කරුණු අධ්‍යයනය කිරීමට මහාවංශය, දීපවංශය යොදාගන්නා ලදි. දෙවන අධියරයේදි අහඹු නියැදිය යටතේ ප්‍රේක්ෂකයින්, විචාරකයින්, සිනාමාව හා ඉතිහාසයට සම්බන්ධ විද්වතුන් (N=10) දෙනෙකුගෙන් සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස් කිරීම සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය කිරීමේදි තෝරාගත් චිත්‍රපට ඇසුරින් අන්තර්ගත විශ්ලෙෂණයක් ද සම්මුඛ සාකච්ඡාවල දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තේමාත්මක විශ්ලේෂණය ද යොදාගනිමින් විශ්ලේෂණය කිරීම සිදුකරන ලදි. ඒ අනුව මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේදි පර්යේෂකයාට සුවිශේෂි ප්‍රතිඵල රැසක් අනාවරණය විය. එහිදි ඓතිහාසික කතා ප්‍රවෘත්තීන් පිළිබඳ නොදන්නා ප්‍රේක්ෂකයින් මෙම චිත්‍රපටි නැරඹීම තුළින් ලාංකේය ඉතිහාසය පිළිබඳව වැරදි ආකල්පයන් ගොඩනගා ගනියි. මෙහිදි ප්‍රේක්ෂක ආකර්ශනය දිනා ගැනීමේ අරමුණින් විවිධ නිර්මාණාත්මක උපක්‍රම භාවිතය තුළින් සැබෑ ඉතිහාසය විකෘති වීමත්, නූතනය සමග ඉතිහාස කතාව ගැලපීමට ඇතැම් නිර්මාණකරුවන් උත්සහ දැරීම තුළින් අසාර්ථක වූ නිර්මාණයන් ද හඳුනාගැනීමට හැකි විය. මෙම පර්යේෂණයේදි අතිශෝක්තියෙන් ඓතිහාසික සාහිත්‍යය මූලාශ්‍රවල දක්වා ඇති ඇතැම් තොරතුරු සිනමාකරණයට ඇතුළත් කිරීමේදි වෙනස් කිරීම් සිදුකර ඇති අවස්ථාවන්ද අනාවරණය විය. මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය තුළින් අසා කියවා ඇති ශ්‍රේෂ්ඨ ඉතිහාසය ප්‍රතාපවත් බව හැල්ලුවට ලක්විය හැකි බවත් නූතන සිනමා මාධ්‍ය ලාංකේය ඉතිහාසය වාණිජ පරමාර්ථයෙන් ස්පර්ශ කිරීම තුළින් නූතන සමාජයට ප්‍රබල බලපෑමක් සිදුවන බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** සිනමාව, ඓතිහාසික, චිත්‍රපට, සාහිත්‍ය මූලාශ්‍ර, ප්‍රේක්ෂකයා, සමාජය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh1819323@ssh.rjt.ac.lk
[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh1819107@ssh.rjt.ac.lk

# දහ අට සන්නි වෙස්මුහුණු තුළින් මතුවන දෘශ්‍යරූපී සෞඛ්‍ය සන්නිවේදනාර්ථ පිළිබඳ අධ්‍යයනයක්

*ජේ.එච් ධනුෂ්ක [1]*

එදා ශ්‍රී ලාංකික සමාජයේ ජනයා ඔවුන්ගේ කායික මෙන්ම මානසිකව ඇතිවන රෝග නිවාරණය සඳහා යොදාගනු ලැබුවේ යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, ශාන්තිකර්ම වැනි සම්ප්‍රදායික වත් පිළිවෙත් ක්‍රමෝපායන් වේ. මිනිසුන් කෙරෙහි පවත්නා මානසික චිත්තවේගී බලපෑම් මෙන්ම අදිසි බලවේගයන්ගෙන් සිදුවන විවිධ අතුරු ආබාධ දුක් පීඩා හමුවේ ඔවුනොවුන්ගේ විශ්වාසය මත පදනම්ව එමගින් එකී රෝගයන් සමනය කරගන්නට ඇත. මේ අතරින් ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ ශාන්තිකර්ම, වර්තමානය වන විටද දක්නට ලැබෙන අතර එම ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් දෙවියන්, යකුන්, ග්‍රහයන් උදෙසා සිදු කරනු ලබයි. ඒ අනුව ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුට ඇතිවූ මානසික සුභ සිද්ධිය සඳහා දෙවියන්, යකුන් හා ග්‍රහයන් වෙනුවෙන් ඇතිවන බලවේග දුරුකර ගැනීමට යොදා ගන්නා සුබ කාර්යක් වේ. මෙහි දී ලාංකීය පහතරට ප්‍රදේශයන්හි පවත්වනු ලබන ශාන්තිකර්ම අතරින් සන්නියකුම හෙවත් දහඅට සන්නිය ශාන්තිකර්මය යක්ෂයන් වෙනුවෙන් පවත්වනු ලබන ශාන්තිකර්මයක් ලෙස ප්‍රධාන තැනක් ගනියි. සන්නි යකා ප්‍රමුඛ කර ගනිමින් සෙසු යකුන් කිහිප දෙනෙකු උදෙසා පවත්වනු ලබන දහ අට සන්නිය හෙවත් සන්නියකුම ශාන්තිකර්මය ප්‍රධාන ලෙසම එකල සිට වර්තමානය දක්වාම මිනිසාගේ සෞඛ්‍යයට, නිරෝගීභාවයට, මානසික සුබ සුද්දිය උදෙසා ප්‍රබල ලෙස බලපෑම් කර ඇත. ඒ අනුව දහ අට සන්නි වෙස් මුහුණු තුළින් මතුවන දෘශ්‍යරූපී සෞඛ්‍ය සන්නිවේදනාර්ථ සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ අතර එහි දී මෙම ශාන්තිකර්මය සිදු කරනු ලබන ගුරුන්නාන්සේලා මෙන්ම විශයානුබද්ධ ප්‍රාමාණිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වමින් දත්ත එක් රැස් කරන ලදී. එමෙන්ම ආයුර්වේද වෛද්‍යවරයෙකු සහ බටහිර වෛද්‍යයවරයෙකු සමගද සම්මුඛ සාකච්ඡා පවත්වමින් දත්ත එක් රැස් කර සංසන්දනාත්මකව තොරතුරු විශ්ලේෂණය කරන ලදී. දහ අට සන්නිය ශාන්තිකර්මයෙහි එන වෙස් මුහුණු, පුද්ගලයාගේ මානසික, චිකිත්සක ක්‍රියාවලියට අතිශය සමීප කරන අතර දහ අට සන්නියෙහි එන විවිධ ලෙඩ රෝග වෙස් මුහුණට ආරෝපණය කර ගනිමින් මිනිස් හැසිරීම් හැඟීම් යාවත්කාලීනව හසු කොටගෙන තිබේ. විශේෂයෙන්ම මෙම වෙස්මුහුණු එකිනෙකට වෙනස් වන අතර මුහුණ තුළින් එක් එක් රෝගයන්ට ගැළපෙන ආකාරයට විවධ සෞඛ්‍යාත්මක සන්නිවේදනයන් නිරූපනය කරනු ලබයි. එහි දී වෙස් මුහුණෙන් නිරූපනය වන්නා වූ එක් එක් රෝගයන් අදටත් මිනිසාට බලපෑම් කරන බව මෙම අධ්‍යයනය තුළින් පැහැදිළි විය. ඒ අනුව මෙම ශාන්තිකර්මය සිදු කිරීම මඟින් වෙස්මුහුණින් නිරූපිත සන්නිවේදනය ප්‍රබලවවම මිනිසාගේ මානසික සෞඛ්‍යට බලපෑම් කරනු ලැබේ. වෙස් මුහුණුවල වර්ණ හා හැඩතල තුළින් ගම්‍යමාන වන්නා වූ විවිධත්වය පුද්ගලයාගේ සිතෙහි විපර්යාසයක් ඇති කරනු ලබයි. එම විපර්යාසය පුද්ගලයාගේ මනස හා ගැටේ. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිඵල එමගින් ජනිත කරනු ලැබීය.

***ප්‍රමුඛ පද:*** ශාන්තිකර්ම, දහඅට සන්නිය, වෙස් මුහුණු, සෞඛ්‍යය සන්නිවේදනය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. dhanushkaprasanna06@gmail.com

# සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය සඳහා පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්.කේ.එම්.පී. වීරසූරිය [1]*

කිසියම් පුද්ගලයෙකු ජීවත්වන සමාජයට අනුව හැඩගැසීම සමාජානුයෝජනය ලෙස හඳුන්වයි. ඔහු හෝ ඇය ජීවත්වන සමාජ ක්‍රමයට අනුව සකස් නොවුණහොත්, එම පුද්ගලයා සමාජය විසින් ප්‍රතික්ෂේප කරන අතර, සමාජයේ කොටස්කරුවකු ලෙස පිළිනොගනී. පුද්ගලයාට තමා හඳුනාගැනීමට අවස්ථාව, සම්බන්ධතා ගොඩනගා ගැනීම, සමාජ සහභාගීත්වය ඇති කරගැනීම වැනි කරුණු රාශියක් ඍජුවම පවුල මූලික වේ. සමාජානුයෝජන කාරක අතරින් ප්‍රාථමික සමාජානුයෝජන කාරක යටතේ හඳුනාගත හැකි පවුල තුළින් සමාජයේ පැවැත්මට අවශ්‍ය දරුවකුගේ සමාජානුයෝජනය උදෙසා පවුලෙහි කාර්යභාර්ය ප්‍රබල ලෙස බලපායි. ඒවා හඳුනාගනිමින් ඒ සඳහා පවුලේ දායකත්වය කෙබඳුද යන්න දැක්වීම පර්යේෂණ ගැටලුව වේ. සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය සඳහා පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳ පෙන්වාදීම මෙම පර්යේෂණයෙහි අරමුණයි. ප්‍රස්තුත පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක දත්ත රැස්කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයික මූලාශ්‍රයන් වශයෙන් පොත්පත්, පුවත්පත්, සඟරා සහ පුස්තකාල පරිහරණය කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. එමෙන්ම අන්තර්ජාලය භාවිතය ඔස්සේ දත්ත ග්‍රහණය කරගත් අතර මෙම විෂය පිළිබඳ ප්‍රමාණික දැනුමක් ලබාගැනීම සඳහා මේවා වැඩි වශයෙන් ඉවහල් විය. මෙම පර්යේෂණයෙහි දත්ත විශ්ලේෂණයේදී පුද්ගලයෙකු සමාජානුයෝජනය වන ක්‍රම කිහිපයක් ඇති බවත්, සමාජානුයෝජනයක මූලිකම හා වැදගත්ම කොටස ප්‍රාථමික සමාජානුයෝජනය බවත්, පවුල් පරිසරය ඇසුරු කරගෙන සිදුවන සන්නිවේදනයේදී ළදරුවා මෙහෙයවීම පවුල තුළින් සිදුවන බවත්, ජීව විද්‍යාත්මක මිනිසා සමාජීය මිනිසකු බවට පත්කරන මුල් අඩිතාලම දමන්නේ පවුල නම්වන සමාජානුයොජන කාරකය මඟින් බවත් අනාවරණය විය. ඒ අනුව ආගමික, අධ්‍යාපනය, ආර්ථිකය, පෞරුෂ සංවර්ධනය, ලිංගිකත්වය පිළිබඳ හඳුන්වාදීම, විනෝදය සහ විවේකය අර්ථවත්ව ගත කිරීමට දරුවාට අවස්ථාව ලබා දීම, මත්ද්‍රව්‍යවලින් වළකාගැනීම, ජීව විද්‍යාත්මක ප්‍රජනන කාර්යභාර්ය ආදි සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය කෙරෙහි පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය සුළුපටු නොවන බව මෙම පර්යේෂණයෙන් නිගමනය වේ.

***ප්‍රමුඛ පදඃ*** අධ්‍යාපනය, පවුල, ලිංගිකත්වය, සමාජය, සමාජානුයෝජනය

[1] භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh2020497@ssh.rjt.ac.lk

# ලිංගික හිංසනය තුරන් කිරීමට ශ්‍රී ලාංකේය තරුණියන් සවිබල ගැන්වීම සඳහා ඵලදායී සන්නිවේදන මෙවලමක් ලෙස ප්‍රජාරංගය (Ethnodrama) භාවිතයට ගැනීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්.

*ඒ.එම්.ඩී.එස්. අලහකෝන්* [1]

පුද්ගලයෙකුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව හෝ ලිංගිකත්වය මත පදනම්ව ශාරීරික,මානසික හෝ වෙනත් හානියක් හෝ කරදරයක් ඇති කරන ඕනෑම ක්‍රියාවක් ලිංගික හිංසනය වේ. රැකියා ස්ථානයේදී, සමාජයේදී, පොදු ප්‍රවාහනයේදී, සයිබර් අවකාශයේදී ලාංකේය තරුණියන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ලිංගික හිංසනයන්ට ලක් වේ. මෙකී ලිංගික හිංසනය පිළිබඳව අවධානම හෝ තර්ජනය සියලු කාන්තාවන්ට ජීවත්වීමේ නිදහස හා ආර්ථික අවස්ථාවන් සීමා කරයි. මේ පිළිබඳව කාන්තාවන් තුළ පවතින බිය ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරකම් කෙරෙහි මෙන්ම ශාරීරික හා මානසික සෞඛ්‍ය කෙරෙහිද ප්‍රබලවම බලපානු ලබයි. මේ හේතුවෙන් ලිංගික හිංසනයට එරෙහි වීමට ඔවුන් සවිබල ගැන්වීම සඳහා සන්නිවේදන මෙවලමක් ලෙස ප්‍රජාරංගය භාවිතයට ගැනීම කෙතරම් ඵලදායී ද යන්න අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. ලිංගික හිංසනය තුරන් කිරීම සඳහා ඵලදායී සන්නිවේදන මෙවලමක් ලෙස ප්‍රජාරංගය යොදාගත හැකිද යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. සාහිත්‍ය විමර්ෂණය හා විශ්වවිද්‍යාල තරුණියන්ගේ ලිංගික හිංසනමය අත්දැකීම් ඇසුරෙන් නිර්මාණය කරනු ලැබූ ප්‍රජාරංගය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇති පීඨ හතරෙහි අධ්‍යයන කටයුතුවල නිරත ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත රඟ දක්වා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කෙරිණි. සහභාගිත්ව නිරීක්ෂණය හා ප්‍රජාරංගය නැරඹූ තරුණියන් 10 දෙනෙකු සමඟ සිදු කරන ගැඹුරු සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරනු ලැබූ අතර දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගනු ලැබුවේ තේමාත්මක විශ්ලේෂණයයි. කේතකරණය හරහා පළමුව දත්ත වර්ගීකරණයට ලක් කරන ලද අතර පසුව එම වර්ගීකරණයන්ට අදාළ තේමා හඳුනාගන්නා ලදී. හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස සහකම්පනීය දැනුවත් බව, ඉගෙනුම සහ අවබෝධය, අභිප්‍රේරණය, සවිබල ගැන්වීම යනාදිය දැක්විය හැකිය. ප්‍රජාරංගය ශ්‍රී ලංකාව තුළ ලිංගික හිංසනය වැනි අති සංවේදී කරුණක් සන්නිවේදනය කිරීමට යොදා ගත හැකි නව්‍යතම මෙවලමක් ලෙස හඳුන්වාදිය හැකිය. ලිංගික හිංසනය හේතුවෙන් පීඩාවට ලක් ව සිටී මෙන්ම පීඩාවට ලක් වන තරුණියන් ඉන් මුදවා ගැනීමටත්,අවස්ථාවන්ට මුහුණ දීමට අවශ්‍ය සවිබල ගැන්වීම සිදු කිරීමටත් ප්‍රජාරංගය යොදාගත හැකිය. එය ඔවුනගේ කායික මෙන්ම මානසික යහ පැවැත්ම යථා තත්ත්වයට පත් කරමින් සාමාන්‍ය ජීවන රටාවට ඔවුන් නැවත හුරු කිරීමට අවශ්‍යය පෙළඹවීම සිදු කරනු ලබයි. එමෙන්ම මෙකී නව්‍ය හඳුන්වාදීම මේ වන විට ලංකාවේ ක්‍රියාත්මක වන ලිංගික හිංසනයන්ට එරෙහිව කටයුතු කරන ආයතන සඳහා නව ඉගැනුම් මෙවලමක් ලෙස භාවිත කළ හැකිය. ඒ හරහා ලිංගික හිංසනයට ලක් වීම නිසා කාන්තාවන් තුළ ගොඩනැගුණු යැපුම් මානසිකත්වය බිඳ දමා රටේ ආර්ථික, සමාජීය හා දේශපාලනික සංවර්ධනය උදෙසා දායක වන නිදහස් පුරවැසියන් බවට ඔවුන්ව පත් කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** ප්‍රජාරංගය, ලිංගික හිංසනය, සන්නිවේදනය, සවිබල ගැන්වීම

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
alahakoonsaumya@gmail.com

# ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිවිරෝධී චර්යා ඉගැන්වීමට භූමිකා රංගය භාවිතයට ගැනීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්.

*ඒ.එම්.ඩී.එස්. අලහකෝන්* [1]

ඵලදායී ඉගෙනුමක් සඳහා නිරීක්ෂණය කර ගබඩා කර ගත් දැනුම සංකේතාත්මක චර්යාවක් බවට පරිවර්තනය කරමින් එම චර්යාව නැවත නැවත පුහුණු කල යුතුය. භූමිකා රංගය හරහා අදාළ දැනුම නාට්‍යමය යථාර්ථයක් තුළ අත්දැකීමට, අත්හදා බැලීමට හා පුහුණු කිරීමට අවකාශය සැලසේ. එමගින් පුද්ගල චිත්තවේග ප්‍රකාශ කිරීමට සහ නිවැරදි ප්‍රතිචාර සන්නිවේදනය කිරීමට ලැබෙන පුහුණුව හරහා පුද්ගල සංජානනය මෙන් ම චර්යාවද වෙනස් කළ හැකිය. ලිංගික හිංසනයට ලක් වීම තුළ දරුවන්ගේ මානසික යහ පැවැත්ම බිඳ වැටෙමින් අධ්‍යාපනික දුර්වලතාවයන්, චිත්තවේගී ගැටලු, සමාජ භීතිකාවන්, අන්තර් පුද්ගල සබඳතා තුළ ගැටලු, සියදිවි නසා ගැනීම්වලට යොමු වීම යනාදී ගැටලු රාශියක් සමාජය තුළ දැකිය හැක. එබැවින් ලිංගික හිංසනයට එරෙහිව දරුවන් සවිබල ගැන්වීම සඳහා ප්‍රතිවිරෝධි චර්යා ඉගැන්වීමට භූමිකා රංගය ඵලදායීද යන්න ගවේශණය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. මේ සඳහා රංග චිකිත්සක පර්යේෂණ  ආයතනය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල ඉගනුම ලබන කණිෂ්ඨ අංශයේ සිසුන් 15 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය සිදු කෙරුණි. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණය තෝරාගත් අතර දත්ත රැස් කිරීම සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය හරහා සිදු කෙරුණි. කේතකරණය හරහා පළමුව දත්ත වර්ගීකරණයට ලක් කරන ලද අතර පසුව එම වර්ගීකරණයන්ට අදාළ තේමා හඳුනාගන්නා ලදී. හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස ගවේෂණය, නිර්මාණශීලිත්වය, පුහුණුව සහ අභිප්‍රේරණය දැක්විය හැකිය. ගවේෂණය යටතේ ලිංගික හිංසනය තමන්ට බලපාන ආකාරය, ප්‍රතිවිරෝධි චර්යා ඉගෙනුම, කණ්ඩායම් අත්දැකීම් තුළින් ලද දැනුවත් බව දැක්විය හැකිය. නිර්මාණශීලිත්වය යටතේ ගැටලු විසඳාගන්නා නව ක්‍රම සෙවීම, විවිධ සංජානනයන්ගෙන් ලබන නව අවබෝධයන්ට විවෘත වීම, විචාරශීලි සිතීම දියුණු වීම යනාදිය දැක්විය හැකිය. පුහුණුව යටතේ මුහුණේ ඉරියව් සහ ශරීර භාෂාව ඉගෙනුම, සිදුවීම් තුළදි සිහිය පවත්වා ගැනීමට පුහුණුව, චිත්තවේගී සමබරතාව පවත්වා ගැනීමට ලද පුහුණුව, කණ්ඩායම් ඉගෙනුම තුළ ලද දැනුම ප්‍රායෝගිකව අත් හදා බැලීමත් සහ අභිප්‍රේරණය යටතේ නිවැරැදි ප්‍රතිචාර දැක්වීමට පුහුණුවීම තුළින් ආත්ම විශ්වාසය ගොඩ නැගීම, ප්‍රතිවිරෝධි චර්යා ඉගෙනුම තුළින් අභිප්‍රේරණය වීම, සමාජ සහයෝගිතාව පිළිබඳ ඇති දැනුවත්බව වැඩි වීම යනාදිය දැක්විය හැකිය. භූමිකා රංගය හරහා දරුවන්ට යථාර්ථය මගහැරීම වෙනුවට යථාර්ථයට මුහුණ දීමට සහ ඒ සමඟ ගනුදෙනු කිරීමට අවකාශය සහ පුහුණුව ලබා දේ. එමගින් පුද්ගල දැනුම, ආකල්ප සහ හැසිරීම් වෙනස් කර ගැනීමටත් නව ශක්‍යතාවයන්ගෙන් පෝෂණය වීමටත් නාට්‍යමය යථාර්ථයක් තුළ ලද ඉගෙනුම ශරීරගත අත්දැකීමක් බවට පත්කර ගැනීමටත් හැකි වේ. එබැවින් හුදු සංකල්ප ඉගෙනුමකට වඩා දැනුම අත්දැකීමක් බවට පරිවර්තනය කරනු ලබන ඉගෙනුමක් සඳහා භූමිකා රංගය වඩාත් උචිත වූත් යෝග්‍ය වූත් ක්‍රමෝපායකි.

***ප්‍රමුඛ පදඃ*** ඉගෙනුම, පාසල් ළමුන්, ප්‍රතිවිරෝධී චර්යා, භූමිකා රංගය, ලිංගික හිංසනය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. alahakoonsaumya@gmail.com

# රූපවාහිනි ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර විවිධත්වය (තෝරාගත් රූපවාහිනී නාලිකා දෙකක් ඇසුරින්)

*වී.පී.කේ. මදූෂාන් [1], අසිත මල්ලවආරච්චි [2]*

මිනිසා තම හැඟීම් හා අවශ්‍යතාවයන් ප්‍රකාශ කිරීම උදෙසා විවිධ සන්නිවේදන ක්‍රමෝපායන් භාවිත කර ඇත. ඒ අතරින් විද්‍යුත් මාධ්‍යට අයත් රූපවාහිනී මාධ්‍ය යනු විශාල ප්‍රේක්ෂක පිරිසකට දෘශ්‍ය හා ශ්‍රව්‍ය අන්තර්ගතය සම්ප්‍රේෂණය කරන බහුලව භාවිත වන සන්නිවේදන මාධ්‍යකි. ඒ අනුව ප්‍රධාන රූපවාහිනී නාලිකාවන් කිහිපයක් ඇසුරෙන් රූපවාහිනී ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර නාලිකාවන් නාලිකාවට වෙනස් වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙහි අධ්‍යයන සීමාව වශයෙන් ශ්‍රී ලංකාවේ විකාශය වන ප්‍රධාන රූපවාහිනී නාලිකා දෙකක් තෝරා ගන්නා ලදී. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ තෝරාගත් රූපවාහිනී නාලිකා දෙකෙහි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන් සති දෙකක කාලයක් අධ්‍යයනය කළ අතර තෝරාගත් ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරුන් පස්දෙනෙකු සමඟ දුරකතන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ප්‍රවෘත්ති විකාශයන්වල හා දුරකතන සම්මුඛ සාකච්ඡාවල දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කරන ලද අතර එහිදි ප්‍රධාන තේමා හයක් හා උප තේමා දහඅටක් හඳුනාගතහැකි විය. එම දත්ත විශ්ලේෂණයට අනුව න්‍යායපත්‍ර තුළ දක්නට ලැබෙන සිරස්තලයන්හි සමාජීය, විදේශීය හා ක්‍රීඩා තේමා තුල ඇති සිරස්තල ඇතැම් විට සමාන වුවත් දේශපාලන, ආර්ථික, ආගමික හා අධ්‍යාපන තේමා තුල ඇති සිරස්තල අසමාන වන අවස්ථා ඇත. තවද සම්මුඛ සාකච්ඡා දත්ත විශ්ලේෂණයට අනුව නාලිකාවන්ට ආවේණික වැඩසටහන් ප්‍රවෘත්ති න්‍යාය පත්‍රයේ අන්තර්ගත කර තිබෙන ආකාරයක්, ජනතා ආකර්ෂණය උදෙසා න්‍යාය පත්‍ර වෙනස් කර ඇති ආකාරයක්, රූපවාහිනී ආයතනවලට තොරතුරු ලැබෙන ආකාරය අනුව න්‍යාය පත්‍ර වෙනස් කර ඇති ආකාරයක් හඳුනාගත හැකි විය. එසේම ප්‍රධාන රූපවාහිනී නාලිකා තම නාලිකාවට ආවේණික ලෙස ප්‍රවෘත්ති තෝරාගැනීම එම ආයතනයේ ප්‍රතිපත්තිමය තීරණයක් වන අතර රූපවාහිනී ප්‍රවෘත්ති නාළිකාවලින් ලබාදෙන ප්‍රවෘත්තිවල කාලීන වටිනාකම එම ප්‍රතිපත්තිමය තීරණ මත නාළිකාවෙන් නාළිකාවට වෙනස් වේ. එසේම සම්මුඛ සාකච්ඡා දත්ත විශ්ලේෂණයේදී රූපවාහිනී නාලිකා තුළ ක්‍රියාත්මක ප්‍රවෘත්ති තුළින් මහජනයාට විවිධාකාරයේ බලපෑම් (උදා - ආකර්ෂණය, තෝරාගැනීම්) ඇති කරන ආකාරයක් ඇති කරන අතර ඒ හරහා රූපවාහිනි ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර නාළිකාවෙන් නාලිකාවට වෙනස් වන බව මෙහිදී හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** රූපවාහිනි, ප්‍රවෘත්ති, න්‍යාය පත්‍ර, නාලිකාව, වෙනස් වීම

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. kavindamadushan621@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. asithaprabhath@ssh.rjt.ac.lk

# Economics, Entrepreneurship & Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# වර්තමාන ආර්ථික පසුබිම හමුවේ කුඩා පරිමාණ කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම වෙනස් වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එච්.ආර්. මධුරංග [1], ආර්.එම්. දිනෙල්කා හරින්දි රත්නායක [2]*

ඕනෑම සමාජයක මිනිසුන් සිය මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමෙන් පසුව ද්විතීයික තෘතීයික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කරනු ලබයි. එය ඒබ්‍රහම් මාස්ලෝගෙ අවශ්‍යතා ධූරාවලී න්‍යාය තුළ විද්‍යාමාන වේ. නමුත් ආර්ථික අර්බුදයන් යටතේ මෙම තත්වයන් වෙනස් වේ. ඒ අනුව වර්තමාන ආර්ථික පසුබිම හමුවේ කුඩා පරිමාණ කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම කෙබඳු ද? යන්න අධ්‍යනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව විය. පරය්ේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කර අතර පර්යේෂණය සඳහා අධ්‍යයන සීමාව ලෙස දකුණු පළාතේ, මාතර කඩවස්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 416-ක කොටුව වසම යොදාගත්තේය. එහිදී සරල අහඹු නියැදි ක්‍රමය ඔස්සේ පවුල් 40ක් නියැදිය ලෙස යොදා ගත් අතර, දත්ත රැස් කිරීමේදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිත කෙරුණි. සාහිත්‍යය පසුබිම විමර්ශනය කිරීමේදී න්‍යාය හා පූර්ව අධ්‍යයන කෙරෙහි අවධානය යොමු කරන ලදී. පර්යේෂණය තුළින් අනාවරණය වූ මූලික කාරණය ලෙස ආර්ථික අර්බුදය හමුවේ කුඩා කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම ආර්ථිකමය වශයෙන් හැකිලීමකට පත්ව ඇති බවයි. අර්බුදයේ බලපෑම හමුවේ නියැදියෙහි සියලුම පවුල් ආහාර රටාවේ සිට ද්විතීයික තෘතීයික අවශ්‍යතාවයන් කළමනාකරණය කරන බවත්, සමාජමය වශයෙන් සංස්කෘතිකමය හා සෞඛ්‍යමය වෙනස්කම් ද පෙන්වන බවත් අනාවරණය විය. අවසාන වශයෙන් අපගේ නිගමනය වන්නේ පාරිභෝගිකයින් තම දෛනික ජීවිතය පවත්වාගත නොහැකි තරම් අගාධයට පත්ව ඇති බවත් ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියේ දෙවන තෙවන අවශ්‍යතාවයන් සංතෘප්ත කර ගැනීම මුළුමනින්ම අත්හිටුවා ඇති බවත් කළමනාකරණ සමාජ වෙනස්කම් හමුවේ පරිභෝගික හැසිරීම වෙනස් කර ඇති බවත්ය.ඒ අනුව මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ ආර්ථික අර්බුදයේ බලපෑම හෙළිදරව් කිරීමෙන්, කුඩා පරිමාණ කඩ හිමියන්ට සහ පාරිභෝගිකයින්ට උපකාරී වන නව සමාජ සහ ආර්ථික සහාය ක්‍රම ප්‍රවර්ධනය කිරීම මගින් පාරිභෝගික හැසිරීමේ වෙනස්කම් සහ අර්බුදය හමුවේ උවමනාවන් සපුරා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ මෙහිදී  නිර්දේශ කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** ආර්ථික, අර්බුදය, ද්විතීයික, තෘතීයික, පාරිභෝගික

[1] ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. randikamadhuranga42@gmail.com
[2] ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. dinelkaharindi@gmail.com

# RURAL POVERTY AND SMALL-SCALE GEM MINING (SPECIAL REFERENCE TO HOPITIGALA VILLAGE, IN RATNAPURA DISTRICT)

*B.L.C.R. Maduwanthi* [1]

An increase in the poverty rate has a direct impact on the economic growth and development of a country. According to World Bank Report Sri Lanka's poverty is projected to increase to 27.9 percent in 2023 from 25 percent in 2022. Sri Lanka's gem industry can be introduced as one of the strategies that can be used to reduce poverty in the rural sector. Among them, attention should be paid to the small- scale gem industry. When considering the small- scale gem industry, it can be divided into two parts as small- scale gem trading and small- scale gem mining. It is the workers who are engaged in small- scale mining rather than the traders who sell gems on a small-scale who are most affected by poverty. Gems are a popular mineral resource all over the world and are also widely distributed in Sri Lanka. Sri Lanka has a long history of gemstones, and the gems of Ratnapura are famous all over the world. Accordingly, the research problem of this thesis is to study whether rural poverty can be reduced by developing small- scale gem mining industry. Accordingly, to find solutions to this problem, research has been done based on three objectives. That is to identify the causes of rural poverty in Sri Lanka and research study area (reasons), to identify whether rural poverty can be reduced through the small- scale gem mining industry (impact), and to identify what remedies can be applied through the small-scale gem mining industry to mitigate rural poverty (solutions). According to the research methodology, a sample of 60 people was randomly selected from Hopitigala village in Gangulwitiya Grama Niladhari Division of Elapatha Divisional Secretariat in Ratnapura district and data analysis was done under descriptive statistical and econometrics analysis (multiple regression analysis) methods. There, factors such as the education level, age, gender, nature of profession etc. have been taken into consideration. The factors and reasons that cause the poverty in Sri Lanka and gem miners in research area are lack of proper education level, less labor contribution of women compared to men, exploitation of labor in gem industry, lack of sufficient resources and capital for mining, problem of shares distribution in gem industry etc. can be pointed out. In order to reduce rural poverty, providing incentives related to the gem industry, encouraging the people in gem mining areas, expanding the gem and jewelry industry in areas that receive and do not find gems, introduce training courses to unemployment women and youth in gem and non-gem mining areas, introducing gem exhibitions and research institutes, encourage people to engage in the gem industry as self- employment, and many solutions can be taken to mitigate rural poverty and develop gem industry. The research findings are that education level has no direct relationship with gem mining, but factors such as age, gender and service time have a strong relationship with gem mining.

***Keywords:*** Rural Poverty, Small-Scale Gem Mining

[1] Department of Economics, Faculty of Social Sciences, University of Kelaniya. chalanirasanga@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියාවල නිරත වීම ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යනයක්

*ඩබ්ලිව්.එස්. ඩිලුක්ෂි [1], එච්.ඩී.පී. ප්‍රේමරත්න [2]*

වැඩ ලෝකයේ රැකියා වර්ග පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ද්විත්වයක් වන අතර එයින් අර්ධකාලීන වැඩ යනු සේවකයෙකු සාමාන්‍යයෙන් සතියකට පැය 30කට වඩා අඩු කාලයක් සේවය කරන රැකියාවකි. තරඟකාරී අධ්‍යාපන රටාව සමඟ ඇති වන මූල්‍ය අවශ්‍යතා මත අස්ථිර වැඩ කොන්දේසි, ගෙවීම්, වගකීම් හා අවම වෘත්තීය ප්‍රගතිය ආදී ලක්ෂණ සහිත අර්ධ කාලීන රැකියා සිදු කිරීමට විශ්වවිද්‍යාල සිසුන් පෙළඹී ඇත. මේ නිසා සිසුන්ගේ අධ්‍යාපන කාර්යසාධනයට එනම් ඉහළ ප්‍රතිඵල ළඟා කර ගැනීම සීමා වී ඇති බව පූර්ව නිගමන වේ. ලංකාව තුළ මේ සම්බන්ධයෙන් බොහෝ පර්යේෂණ මඟින් අවධානයට ලක් කර ඇති නමුත් එම පර්යේෂණ ලංකාවේ ආර්ථික අර්බුධයට පෙර කාලයට සීමා වී ඇත. ඒ අනුව පර්යේෂණ හිඩැස සලකා බලමින් ආර්ථික අර්බුදය සමඟ විශ්වවිද්‍යාලයෙන් පිටත පමණක් නොව විශ්වවිද්‍යාලය තුළ සිසුන් සඳහා අර්ධ කාලීන රැකියාවල නිරත වීමේ අවස්ථා වර්ධනය කර ඇති සමයක සිසුන්ගේ අධ්‍යාපන කාර්යසාධනයට අර්ධ කාලීන රැකියාව කුමන ආකාරයක බලපෑමක් ඇති කරනවාද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. මෙහිදී ඉලක්කගත නියැදීමේ ක්‍රමය හරහා තෝරා ගත් 120ක නියැදියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ නමය නියෝජනය කරමින් සම්බන්ධ කරගත් අතර මිශ්‍ර පර්යේෂණ ක්‍රමය යටතේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. එහිදී මාර්ගගත ආකාරයට ප්‍රශ්නාවලි හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කර ගැනීම සිදු වූ අතර විස්තරාත්මක, සහසම්බන්ධතා හා තේමාකරණය වැනි විශ්ලේෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය කිරීම සිදු විය. නියැදියට අනුව අධ්‍යාපන කාර්යසාධනයට බලපාන සාධක අතර සහසම්බන්ධතාවය අධ්‍යයනයේ දී වැඩ කරන කාලය, වැඩ ආතතිය, වැඩ ප්‍රමාණය වැනි සාධක මත සිසුන්ගේ අධ්‍යාපනයට සෘණාත්මක බලපෑම් ඇති කර ඇත. නමුත් අර්ධ කාලීන රැකියා මඟින් වෘත්තීය කුසලතා වැඩි දියුණු කර ගැනීම, කාල කළමනාකරණය හුරු වීම වැනි ධනාත්මක තත්ත්වයන් නිර්මාණය වී ඇත. මේ හේතුවෙන් නිගමනය කළ හැක්කේ අර්ධ කාලීන රැකියාව සිසුන්ගේ අධ්‍යයන කටයුතු කෙරෙහි ප්‍රබල ආකාරයක බලපෑමක් ඇති නොකරන බවයි. පවතින ආර්ථික පීඩාකාරී තත්ත්වය මත සිසුන් අර්ධ කාලීන රැකියාවේ අවශ්‍යතාවය අවධාරණය කරන නමුත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පූර්ණ කාලීන අධ්‍යාපනය අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් සිසුන්ට අධ්‍යාපනය හා රැකියාව අතර සමබරතාවයක් පවත්වා ගැනීමට හැකි ආකාරයේ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට යෝජනා කළ හැකිය.

**ප්‍රමුඛ පද** : අර්ධ කාලීන රැකියා, අධ්‍යයන කාර්ය සාධනය, විශ්වවිද්‍යාල, සිසුන්, බලපෑම

1 සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
shanikadilukshi05@gmail.com
2 සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
pri.hapuarachchi@arts.pdn.ac.lk

# AN INVESTIGATION INTO THE IMPACT OF YOUTH UNEMPLOYMENT ON POVERTY IN SRI LANKA: SPECIAL REFERENCE TO GALENBINDUNUWEWA AREA

*T.M .N. Madusani [1], A.K.M. Shivangi [2], D.M.S.W. Dissanayake [3], D.M.T.D. Wijesingha [4]*

Youth aged 15 to 24 play a vital role in economic transformation, yet high youth unemployment in Sri Lanka worsens poverty, reduces productivity, and increases social costs. Despite a 4.7% unemployment rate, skill-job mismatches limit employment opportunities. The research problem examines how youth unemployment contributes to poverty in Galenbindunuwewa, identifying socio-economic factors that exacerbate the issue. The objective is to examine the impact of youth unemployment on poverty in Galenbindunuwewa, Sri Lanka. It seeks to identify socio-economic factors such as educational attainment, skill mismatches, and limited local opportunities, and assess their role in exacerbating poverty. This study adopts a mixed-methods approach, collecting primary data from 100 households through structured questionnaires and secondary data from reports. Quantitative data were analyzed using statistics, while qualitative data underwent thematic analysis. The research found that youth unemployment in the region is driven by low educational attainment, skill mismatches, and limited local economic opportunities. These factors lead to high unemployment, reduced income, increased dependency ratios, and worsening poverty, exacerbated by a lack of vocational training aligned with market demands. The study emphasizes that limited local economic opportunities, lack of industries, and reliance on agriculture push youth to migrate, depleting the workforce. The mismatch between youth skills and job market demands perpetuates unemployment, contributing to the ongoing poverty cycle in the region. The study suggests that vocational training, improved educational infrastructure, and local economic development initiatives can reduce youth unemployment. Tailored vocational programs would equip youth with relevant skills, while local development efforts can create jobs, reduce migration, and encourage youth to stay, alleviating poverty. Based on the results, youth unemployment in Galenbindunuwewa drives poverty, worsened by factors such as inadequate education, skill mismatches, and limited local opportunities. Targeted interventions, including vocational training, education reforms, and economic development, are crucial for sustainable development.

***Keywords:*** Economic Development, Poverty, Socio-Economic Factors, Vocational Training, Youth Unemployment

[1] Department of Economics, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. ssh2020271@ssh.rjt.lk
[2] Department of Economics, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. ssh2020441@ssh.rjt.lk
[3] Department of Economics, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. ssh2020555@ssh.rjt.lk
[4] Department of Economics, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. ssh2020521@ssh.rjt.lk

# කුඹල් කර්මාන්තකරුවන් තම නිෂ්පාදන අමුද්‍රව්‍යය ලබා ගැනීමේදී සහ නිෂ්පාදන විකිණීමේදී මතුවන ගැටලු පිළිබඳ විමර්ශනයක් (හම්බන්තොට කොහොම් පෝරුව ප්‍රදේශය ඇසුරින්)

*ඒ.යූ. හෙට්ටිආරච්චි [1], එම්.ආර්.එම්. උෂාන් [2], කේ.පී.සී.ජේ. ලාලිත්‍යා [3], ඩී.එම්.ඒ.ඩී. දිසානායක [4]*

ලොව පළමුවෙන්ම මැටි බඳුන් නිෂ්පාදනය කිරීම නව ශිලා යුගයේදී ආරම්භ වන්නට ඇත. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ පටන් වසර 9000කට ඈත අතීතයකට කුඹල් කර්මාන්තය දිව යන බව විද්වතුන්ගේ අදහසයි. වර්තමානයේ මෙම කුඹල් නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයක් පවතී. එබැවින් මෙම පර්යේෂණයේ වැදගත්කම දෛනිකව වැඩිවෙමින් පවතී. මෙම පර්යේෂණය තුළින් ද කුඹල් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී මතුවන ගැටලුකාරී තත්වයන් සහ කුඹල් නිෂ්පාදනය භාණ්ඩ සඳහා එය බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව විමර්ශනය කරයි. මෙම අමුද්‍රව්‍ය ලබා ගැනීමට එල්ලවන අභියෝග නිෂ්පාදන සඳහා කුමන ආකාරයෙන් බලපානවාද? සමාජය තුළ මැටිකර්මාන්තකරුවන් සඳහා එල්ල වී පවතින තත්ත්වය සාධාරණද? මෙය පර්යේෂණයේ ප්‍රධාන ගැටලු වේ. මෙම පර්යේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් යටතේ මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ සිදු විය. අධ්‍යයන ප්‍රදේශය ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොහොම්පොරුව ප්‍රදේශයේ කුඹල් පවුල් 330 ක් යොදාගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සහ මාර්ග ගත ප්‍රශ්නාවලි තුළින් දත්ත රැස් කිරීම සිදුකල අතර රැස් කරන ලද තොරතුරු සවිස්තරාත්මක ලෙස සංඛ්‍යා විශ්ලේෂණ ක්‍රමවේදයට අනුව සිදුකරන ලදී. සම්මුඛ සාකච්ඡා මගින් ලබාගන්නා ලද තොරතුරු ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත සැලසුම්කර සංක්ෂිප්ත කර තේමාවන් ඔස්සේ ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස පවතින දර,මැටි යන අමුමුද්‍රව්‍ය ලබා ගැනීමේදී රජය විසින් මැටි කැපීමට සහ දර ලබා ගැනීමට රජය විසින් පනවා ඇති නීති රීති රෙගුලාසි ද, දර ලබාගැනීමට ප්‍රදේශයේ භූමියේ පවතින අවකාශයේ අඩුපාඩුව ද ගම්‍යමාන විය. වෙළෙඳපොළ මිල කරණය හමුවේ තම ශ්‍රමයට සරිලන විකුණුම් මිලක් නොමැති වීම ප්‍රධාන වශයෙන් හඳුනාගැනීමට හැකිවිය. ඇලුමිනියම් භාණ්ඩ ආදේශක භාණ්ඩ ලෙස පැවතීම මැටි නිශ්පාදන විකිණීමට බාධාවක් ලෙස හඳුනා ගන්නා ලදී. ශ්‍රම ගැටළු තුළදී තරුණ, තරුණියන් නාගරීකරණය වීමත් පාරම්පරික තම රැකියාවෙන් ඔබ්බට ගොස් වෙනත් රැකියාවල නිරත වීම නිසා ශ්‍රමයද ලබාගැනීමට අපහසු බව තහවුරු විය. නිෂ්පාදන අමුද්‍රව්‍යය ලබා ගැනීමේදී සහ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමේදී මතුවන ගැටලු අවම කර ගනිමින් කුඹල් නිෂ්පාදන තවදුරටත් ලංකාව තුළ ව්‍යාප්ත කිරීමට රජය විසින් නියමිත මිල ගණන්ද, වෙළඳපොළ තුළ නියමිත වූ ස්ථානයක්ද, කර්මාන්තකරුවන් හට ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සාධාරණ කොට කර ගනිමින් පර්යේෂණය නිමාව දැකගත හැකිය.

***ප්‍රමුඛ පද:*** අමුද්‍රව්‍ය, අභියෝගතා, කුඹල්, තාක්ෂණය, විකුණුම් මිල

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. uhapsara@gmail.com
[2] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ushanu450@gmail.com
[3] රුහුණ විශ්වවිද්‍යාලය. chathulalithya@gmail.com
[4] රුහුණ විශ්වවිද්‍යාලය. dulanjani2020cp@gmail.com

# USAGE OF E COMMERCE BY SMALL AND MEDIUM ENTERPRISES IN SRI LANKA

*W.W.G.D.N. Wickramasingha [1], J.H.I. Prayumal [2]*

The adoption of e-commerce by Small and Medium Enterprises (SMEs) in Sri Lanka has become an essential strategy for business growth and sustainability in an increasingly digital economy. This study examines the usage of e-commerce among SMEs in Sri Lanka, drawing upon secondary data from existing literature, industry reports, SME online business sites and feedbacks and government publications. The findings suggest that Many SMEs in Sri Lanka have successfully adapted to the use of e-commerce. It has also enabled them to connect with foreign markets. Especially women and the youth community have successfully adapted to it. E-commerce in Sri Lanka has grown significantly with the increased use of the internet and smart devices, especially during the COVID-19 pandemic. The increase has been driven by increased utilization of e-payments, e-banking, online medical consultations, and esports. The biggest hindrance to the use of this e-commerce in Sri Lanka is the lack of understanding about it. Also, obstacles arise due to the problems of technical facilities and the quality of online trading, as well as the controversial situation of consumers' trust in this system. Small and medium enterprises should implement awareness programs on this, and the need for computer literacy should be shown to the entrepreneurs, technical infrastructure should be developed through government support, in a country like Sri Lanka where there are economic problems, these SME's Processes should be arranged so that businesses can connect to the foreign sector through e-commerce and get more dollars for the country.

***Keywords:*** Awareness, Easiness of getting loan, Interest rate, Micro Finance, Micro Loans

[1] Department of Economics, Rajarata University of Sri Lanka. ssh2020513@ssh.rjt.ac.lk
[2] Department of Economics, Rajarata University of Sri Lanka. ssh2020337@ssh.rjt.ac.lk

# USAGE OF E COMMERCE BY SMALL AND MEDIUM ENTERPRISES IN SRI LANKA

*W.W.G.D.N. Wickramasingha [1], J.H.I. Prayumal [2]*

Food security has been prioritized in the domestic economic policies of many developing nations. Nations gain from having a healthy population since it immediately increases labor production and lowers spending on health-related concern. Achieving food security is essential for a healthy nation since the nutrition that people consume heavily influences how healthy the population is. Many studies have identified that women play a significant role in reducing food insecurity in their own households, hence there has been an increasing trend to focus food security policies on women's empowerment. Despite the fact that women are culturally allocated higher responsibility in practically all household tasks, including household food management, there is a dearth of research on the role of women in achieving household food security in Sri Lanka. Hence, this study aimed to analyze the women's role in household food security in rural Sri Lanka. This study is conducted using qualitative data analysis using descriptive methods. The sample for this study will include 20 families, purposively selected. This research essentially dependent on primary data. Primary data will be collected through semi - structured in - depth interviews with the selected sample. The study identified that women play a significant role in ensuring household food security in all four dimensions of food security; they contribute significantly to farming household food availability, their contribution to income plays an essential role in household food access, particularly in low-income households, and their nutritional knowledge is also important in the proper utilization of food in households. Accordingly, these findings suggest that women's contributions to food security are essential, and that policymakers should prioritize women's empowerment and education with the objective to improve food security.

***Keywords:*** Women's Role, Household, Food Security, Rural Area, Developing Nations

1 ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh2020513@ssh.rjt.ac.lk

2 ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh2020337@ssh.rjt.ac.lk

# Education
# &
# Innovation practices



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

ශ්‍රී ලංකාව විවිධ දේශගුණික කලාප වලින් සමන්විත රටක් වන අතර සර්ම කලාපීය පිහිටීම සහ භූ විෂමතාවය, එම දේශගුණික කලාපයන්ගේ ව්‍යාප්තිය තීරණය කරනු ලබයි.මෙම අධ්‍යයනයේදී සෘතුමය වෙනස්වීම් තුළින් වියළි සහ තෙත් කලාපයන්ගේ පවතින ජලාශයන්හි ජල ව්‍යාප්තිය සහ ජල කළමනාකරණය සිදු වන ආකාරය වසර 20 කාලයක සිට අධි-විභේදන චන්ද්‍රිකා ඡායාරූප උපයෝගී කරමින් NDWI අගය ගණනය කිරීම සිදු කරන ලදී.ඒ අනුව වියළි කලාපය නියෝජනය කරමින් තිසා වැව ජලාශයත්,තෙත් කලාපය නියෝජනය කරමින් කොත්මලේ ජලාශයත් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලදී.කොත්මලේ ජලාශය නිරිත දිග මෝසම් සමයේදී ජල පරිමාව කිලෝමීටර් 19.8 දක්වා ව්‍යාප්තියක් පවතින අතර NDWI අගයන් 0.25-0.30 අතර පරාසයක පවතින නමුත් සෘතුමය වර්ෂාපතනයෙන් සැලකිය යුතු ජල පරිමාවක් ජලාශය තුළ රැඳෙන බව හඳුනාගත හැකිය.මෝසම් වර්ෂාව අඩුවන විට NDWI අගයන් 0.18-0.20 පමණ දක්වා අඩු වන අතර මතුපිට ජල පරිමාව ආසන්න වශයෙන් 20% පමණ අඩු වන බව හඳුනාගත හැකිය.එසේම නියං සමය වන විට ජලාශයේ ජල ව්‍යාප්තිය කිලෝමීටර් 13.9 දක්වා 30 % පමණ ව්‍යාප්තිය අඩු වන බව හඳුනාගත හැකිය.වියළි කලාපයේ තිසා වැව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ඊසාන දිග මෝසම් කාලයේදී වැවේ ජල ප්‍රදේශය කිලෝමීටර 7.5 ක් පමණ ව්‍යාප්තියක් පවතින අතර ඒ අනුව මෙම කාලය තුළදී NDWI අගයන් 0.15 සිට 0.20 දක්වා පරාසයක පවතින අතර තීරණාත්මක සෘතුමය තත්වයන් නිරූපණය කරනු ලබයි.වියළි කාල සීමාව තුළදී NDWI අගයන් 0.10 - 0.12 දක්වා අගයක පවතී. කොත්මලේ ජලාශය ජල මට්ටම මෝසම් සමයේදී සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන අතර වියළි කලාපයේ තිසා වැව අධ්‍යයනය කිරීමේදී සුළු වශයෙන් විවිධ උච්චාවචනයන් සමග ජල මට්ටම සාපේක්ෂව ස්ථාවරව පවතින බව හඳුනාගත හැකිය.මෙම විශ්ලේෂණය තුළින් හඳුනාගත් කලාපීය සෘතුමය වෙනස්කම් ජල සම්පත් කළමණාකරනයට ඵලදායීව උපයෝගී කරගත හැකි බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** NDWI, කොත්මලේ ජලාශය, තිසා වැව, භූගෝලීය තොරතුරු පද්ධතිය, වියළි හා තෙත් කලාප

[1] භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය. nuwanbandara6153@gmail.com

[2] භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය. chethiyaherath@ssl.sab.ac.lk

# ASSESSMENT OF INDOOR AIR QUALITY LEVELS IN HOMES: A CASE STUDY FROM KEGALLE DISTRICT

*K.H.Dilshani Chandima [1], Samali Ayoma Marasinghe [2]*

Previous studies have predominantly focused on outdoor air quality, often assuming that ambient air is the primary source of pollution. However, evidence indicates that individuals spend most of their time indoors. Making outdoor measurements insufficient for accurately assessing overall exposure to particulate matter ($PM_{2.5}$ and $PM_{10}$) are key indoor pollutants that can exacerbate respiratory conditions. This study aimed to evaluate indoor environmental PM2.5 and PM10 concentrations in Galigamuwa DS Division, Kegalle through a cross-sectional study using parent-reported health questionnaires, and a case-control study utilizing air samples for PM measurement. There was a sample size of 50 houses in the Galigamuwa DS Division in the Kegalle District and, through a stratified random sample, only houses using firewood stoves were selected. in the first stage, a random sample of 5 out of the 53 GN Divisions in the Galigamuwa Division was selected, for the second stage systematic random sampling was applied to select households within these GN Divisions. Finally, parents living in the selected households were invited to participate, representing the targeted group for this study. This multistage sampling ensures a representative distribution across the study area while focusing on household characteristics that influence indoor environmental quality and children's health. Statistical analysis employed descriptive statistics to assess PM levels in the study area, conducted using SPSS software. The result indicated that PM2.5 and PM 10 levels exceed 60% of national standards or international thresholds (0 -50µg/$m^3$) in households, consistently recording PM concentrations between (60-70µg/$m^3$) across all Households, indicating elevated indoor air pollution. Such levels surpass recommended guidelines for safe indoor air quality, passing potential health risks, particularly for children who are more vulnerable to respiratory issues due to prolonged exposure. These findings underscore the importance of adopting better ventilation. However, despite the acceptable levels, the study recommended further improvements in ventilation systems to maintain and potentially reduce particulate matter (PM) levels over time. Additionally, the findings emphasized the need for stricter indoor air quality regulations to ensure long–term protection against potential health risks. Implementing these recommendations could lead to a sustained reduction in PM levels within home environments, ultimately minimizing respiratory health risks in similar settings.

***Keywords:*** Indoor air quality, PM2.5 and PM10, Respiratory Health

[1] Department of Environmental Management, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. hansanichandima78@gmail.com

[2] Department of Environmental Management, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka. samalimarasinghe@yahoo.com

# A STUDY OF THREATENED FAUNA DUE TO ECOSYSTEM DEGRADATION CAUSED BY DRYING OUT OF A LAKE: A REFERENCE TO WADIGA WEWA, HOROWPOTHANA.

*K.K.S.R. Kumarasena* [1]

Drying out of water bodies by human activities, climate changes or any other natural phenomena can cause significant damage to the surrounding ecosystem. This study aimed to assess the destruction of faunal diversity caused by such incidents. The research was based at "Wadiga Wewa" in Horowpothana. Basically, quantitative approach was initiated through field observations and specimen collection within around three weeks of time period starting from 8/4/2024.Specimens were collected using observational surveys as well direct counting and a total of 72 specimens were collected. From which 51% - *Pterygoplichthys pardalis*,15% - *Euphlyctis hexadactylus,* 8% - *Euphlyctis cyanophlyctis,* 6% - *Oreochromis sp.,* 5% - *Garra ceylonensis*, 3% - *Labeo rohita,* 4% - *Channa striata,* 4% - *Anguilla bicolor,* 2% - *Hoplobatrachus crassus* and 2% - *Channa marulius* were recorded as well 08 living *Clarias brachysoma,* 12 living *Heteropneustes fossilis,* 01 living *Geochelone elegans* and 06 living *Melanochelys trijuga thermalis* individuals were observed. Additionally, over 100 unidentified bone and body fragments were discovered within the dried lakebed. The study determines which species are most impacted. Some species indicated significant and rapid loss of their sightings around the lake area along with the time, which were semi-aquatic amphibians like *Polypedates maculatus* and avian species like *Halcyon smyrnensis.* Since the beginning, the number of *P.maculatus* sightings has dropped from 14 to 3 . Loss of habitats, lack of food, growth of invasive species and increase in predators are the reasons for the collapse of faunal diversity. Water management and habitat restoration are vital for the prevention of vulnerable fauna.

***Keywords:*** Faunal Diversity, Species, Threatened, Specimen, Dried Lake

[1] Department of Applied Archeology, Nãgãnanda International Institute of Buddhist Studies. senuraranmina@gmail.com

# බෞද්ධ ඉගැන්වීම්හි අන්තර්ගත පරිසර සංරක්ෂණය: විමර්ශනාත්මක අධ්‍යයනයක්

බඩල්කුඹුරේ සුබෝධි හිමි [1]

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් සියලු ම ජීවීන්ගේ යහපැවැත්ම උදෙසා සොබාදහම නිහඬ අනුපමේය කාර්යභාරයක් ඉටු කරයි. වර්තමාන සමාජය තුළ නාගරීකරණය, කාර්මිකකරණය හා ගෝලීයකරණය ආදී විවිධ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පරිසරයට සිදුවන හානිය ගණනය කළ නොහැක. මෙවනි ක්‍රියාකාරකම් මගින් සිදුවන ස්වභාවික ව්‍යසනයන් හා පරිසර සංරක්ෂණ ක්‍රමෝපායන්හි වැදගත්කම පිළිබඳ ව සිතීමට සමස්ථ මානව ප්‍රජාව වෙත පරිසරය තුළින් ම අවකාශය සළසා ඇත. මෙවන් පසුබිමක පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පරිසරයේ භෞතික අභිවෘද්ධිය උදෙසා උපයෝගී කර ගැනීම අන් කවරදාටත් වඩා වැදගත් වේ. මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ බුදුදහමෙහි අන්තර්ගත පාරිසරික සංරක්ෂණ ක්‍රමෝපායයන් පිළිබඳ ව විශ්ලේෂණාත්මකව අධ්‍යනය කිරීම යි. මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය මගින් සිදු කෙරේ. බෞද්ධ ඉගැන්වීම්හි මිනිසා සහ පරිසරය අතර පවතින අන්‍යොන්‍ය සබඳතාව පිළිබඳ සඳහන් වන සූත්‍ර ධර්මයන් හා භික්ෂු විනය ශික්ෂා මගින් පරිසර හිතෛෂී වීමට ද සෞන්දර්ය වර්ණනා තුළින් පරිසරය හා මිනිසා අතර පවතින සබදතාව මනාව විස්තර කෙරේ. මිනිස් චින්තනයෙහි පවතින යහපත් සිතුවිලිවලින් පාරිසරික සහනයත් එමගින් නීති ගරුක වීමත් අයහපත් සිතුවිලි තුළින් පාරිසරික ව්‍යසනයන් ඇතිවීමත් එමගින් නීති ගරුක නොවීම හා පරිසර විනාසයත් සිදුවන බව මනාව සඳහන් වේ. භික්ෂූන්ගේ දෛනික ජීවිතයේ පරිහරණය කරනු ලබන සියලුම දෑ පරිසර හිතකාමී වන අයුරින් පරිහරණයටත් බුදු දහම මග පෙන්වයි. පරිසරය යන්නට පුළුල් අර්ථයක් පවතින අතර එය සෑම දෙයක ම පැවැත්ම හෝ නැවැත්ම තීරණය කරන්නා වූ ප්‍රධානතම විශ්ව සාධකයක් ද වේ. වඩාත් පුළුල් අර්ථයකින් සළකා බලන කල්හි ජීවවිද්‍යාත්මක, රසායනික, භෞතික, සමාජ හා සංස්කෘතික සාධක සියල්ල පරිසරය යන්නට ඇතුළත් වේ. ජීවවිද්‍යාත්මක පරිසරය යන්නට ශාක හා සත්ව විශේෂයන් ද භෞතික පරිසරයට පස, ජලය, වාතය ආදිය ද සමාජ පරිසරයට මිනිසා විසින් නිර්මාණය කරන ලද ගොඩනැගිලි ආදී ක්‍රියාකාරකම් ද සංස්කෘතික පරිසරයට ආචාර ධර්ම, නීති පද්ධති ද අන්තර්ගත වේ. මානව සංවර්ධනය හා පරිසර කළමනාකරණය අතර අන්‍යොන්‍ය සබඳතාව කෙරෙහි සැලකිලිමත් වීම ප්‍රායෝගික ලෙස නිවරදි වූ බෞද්ධ ආකල්ප තුළ ද පිහිටා බුදුදහම හා විනය ශික්ෂා අනුගමනය කරමින් අධික ඇල්ම, තණ්හාව, ද්වේශය දුරලමින් පරිසර සංරක්ෂණයට පිවිසීම බුද්ධ දේශනාව මගින් ගම්‍යමාන වේ.

***ප්‍රමුඛ පද:*** පරිසර සංරක්ෂණය, බුදුදහම, බෞද්ධ ආචාර ධර්ම, ස්වභාවදහම, ස්වභාවික සම්පත්

[1] බෞද්ධ සංස්කෘතිය(විශේෂවේදී), තෙවන වසර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
badalkuburesubodhithero2020@gmail.com

# නාගරික මතුපිට ජල පරාමිතීන්ගේ කාලීන සහ අවකාශීය විවිධත්වය විශ්ලේෂණය; නිරිතදිග බේරෙ වැව

*පබිදු ප්‍රියදර්ශන*[1]

ලොව ජනගහන වර්ධනය සමඟ නාගරීකරණය වේගවත්ව ඉහළ යයි. සෘතීය නාගරීකරණයේ වර්ධනය ඉහළ වීම මත නාගරික පරිසරයට වන බලපෑම ඉහළ ය. මෙහිදී නාගරික ප්‍රදේශයන්හි මතුපිට ජල තලයන්ට වන බලපෑම ඉතා ඉහළ ය. එම පසුබිම මත කොළඹ නගරයේ අධිනාගරික පරිසරයක පිහිටි බේරෙ වැවෙ නිරිතදිග බේරෙ වැව පාදක කරගෙන ක්ෂේත්‍රීයව සහ කාලීනව ජල පරාමිතීන් වෙනස් වීම කෙරෙහි අවධානය යොමු කිරීමට මෙහිදී අවධානය යොමු විය. අධ්‍යයන ප්‍රදේශයේ නියැදි ස්ථානය 7ක් භාවිතයෙන් තෙත් සහ වියළි සෘතු ආවරණය වන පරිදි නියැදි රැස් කරන ලද අතර DO, $BOD_5$, TS, TSS, TDS, pH, දෘශ්‍යතාවය සහ උෂ්ණත්වය යන පරාමිතීන් ජලතලයෙහි ක්ෂේත්‍රීය සහ කාලීන වශයෙන් විශ්ලේෂණය කෙරිණි. ප්‍රාථමික දත්ත ඇසුරින් ක්ෂේත්‍රීය විවිධත්වය සඳහා අන්තර්නිවේශන ක්‍රමවේදය සහ කාලීන විවිධත්වය නිරූපණය කිරීමට සංඛ්‍යාන විද්‍යාත්මකව කල්පිත පරීක්ෂාවන් සිදු විය. නාගරීකරණය බලපෑම මත ක්ෂේත්‍රීය ව්‍යාප්තියෙහි සෘතුමය අනුව පැහැදිලි විවිධත්වයක් ගනු ලබය ආකාරය පැහැදිලිව සිතියම් තුළින් හඳුනාගත හැකිය. අධ්‍යයන පරාමිතීන් නාගරික පරිසරයක් තුළ හැසිරීමේ විවිධත්වය එයින් පැහැදිලිව නිරූපණය කරයි. කාලීනව සෘතුමය වශයෙන් pH සහ ඕ පරාමිතීන්ගේ පැහැදිලි විෂමතාවයක් පෙන්නුම් කළ ද අනෙකුත් ගණනය කරන ලද පරාමිතීන්ගේ විෂමතාවයක් හඳුනාගත නොහැකිය. අධිනාගරික පරිසරයක් තුළ පිහිටි ක්ෂේත්‍රීය ප්‍රදේශයක් වීම මත ජලයෙහි පරාමිතික ගුණාත්මක බව පිරිහී යාම හඳුනාගත හැකි අතර එය කාලීනව වර්ධනය වන්නකි. නාගරීකරණයේ ස්වභාවය මත එය තීරණය වෙයි. කළමනාකරණයෙන් තොර වූ නාගරික පරිසරය සහ මානව ආකල්පයන්හි දුර්වලතාවය මත මතුපිට ජල පරාමිතීන්ට එල්ල වන බලපෑම ඉහළ ය. එහෙයින් රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන අංශයන්හි දායකත්වය ලබා දෙමින් ජල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය විධිමත් පියවරයන් ගැනීම අත්‍යාවශ්‍ය ය. නාගරික පරිසරයක මතුපිට ජලයෙහි කාලීන සහ අවකාශීය විවිධත්වය, අධික වර්ධනය වන නාගරීකරණය සමඟ සම්බන්ධ කිරීම සහ එහි බලපෑම් සමඟ නාගරික ජලජ පරිසරයකට එල්ල වන අභියෝග මෙන් ම එතුළින් නාගරික පරිසරයේ සංරචක සඳහා එල්ල වන බලපෑම වර්තමානයේ මෙන් ම අනාගතයේ කෙබඳු අයුරින් පෙන්නුම් කරන්නේ ද යන්න හඳුනාගැනීමට අවකාශය උදා වෙයි.

***ප්‍රමුඛ පද:*** නාගරීකරණය, මතුපිට ජලය, ජල පරාමිතීන්, කල්පිත පරීක්ෂාව, ක්ෂේත්‍රීය විවිධත්වය, සෘතුමය විවිධත්වය

[1] භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය. pabidu1997@gmail.com

# THE CONTRIBUTION OF WOMEN TO ECONOMIC GROWTH IN RURAL AREAS: A STUDY BASED ON THE HUMBULUWAAGRAMA NILADHARI DIVISION IN KURUNEGALA DISTRICT

*K.H.G.J.S. Nishadini [1], B.A.T.D. Balasooriya [2]*

The role of women in economic development is widely recognized, but significant disparities exist in many regions. In Sri Lanka, especially in rural areas, the contribution of women in economic activities is significantly lower. This poses a critical challenge to the overall economic growth of Sri Lanka. Accordingly, the main objectives of this study are to investigate what are the main factors affecting the low labor contribution of women in the rural area. The secondary objectives are to examine the impact of their limited involvement on economic growth and to identify what strategies can be used to increase their engagement in economic activities. Data related to this research was collected using primary sources such as questionnaires and interviews conducted with 20 middle –age unemployed women, who were randomly selected in Humbuluwwa village division, as well as secondary sources. Through the data collection conducted in this way, it became clear to us that the main factors affecting the low labor contribution of women in this area were childcare and family responsibilities, health problems, low education and skill levels, low infrastructure and old cultural norms etc. And due to the factors mentioned above, especially we can identify the impacts of limited involvement like below. Thats are, the reduction of overall rural productivity and limitation of economic output, decrease in household income, increase in rural poverty level, limited social development and inefficiency of human resources. According to the results confirmed by the data collected, in order to increase the labor force of women in this area, many measures were taken, such as providing them with higher education and skill training, fostering positive attitudes for job opportunities, removing restrictive cultural norms, etc. Not only that, we can conclude that local development as well as sustainable economic growth can be created by directing women in rural areas to self-employment suitable for each region to reduce disparities from region to region.

***Keywords:*** Economic Growth, Low Labor Contribution, Rural Area, Women

[1] Department of Economics, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jananishihara2000@e-mail.com

[2] Department of Economics, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. dilrukshibalasooriya159@gmail.com

# Language, Literature & Culture



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# අම්බොක්ක පත්තිනි දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍රයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්.එල්. මූලරාජගේ* [1]

ශ්‍රී ලංකාව පුරා පිහිටුවා ඇති දේවාලවල විවිධ පූජා චාරිත්‍රයන් දෙවියන් වෙනුවෙන් ඉටු කිරීමේදී දේවාල රාජකාරිවල බහුතරය පුරුෂ පාර්ශ්වයේ සහභාගිත්වයෙන් සිදු කරන අතර එහි කාන්තා සහභාගිත්වය ඉතා අවම වෙයි. ස්වභාවයෙන්ම කිළි සහිත යැයි සලකා දෙවියන්ගේ පූජනීය ශුද්ධ වූ කටයුතු සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය අහුරා ඇති අතර දේවතාවියක වූ පත්තිනි දෙවියන්ගේ කටයුතු සඳහා ද මේ තත්ත්වය අදාළ වේ. එම නිසා අනෙකුත් දේවාලවල මෙන්ම පත්තිනි දේවාල තුළ ද රාජකාරි සහ චාරිත්‍ර කටයුතු සඳහා එකම කාන්තා නියෝජනය ආලත්ති අම්මාවරුය. ආලත්ති බෑම සහ දෝලාව අසලින් චාමර සැලීම සියලු දේවාලවල ආලත්ති අම්මාවරුන්ට නියම වූ රාජකාරියයි. නමුත් මාතලේ අම්බොක්ක ග්‍රාමයේ පිහිටුවා ඇති පත්තිනි දේවතාවියට කැප වූ දේවාලයේ ආලත්ති අම්මා අනෙකුත් දේවාලවලදී සිදු කරනු ලබන රාජකාරිවලට අමතරව වෙනත් චාරිත්‍ර කිහිපයක මූලිකත්වය ගෙන කටයුතු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව අම්බොක්ක පත්තිනි දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍ර මොනවාද? යන්න පර්යේෂණ ගැටලුව වන මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ මෙම දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍ර හඳුනාගැනීම සහ ඒවා ආලත්ති අම්මා මූලිකව සිදු කිරීමට පසුබිම් වූ හේතූන් අධ්‍යයනය කිරීමයි. ගුණාත්මක ක්‍රමවේදය භාවිතයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය සඳහා සහභාගිත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ද ද්විතියික මූලාශ්‍රය සඳහා පුස්තකාල අධ්‍යයනය ද භාවිත කරන්නට විය. දත්ත විස්තරාත්මක සහ සංසන්දනාත්මක ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කරන්නට විය. අනෙකුත් දේවාලවල කපුරාළ විසින් සිදු කරනු ලබන නානුමුර මංගල්‍යය අම්බොක්ක පත්තිනි දේවාලයේදී පත්තිනි අම්මා, කිරි අම්මා යන ව්‍යවහාරයෙන් ද ආමන්ත්‍රණය කරනු ලබන ආලත්ති අම්මා විසින් සිදු කරනු ලබයි. එමෙන්ම වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යයේදී දේවාලයේ තැන්පත් කර ඇති පැරණි පත්තිනි දේව ප්‍රතිමාවට සළු පැලැන්දවීම නම් චාරිත්‍රය සහ ඇසළ පෙරහැර නිමාව සනිටුහන් කරන දිය කැපීමෙන් අනතුරුව සිදු කරනු ලබන කෙණ්ඩිය වැඩමවීම නම් චාරිත්‍රය සිදු කරනු ලබන්නේ ද ආලත්ති අම්මාගේ මූලිකත්වයෙනි. ඒ අනුව ආලත්ති බෑම සහ චාමර සැලීම යන රාජකාරිවලට අමතරව නානුමුර මංගල්‍යය, සළු පැලැන්ද වීම සහ කෙණ්ඩිය වැඩම වීම යන චාරිත්‍රයන් ආලත්ති අම්මා මූලිකව අම්බොක්ක පත්තිනි දේවාලයේ පමණක් සිදු කරනු ලබන බව මෙම අධ්‍යයනයේදී අනාවරණය විය. ජීවමාන අර්ථයෙන් පූජා චාරිත්‍රයන් දෙවියන්ට ඉටු කිරීමේදී දේවතාවියක වූ පත්තිනි දෙවියන්ගේ ස්නානය සිහිපත් කරන නානුමුර මංගල්‍යය සහ වස්ත්‍රයන්ගෙන් සැරසීම සිහිපත් කරන සළු පැලැන්ද වීම පුරුෂයන් සිදු කිරීම නොසුදුසුසේ සැලකීමත් ප්‍රතිමාව ස්පර්ශ කිරීම දිව්‍ය කතාවේ එන පරිදි පත්තිනි මාතාව විසින් රැක ගෙන එනු ලබන පතිව්‍රතතාව බිඳ දැමීමට හේතුවක් ලෙස සැලකීමත් නිසා මෙම චාරිත්‍රයන් ආලත්ති අම්මා විසින් සිදු කරන බව ද මෙහිදී හඳුනා ගත හැකි විය.

**ප්‍රමුඛ පද:** අම්බොක්ක පත්තිනි දේවාලය, ආලත්ති අම්මා, චාරිත්‍ර, දේවාල රාජකාරි, පත්තිනි ඇදහිල්ල

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
mohanlakshitha24@gmail.com

# ඓතිහාසික දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර හා බැඳුණු ජන ජීවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එච්.එම්.අයි.එන්. හේරත් [1], කේ.ඒ.ඒ. ඩිල්ශානි [2], පී.ජී.එස්. සෙව්වන්දි [3]*

අනාදිමත් කාලයක සිට සුවහසක් බැතිමතුන්ගේ වන්දනාමානයට පාත්‍රවන ඓතිහාසික වටිනාකමකින් යුතු පුදබිමක් වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ පිහිටි දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාලය හැඳින්විය හැකිය. දෙවියන් උදෙසා පුදපූජා පැවැත්වීමත්, දේව ආශිර්වාද ලබා ගැනීමත් අරමුණු කරගනිමින් වාර්ෂිකව පැවැත්වෙන උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර සුවිශේෂී වේ. දෙස් විදෙස් අවධානයට ලක්වන දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර හා බැඳුණු ජන ජීවිතය කෙබඳුද? යන ගැටලුව ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කරන ලදී. දෙවිනුවර පෙරහැර හා බැඳුණු ජන ජීවිතයේ ස්වභාවය හඳුනාගැනීම ප්‍රධාන අධ්‍යයන අරමුණයි. ජනතාව සහ පෙරහැර අතර සබඳතාවය හඳුනාගැනීම සහ ජන සමාජයටත්, ආර්ථිකයටත් එහි බලපෑම හඳුනාගැනීම සෙසු අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර දත්ත ඒකරාශී කිරීමේදී පුස්තකාල සමීක්ෂණය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය යොදාගන්නට විය. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමය යටතේ දෙවිනුවර ග්‍රාමය යොදාගනිමින් අහඹු නියැදිය යටතේ පුද්ගලයන් 30 දෙනෙකුගෙන් ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ ව්‍යුහගත නොවන ක්‍රමය ආශ්‍රයෙන් තොරතුරු ඒකරාශී කරන ලදී. රැස් කරගන්නා ලද දත්ත තේමාත්මක, කථනාත්මක සහ ඓතිහාසික ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. ක්‍රි.ව.1257 දී පමණ අරඹන ලද දෙවිනුවර පෙරහැර, ආගමික භක්තිය ඒකරාශී කරවන විශේෂ අවස්ථාවකි. පෙරහැර සඳහා දෙවිනුවර ජනයා අලුත් අවුරුද්දකට මෙන් නිවෙස් අලුත්වැඩියා කරමින් සූදානම් වේ. ආගන්තුක සත්කාර කිරීම අතීතයේ සිටම ප්‍රදේශවාසීන්ගේ සිරිත විය. වයස් භේදයකින් තොරව සියලුදෙනා පෙරහැර කටයුතුවලට දායකවන අතර වීදි අලංකරණය, සැල්වින් සිල්වාගේ කලායතනය ප්‍රධානව නර්තන පුහුණුවීම්, කාවඩි නර්තනයන්ට දෙස්විදෙස් ලාංකිකයන්ගේ සහභාගීත්වය, මූල්‍ය ආධාර, තෙල් සිඳීම ආදිය දැඩි භක්තියකින් සිදුකරන බව හෙළිවිය. පෙරහැර කාලසීමාවේදී යහපත් මෙන්ම අයහපත් සිදුවීම් ජන ජීවිතයට බලපෑම් කරයි. විරසකයන් මුල් කරගනිමින් පළිගැනීම් සඳහා පෙරහැර පැවැත්වෙන කාලසීමාව එනතෙක් බලා සිටීමත්, සිසුන්ගේ පාසල් අධ්‍යාපනයට බාධා වීමත්, අහිතකර සංස්කෘතීන් ආරෝපණය වීමත් මෙන්ම සොරකම් සිදුවීම් යනාදිය ගැටලුකාරී තත්ත්වයන් වේ. පෙරහැර අවසානයේ දින හතක් පුරා පැවැත්වෙන සල්පිළ තුළින් දෙවිනුවර ජනයාට ආර්ථිකයෙන් සමෘද්ධිමත් වීමට අවකාශ සැලසේ. යම් ආකාරයකින් අතීත සිරිත් ගිලිහී ගොස් පැවතිය ද ජනතාව සතු දැඩි ආගමික විශ්වාසවලට අනුව පෙරහැර ආරම්භයේ සිට අවසානය දක්වා වර්තමානයේදීත් කටයුතු කරන බවත්, අතීතයේ සිටම දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර සමඟ ජන ජීවිතයේ සියලු ක්ෂේත්‍ර එකිනෙකට බැඳී පවතින බවත් පැහැදිළි වේ.

***ප්‍රමුඛ පද:*** ආගමික භක්තිය, උපුල්වන්, ඓතිහාසික, ජන ජීවිතය, දෙවිනුවර

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ireshahmnilmini1999@gmail.com

[2] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ashinidilshani247@gmail.com

[3] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. saralasewwandi99@gmail.com

# AN ETHNOGRAPHIC STUDY ON THE ROMAN CATHOLIC CHURCH 'S FEAST CEREMONY IN SRI LANKA.

*M.A. Mallikarachchi* [1]

Sri Lanka is rich with various cultural projections, come from different cultural identities created under a multi-religious environment. Roman Catholicism is the second main religion in Sri Lanka and its historicity goes back to Sri Lanka's Portuguese colonial period, according to certified Archaeological evidence. This research work is aimed to study the ethnographic background of this proposed tradition of "Roman Catholic church feast ceremony" and give solutions to the lack of knowledge and attention driven to this area, by the current Sri Lankan Roman Catholic society. Questions in the identification of the difference between previous and current cultural features that conventionally separated from each church, and evidence that can be substantially and commonly acceptable to certify this proposed event's historical timeline goes back to the Portuguese time, were addressed by this research. This research work was done in a qualitative methodology with primary and secondary resources such as, books, newspaper articles, e-resources and information collected by exploring in the field, including, some of the ancient Roman Catholic churches in Sri Lanka. Results of this research work can be divided into two parts as "revealing the historical environment" and "explaining the cultural characteristics". History of this tradition goes back to the prior British colonial period. Introduce of "Church feast flag hoisting ceremony by St. Joseph Vaz", and a historical "church feast ceremony" held at Kandy in the Portuguese colonial time can be considered as examples for the historicity mentioned earlier in the abstract. And, events like, "Karaththa Mangalyaya" in the feast of St. Anne's Church - Kattimahana, "Oru Mangalyaya" in the feast of St. Anne's Church - Thalawila and some different "after feast day or pre-feast day Suruwam Perahera traditions" in separated churches can be included in the proposed "cultural characteristics explanation".

***Keywords:*** Ethnographic, feast, historical, Catholic

[1] Department of Applied Archaeology, Nagananda International Institute for Buddhist Studies. mallikarachchiakila72@gmail.com

# රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමත් සමඟ සිංහල භාෂාවේ ඇති වූ වෙනස්කම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය. (යටත් විජිත සමය ඇසුරින්)

*ටී.ඩී. තරුෂි නෙත්මි* [1]

සිංහල භාෂාවේ ආරම්භයේ පටන් විසි එක්වන සියවස දක්වා සිංහල භාෂාවේ ප්‍රවර්ධනය පිළිබඳ සලකා බලන විට විවිධ කාල පරාස තුළ ලංකාවේ සිදු වූ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වෙනස්කම් මේ සඳහා බලපෑම් කර ඇත. මෙම හේතු අතරින් යටත් විජිත යුගයේ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමට සමගාමීව සිංහල භාෂා වාක්කෝෂයේ ඇති වූ වෙනස පිළිබඳ අධ්‍යයනය පර්යේෂණ අරමුණ බවට පත්විය. සිංහල භාෂාවේ වටිනාකම පිළිබඳ වැඩි වශයෙන් කතාබහට ලක්වන සමයක සිංහල භාෂාවේ වාක්කෝෂය පෘථුල වීමට රෝමානු කතෝලික ආගම ඇසුරින් දායකත්වයක් ලැබී ඇත්ද යන්න සෙවීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. රෝමානු කතෝලික ආගම ව්‍යාප්තවීම සමග සිංහල භාෂාව තුළ ඇති වූ වෙනස්කම් කෙබඳු ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සාහිත්‍ය හා ලේඛන විශ්ලේෂණ ක්‍රමය භාවිත කළ අතර ද්විතීය මූලාශ්‍රය ලෙස සිංහල භාෂාවේ සම්භවය හා යටත්විජිත යුගයේ රෝමානු කතෝලික ආගම පිළිබඳ ග්‍රන්ථද තෘතීය මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලයද යොදාගනු ලැබීය. මෙසේ ගොනු කරගත් දත්ත අනුව රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීම හේතුවෙන් සිංහල භාෂා වාක්කෝෂය වර්ධනය වී ඇති බව අනාවරණය විය. අතීත ශ්‍රී ලංකාව තුළ ඇතිවූ විදේශීය ආක්‍රමණ හරහා ද සිංහල භාෂාවේ වාක්කෝෂය පෘථුල විය. මේ අතර සුවිශේෂී සිදුවීමක් ලෙස රෝමානු කතෝලික දහම ව්‍යාප්ත වීම හා ඒ සමග සිංහල වාක්කෝෂයට නවාංග එක්වීම හඳුන්වාදීමට හැකිය. භාෂාවකට නවාංග එක්වීම තුළින් පැහැදිලි වන ප්‍රධානතම කරුණක් නම් එම සමාජයට මේ සිදුවීම සුවිශාල ලෙස බලපෑම් කරඇති බවයි. මෙසේ භාෂාවේ වර්ධනයට එක් වූ වචන බොහෝමයක් කතෝලික පල්ලිය හා ඒ වටා බැඳුනු සංස්කෘතිය මූලික කරගත් ඒවාය. මේ ආකාරයට ලාංකිකයන්ට නුහුරු සංස්කෘතියක් ලංකාව තුළ ස්ථාපිත වනවිට ඒ පිළිබඳ සන්නිවේදනයට භාෂාව ප්‍රමාණවත් නොවීම නිසා මේ ආකාරයට භාෂාවට නවාංග එක් වීම හා ඒ ඇසුරින් සිංහල භාෂාව වර්ධනය වී ඇතැයි නිගමනය කළ හැකිය. මේ අනුව බැලූවිට සිංහල භාෂා වාක්කෝෂය පෘථුල වීමට කතෝලික ආගම ලංකාව තුළ ව්‍යාප්ත වීමද හේතු වී ඇති බවට නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** පූජකවරු, යටත් විජිත යුගය, රෝමානු කතෝලික ආගම, වාක්කෝෂය, සිංහල භාෂාව

[1] භාෂා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ssh2020305@ssh.rjt.ac.lk

# THE SIGNIFICANCE OF LANGUAGE IN INVESTIGATING EPISTEMOLOGY; A STUDY BASED ON BUDDHISM

*Ven. Polonnaruwe Kashyapa [1], J.D.M.U. Jayampath [2]*

The significance of language in epistemological study, particularly in Buddhist thoughts, is a complicated matter. Language is a crucial tool in Buddhism to impart teachings and articulate concepts. However, Buddhism acknowledges the limitations of language, especially when conveying ultimate truths such as nirvana and emptiness. The research objective was to explore the function of language in establishing epistemological theory. And also, determines language's limitations in explaining transcendent realities, and investigates how Buddhist philosophy tackles these constraints. The problem was finding out how language works in the conceptual structure of Buddhist epistemology. It explores how language influences the realisation of the ultimate understanding by assessing its usefulness in conceptual discussions with its limitations in explaining conceptual reality. The qualitative research methodology was employed, utilizing content analysis to examine the role of language in Buddhist epistemology. Data were gathered through the analysis of fundamental Buddhist texts and secondary academic treatises. The study explores fundamental Buddhist philosophical traditions. Particularly Madhyamaka and Yogācāra, which question the reification of conceptions through language and claim that words cannot completely convey ultimate truths. Nāgārjuna's deconstruction of linguistic structures in Madhyamaka philosophy shows how language can mislead our knowledge of emptiness and ultimate reality. Additionally, the ethical dimension of language is explored through the concept of Right Speech, which emphasizes the importance of clarity, truthfulness, and mindfulness in speech as part of the Buddhist path. Furthermore, studying emphasizes the complicated and nuanced role of language in Buddhist epistemology, where it acts as both a necessary instrument for transmitting conventional knowledge and a limitation in articulating ultimate truths. Buddhist philosophy emphasizes the significance of recognizing these limitations and advocates for a mindful approach to language in intellectual investigation. Finally, this study shows that in the Buddhist exploration of knowledge, language must be employed wisely while understanding that genuine awareness is beyond words.

***Keywords:*** Buddhist Epistemology, Madhyamaka and Yogācāra, Nāgārjuna's deconstruction, Right Speech, Transcendent Realities

[1]Department of Pali and Buddhist Studies, Bhiksu University of Sri Lanka. bs597@busl.ac.lk
[2]Department of Sociology, University of Ruhuna. madushika.17857@uhss.ruh.ac.lk.

# බැද්දේගම නවකතාවෙන් නිරූපිත සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ යථාර්ථය පිළිබඳ විමර්ශනයක්.

*එම්.පී. එරන්දිකා ප්‍රේමරත්න* [1]

බැද්දේගම යනු බ්‍රිතාන්‍ය ජාතික ලේනාර්ඩ් වුල්ෆ් විසින් හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සේවය කරන කල්හි බැද්දේගම නම් ප්‍රදේශය වටා ගෙතුණ කතාවකි. ඔහු විසින් මෙම කෘතිය රචනා කරනු ලැබූයේ එකල්හි ආණ්ඩුකාරවරයෙක් ලෙස සේවය කිරීමේ දී අත්විඳින ලද අත්දැකීම් මගින් 1913 වර්ෂයේදී "Village in the Jungle" නම් ඉංග්‍රීසි කෘතියක් ලෙසිනි. මෙහි ඇති විශිෂ්ටත්වය හේතුවෙන් ඒ. පී. ගුණරත්න විසින් සිංහලයට අනුවර්තනය කිරීම සහ ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් මෙම කෘතිය සිනමාපටයක් ලෙස ද නිර්මාණය කළහ. නවකතාවට වස්තු විෂයය වන්නේ එම ගමේ පරිහානිය හා විනාශය වන දුක් මුසු කතා පුවතකි. එවකට පැවති අධිරාජ්‍යවාදීන්ගේ බලය සංකේතවත් කළ හැකි කෲර පාලනය හා වලව් ආධිපත්‍යයත්, වෙළඳාම හා වාණිජකරණය යන කරුණු කතාව තුළින් නිරූපණය වන්නේ කෙසේද, යන්න පර්යේෂණ ගැටලුවයි. යටත්විජිත පාලන තන්ත්‍රය යටතේ ලාංකේය නොදියුණු ගැමි සමාජය හා බැඳී පැවැතුණු සත්‍යයත්, වනාශ්‍රිත ගමක පරිහානිය හා අවසානය දැක්වීමත් බැද්දේගම නවකතාව මගින් නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය වන අතර ඒ. පී. ගුණරත්න විසින් සිංහලයට අනුවර්තනය කරන ලද බැද්දේගම නවකතාව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කර ඇත. එමෙන් ම ඒ පිළිබඳ ව ලියවුණු වෙනත් විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇත. 'බැද්දේගම' නවකතාවෙහි බබුන්, සිලිඳු සහ පුංචිමැණිකා වැනි චරිත තුළින් ලාංකේය පීඩිත, අසරණ සමාජ තලයත්, බබේ හාමි ආරච්චිගේ චරිතය තුළින් එවකට පැවති කෲර පාලනයත්, ගමට පිටින් ආ ප්‍රනාන්දුගේ චරිතය තුළින් කෲර වෙළඳාම හා වාණිජකරණය ප්‍රතීයමාන කරයි. ඊට අමතරව බැද්දේගම නවකතාව කාලීන සමාජ යථාර්ථ රැසක් ග්‍රහණය කරගැනීමෙහි ලා සමත් වූ ආකාරයත් දහමින් තොර සිලිඳුලාගේ ජීවිත නොයෙක් ව්‍යාජ ඇදහිලි හා විශ්වාසවලින් ගහණ වීම තුළින් නිලධාරීන්ගෙන් කිසිදු හව්හරණක් නොමැති තැන ශාරීරික පීඩා විඳ දරා ගනිමින් නොයෙක් පුද පූජා පැවැත්වීමට මෙහි ජීවත් වූවන් කටයුතු කොට ඇති ආකාරය ද නිරීක්ෂණය කළ හැකිය. බැද්දේගම නවකතාව තුළ නිරූපිත මෙම සමාජ යථාර්ථය වත්මන් සමාජය තුළ ද ඇතැම් අවස්ථාවල දී හඳුනාගත හැකි ය. ඒ අනුව බැද්දේගම නවකතාව තුළ කෲර පාලනය හා වලව් ආධිපත්‍යයත් වෙළඳාම හා වාණිජකරණයත් නිරූපණය මගින් තත් කාලීන සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ පසුබිම හෙළිදරව්වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ඇදහිලි විශ්වාස, නිලධාරීන්, පාලන තන්ත්‍රය, වෙළඳාම, සමාජ යථාර්ථය

[1] භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ssh2020340@ssh.rjt.ac.lk

# 'සිංහබාහු' නාට්‍යයෙහි නිරූපිත ශෝකෝත්පාදක ලක්‍ෂණ තුළින් පුද්ගල චරිත ශෝධනය සිදුවන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.පී. එරන්දිකා ප්‍රේමරත්න* [1]

එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය නිර්මාණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී පෙර'පර දෙදිග නාට්‍ය ලක්ෂණ හඳුනාගත හැකි ය. ඔහුගේ නාට්‍යයවල සුඛාන්ත මෙන් ම ශෝකාන්ත ලක්ෂණ ද අන්තර්ගත වේ. 1961 දී නිෂ්පාදනය වූ "සිංහබාහු" නාට්‍යයට ඓතිහාසික ලේඛනයක් වන මහාවංශයෙහි දක්නට ලැබෙන ශ්‍රී ලංකාවට ආර්යයන් පැමිණීම පිළිබඳ ජනප්‍රවාදගත පුවත විෂයය වී ඇත. ඒ. වී. සුරවීර පරිවර්තනය කොට ඇති ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රයෙහි අන්තර්ගත ශෝකෝත්පාදක ලක්ෂණ හා පැරණි ග්‍රීක ශෝකාන්ත නාට්‍යයවල දක්නට ලැබෙන ශෝකෝත්පාදක ලක්ෂණ පුද්ගල චරිත ශෝධනය සඳහා වැදගත් වන ආකාරය "සිංහබාහු" නාට්‍යයෙහි කොතරම් දුරට අන්තර්ගත වන්නේ ද, යන්න මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුවයි. ශෝකෝත්පාදක නාට්‍ය ලක්ෂණ තුළ අන්තර්ගත වන භාව විශෝධන ක්‍රියාවලිය තුළින් පුද්ගල චරිත ශෝධනය උදෙසා සිංහබාහු නාට්‍යය වැදගත් වන ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ "සිංහබාහු" නාට්‍යයෙහි ශෝකෝත්පාදක ලක්‍ෂණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට හැකි වීමයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. ඒ යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කළ අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සරච්චන්ද්‍රගේ "සිංහබාහු" නාට්‍යය පෙළ ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස ශෝකාත්මක නාට්‍ය ලක්ෂණ සහිත වෙනත් කෘතිත් ද අධ්‍යයනය කරන ලදි. කාව්‍ය ශාස්ත්‍රයේ දක්නට ලැබෙන ශෝකෝත්පාදක ලක්ෂණ සිංහබාහු නාට්‍යය තුළ ඒ අයුරින් ම අන්තර්ගත වී ඇති බැවින් භාව විශෝධන ක්‍රියාවලිය ඔස්සේ පුද්ගල චරිත ශෝධනයට එය පාදක වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ග්‍රීක නාට්‍ය, චරිත ශෝධනය, භාව විශෝධනය, ශෝකාත්මක, සම්ප්‍රදාය

[1] භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ssh2020340@ssh.rjt.ac.lk

URSSSH 2024

# Sociology, Anthropology & Criminology



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# වත්මන් තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් (සමාජ මාධ්‍ය ඇසුරින්)

*ඒ.පී.ඒ.එම්. කවිරත්න [1]*

ඕනෑම රටක තරුණ පරපුර යනු රටේ ජීවනාලියයි.අනාගත ශ්‍රම බලකාය වන්නේ ඔවුන්ය.තොරතුරු තාක්ෂණයේ දියුණුව හේතුවෙන් ගෝලීයකරණය වූ ලෝකයේ සමාජ මාධ්‍ය ඉතාමත් ජනප්‍රිය වේදිකාවකි.වත්මන් තත්ත්වය තුළ සමාජ මාධ්‍ය ඉතාමත් ජනප්‍රිය වේදිකාවක් බවට පත්ව ඇති අතර වත්මන් තරුණ පරපුර සීඝ්‍රයෙන් ඇදීයාමක් පැහැදිලිව දක්නට ලැබේ.ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ වත්මන් තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා අධ්‍යයනය කිරීමය. උප අරමුණු ලෙස වත්මන් තරුණ පරපුර බහුලව භාවිතා කරන සමාජ මාධ්‍ය වර්ග මොනවාද? සමාජ මාධ්‍ය භාවිතා කරන්නේ කුමන කාර්යයන් සඳහාද, එමගින් අත්පත් කරගත් ධනාත්මක සහ ඍණාත්මක බලපෑම කෙසේද? සහ ඍණාත්මක බලපෑමෙන් මිදීමට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද? යන්නය. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද ද්විත්වය යොදා ගනිමින් මිශ්‍ර ක්‍රමවේදය මත පර්යේෂණය සිදු කර ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පුස්තකාල සමීක්ෂණය ඔස්සේ ද්විතීක මූලාශ්‍ර වන සඟරා ලිපි අන්තර්ජාල පුවත් සහ අන්තර්ජාල යොදා ගනිමින් සිදුකරන ලදි. ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අන්තර්ජාල සම්බන්ධතා පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත අන්තර්ජාලය ඔස්සේ ලබාගන්නා ලදි. 2024 ජූලි මාසයට නියමිත ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය සංඛ්‍යා ලේඛන අනුව ෆේස්බුක් 70.51%, යූටියුබ් 23.15%, පින්ටරෙස්ට් 3.05, ඉන්ස්ටර්ග්‍රෑම් 1.9%, ටුවිටර් 0.87%, රෙඩ්ඩිට් 0.26% සහ ලින්ක්ඩින් 0.22% පරිශීලනය කරන බව අනාවරණය විය. 2024 අගෝස්තු වන විට යූටියුබ්, ටික්ටොක්, ඉන්ස්ටර්ග්‍රෑම් සහ ෆේස්බුක් සමාජ මාධ්‍ය වේදිකාවන් තුළ මූලිකත්වය ගෙන ඇත්තේ තරුණ පරපුර බව සංඛ්‍යා ලේඛන වලින් අනාවරණය විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ වත්මන් තරුණ පරපුර සමාජ මාධ්‍ය භාවිතයේ ප්‍රවණතා සඳහා බලපාන ලද හේතු ගණනාවක් මෙම අධ්‍යයනෙන් හඳුනා ගැනීමට හැකි විය.වෘත්තීය අවස්ථා විවර කර ගැනීම, තාක්ෂණික දැනුම පිළිබඳ අවබෝධය ලබා ගැනීමට, අධ්‍යාපන කටයුතු සඳහා යොදාගැනීම සහ ස්ව උත්සාහයෙන් නැගී සිටීමට මාර්ගය විවර කර ගැනීමද එහිලා බලපාන බව හඳුනා ගැනීමට හැකි විය.වත්මන් තත්වය තුළ රටේ පවත්නා අස්ථාවරභාවයට විසඳුමක් ලෙස රටේ අනාගත තරුණ පරපුර විසින් සමාජ මාධ්‍යයට යොමු වීම යහපත් ඵලදායී ක්‍රියාමාර්ගයක් බව ගම්‍ය විය.රටේ ජීවනාලිය වූ තරුණ පරපුර සමාජ මාධ්‍ය භාවිතා කිරීමේදී නිසි අවබෝධයකින් යුක්තව භාවිත කිරීමෙන් ඒ ඔස්සේ සිදුවිය හැකි ඍණාත්මක බලපෑම අවම කර ගැනීමට හැකිවේ.

***ප්‍රමුඛ පද:*** අධ්‍යයනය, තරුණ පරපුර, වත්මන්, වෘත්තීය, සමාජ මාධ්‍යය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ayeshakavirathna443@gmail.com

# මානව ගබ්සාව හා උපත්පාලනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ත්‍රිපිටකය ඇසුරෙන්)

*පූජ්‍යය මාවැල්ලේ සුමනසිරි හිමි [1], කේ.ජී.එම්.ඩබ්ලිව්.කේ. රත්නායක [2]*

සිංහල, පාලි, සංස්කෘත යන සම්භාව්‍ය භාෂාවලිනුත් ඉංග්‍රීසි භාෂාවෙනුත් ගබ්සාව යන්නට විවිධාර්ථවත් අර්ථකථන ලබාදී ඇත. ලොව පුරා බොහෝ දෙනාගේ අවධානය ලක් වී ඇති මෙය ලොව නිරන්තරයෙන් සිදුවන දෙයකි. අද වන විට මෙය සමාජ ප්‍රශ්නයක් දක්වා වර්ධනය වීම එයට හේතු වී ඇත. දිනෙන් දින සමාජය තුළ නො විසඳන ගැටළුවක් දක්වා වර්ධනය වී ඇත. ගබ්සාව යනු කළලය නොමේරූ අවධියේම ගර්භාෂයෙන් අස්වභාවික ඉවත්කිරිමයි. ස්වාභාවිකව කළලය ගර්භාෂයෙන් පිටතට පැමිණීම නිතැන් ගබ්සාව *(Spontaneous Abortion)* නම් වන අතර බාහිර බලපෑම් මඟින් ගර්භාෂයෙන් කලලය ඉවත්කිරිම ප්‍රේරිත ගබ්සාව පිළිබඳ ආගමික, සාමාජික, හා නෛතික වශයෙන් ගැටළු පැනනැගී ඇත. ලොව ඇතැම් රටවල් ගබ්සාව නීත්‍යානුකූල කොට ඇති අතර සමහර රටවල් ගබ්සාව නීතියෙන් තහනම් කර ඇත. නිරන්තරයෙන් සමාජයේ කතාබහට ලක්වන මෙවැනි ගැටළු පිළිබඳ බෞද්ධ ආකල්පය ගෙනහැර දැක්විම මෙහි මුලික අභිලාශයයි. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ත්‍රිපිටකාශ්‍රිත විමර්ශනත්, වෛද්‍ය විද්‍යාවේ පෞරාණික හා නුතන අර්ථකථනත් මනාව සැලකිල්ලට ගනිමින් මෙම පර්යේෂණය කිරිමට බලාපොරොත්තු වෙමු. තවදුරටත් මෙය බරපතල සමාජ ප්‍රශ්නයක් වශයෙනුත් අපරාධ ක්‍රියාවලිය තුළ කිසිසේත්ම සමාවක් නොදිය හැකි විශාල මහාපරාධයක් වශයෙනුත් පෙන්වාදීමට සුදානම් වෙමු. මේ සඳහා බෞද්ධ සූත්‍ර සාහිත්‍ය මුලාශ්‍රය වශයෙන් බොහොමයක් සාධක සපයනු ඇත. ගැඹුරින් විමර්ශනය කිරීමේදී පැහැදිලි වන්නේ සමාජයේ ජීවත්වන බොහෝදෙනාට ඍජුව හෝ වක්‍රාකාරයෙන් අනිසි ප්‍රතිඵල ගෙන දෙන බවයි. ගබ්සාවෙන් පෞද්ගලික මෙන්ම සාමාජීය වශයෙන් ද විශාල හානියක් සිදුවන බව පැහැදිලිය. සූත්‍ර පිටකය පමණක් නොව විනය පිටකය තුළිනුත් මේ වෙනුවෙන් කරුණු සපයා දියහැකිය. මිනිසා උත්පත්තිය ලබන්නේ මවුකුසක් තුළය. උදාර වූ මාතෘපදවිය හිමිවන්නේ දරුවෙකු බිහිකළවිටය. එය පාරමිතාවක් වශයෙන්ද පෙන්වා දියහැකිය. තවත් සත්ත්වයෙකුට මෙලොව එළිය ලැබීමට අවස්ථාව උදාකර දෙමින් තමන්ගේ රුධිරය කිරිකර පෙවීමෙන්, සත්ත්වයෙක් පෝෂණය කිරීමෙන් මාතෘ පදවිය තුළින් එය සිදුකර ගනී. මාතෘ ගර්භයෙන් උපන් සත්ත්වයන්ම මාතෘ ගර්භයෙන් උපදින සත්ත්වයන් හට එරෙහිව ක්‍රියා කරයි. ඒ අනුව ගබ්සා කිරීම බුදුදහම කොහෙත්ම අනුමත නොකරන අතර උපත්පාලනය පිළිබඳ ඍජු අදහසක් බුදුදහම තුළ දැකගත නොහැකිය. එය සදාචාර නිර්ණායක ක්‍රියා තුළින් පැහැදිලි කරගත හැකිය. මෙය වර්තමානයේ දැවෙන ප්‍රශ්නයකි. නූතනයේ ගබ්සා කිරීමට අමතරව නොයෙක් උපත් පාලන ක්‍රම භාවිත කරයි. ප්‍රජාව වර්ධනය කළ යුතු බවට හෝ උත්පත්ති පාලනය කළ යුතු බවට ඍජු අදහසක් බෞද්ධ මූලාශ්‍රයන්ගෙන් විද්‍යමාන නොවේ. ජීවිතයක් විනාශ නොකොට උත්පත්ති පාලනය කිරීමේ ක්‍රම රාශියක් නූතනයේ භාවිතයට පැමිණ ඇත. එනම් උපත් පාලන කොපු භාවිතය, මිතුරි පෙති, එන්නත් කිරීම්, පොස්ටිනෝ 02 නැමැති පෙති වර්ගය ආදී ක්‍රමයන් උපත් පාලනය සඳහා යොදාගනී. මෙම ක්‍රමයන් පිළිබඳ ඍජු අදහසක් බෞද්ධ සාහිත්‍යයෙන් විද්‍යමාන නොවේ.අප සිදු කළ යුත්තේ නූතනයේ උපත් පාලන ක්‍රම හා ඒවායේ ඵල සාධනයන් බුදු දහමේ මූලික ඉගැන්වීම් අනුව පිළිගත හැකිද යන්න විග්‍රහ කර ගැනීමයි. කිසියම් ක්‍රියාවක හොඳ නරක විග්‍රහ කරගැනීමට පැහැදිලි නිර්ණායක සමුදායක් බුදුසමය ඉදිරිපත් කරයි. එම ක්‍රියාවේ අරමුණ හා ප්‍රතිඵලය යන දෙකම නිවැරැදි නම් එය සාධු සම්මත ක්‍රියාවක් බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. තමන් යම් ක්‍රියාවක් කිරීමට පෙර ඒ පිළිබඳව පරික්ෂාකාරීව විමසා බැලිය යුතු බව අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී ඇත. නිබබේදික පරියාය සූත්‍රයට අනුව කර්මය ලෙස පෙන්වා දී ඇත්තේ සචේතනික ක්‍රියා පමණි. ධම්මපදට්ඨ කථාව තුළින් පැරණි ගබ්සා ක්‍රමවේද පෙන්වා දෙයි. දරුගැබක් විනාශ කිරීමට බෙහෙත් දුන් භික්ෂුවක් පිළිබඳ තොරතුරු පරාජිකාපාළියේ එයි.ඒ හා සමාන තොරතුරු රාශියක් එහි වෙති. ජාතක පොතෙහි ථුස ජාතකය වැනි ජාතක කථා කිහිපයක මෙවැනි විස්තර ඇත. සුත්ත නිපාතයේ ධම්මික සූත්‍රයේ දී ප්‍රාණඝාත අකුසල කර්ම සිදු විය හැකි ක්‍රමත්‍රයක් පෙන්වා දෙන අතර කර්ම විපාක සකස් වීමට කරුණු 05 ක් සම්පූර්ණ විය යුතු බව දක්වයි. මවුකුස තුළ පියවර 05 ක වර්ධනයක් පිළිබඳ ඉන්දක සූත්‍රය පෙන්වා දෙයි. මෙලොව උපතක් ලැබීමට කරුණු 03 ක් සම්පූර්ණ විය යුතු බව මහා තණ්හාසංඛය සූත්‍රය සඳහන් කරයි.

***මුඛ්‍ය පද:*** අපරාධය, උපත්පාලනය, කලලය, ගර්භාෂය, නෛතික

---

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. mawellesumanasiri@gmail.com

[2] සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

# FACTORS AFFECTING EDUCATIONAL POVERTY AMONG SCHOOL CHILDREN IN THE ESTATE COMMUNITY: A STUDY IN PUPURESSA, KANDY

*Dinujaya Lakshan [1], H.D.P. Premarathne [2]*

Education is a fundamental right and essential for personal and social development. However, children in estate communities often encounter barriers that result in educational poverty. This study investigates factors contributing to this issue among schoolchildren in Pupuressa Grama Niladhari Division, Doluwa Divisional Secretariat, Kandy. It focuses on how socioeconomic conditions, poor school infrastructure, cultural limitations, and health issues hinder children's educational access and completion. To understand this phenomenon both ontologically and epistemologically, a mixed-methods approach was employed, allowing for cross-sectional breadth and in-depth exploration. A survey questionnaire and semi-structured interviews were conducted at Pupuressa Junior School with a stratified random sample of 55 schoolchildren. The findings show that 41.8% of children frequently lack essential school supplies due to their families' low incomes as tea plantation workers. Overall, children experience educational poverty marked by inadequate infrastructure, teacher shortages, limited computer and laboratory facilities, and other deficiencies. Notably, 76% of children lack access to a computer or internet at home. Limited access to nutritious meals and transportation further exacerbates absenteeism. The study concludes that educational poverty in this population arises from a complex interaction of socioeconomic, infrastructural, health, and cultural factors. A comprehensive, multi-stakeholder strategy is recommended, involving government, businesses, NGOs, and community leaders to provide teacher training, scholarships, nutritious meals, education on healthy eating habits, improved school infrastructure, and solutions for transportation issues. Addressing basic needs - such as subsidized supplies - and encouraging community involvement is essential to enhance these children's educational and overall quality of life.

***Keywords:*** Educational Poverty, School Children, Tea Plantation Community, Social Work Intervention, National Child Protection Authority

[1] Department of Sociology, University of Peradeniya. a20sw026@arts.pdn.ac.lk
[2] Department of Sociology, University of Peradeniya. pri.hapuarachchi@arts.pdn.ac.lk

# ලෝකයේ ගැටුම් නිරාකරණයට මනස උපයෝගී වන අයුරු බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එස්. රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්* [1]

වර්තමානය වන විට ලෝකයේ බොහෝ රටවල විවිධාකාරයේ යුද ගැටුම් නිර්මාණය වී තිබේ. ඒ සඳහා මනෝ මූලික වූ සාධක මෙන් ම දේශපාලනික, ආර්ථික, සමාජීය, සංස්කෘතික ආදි විවිධ හේතු මුල් වී ඇත. මෙම තත්ත්වය විසඳීමෙහිලා ලෝකයේ විවිධ සංවිධාන ක්‍රියාත්මක වේ. එහෙත් කිසිදු සංස්ථාවක් මිනිස් මනසේ ක්‍රියාත්මක වන යුදමය මානසිකත්වය බැහැර කිරීමට සමත්වේ ද? සංස්කෘත භාෂාවේ 'ඝර්ෂණ' යන පදයෙනුත් පාලියෙහි 'සංඝට්ටන' යන පදයෙනුත් ඉදිරිපත් වන 'ගැටුම' යන සිංහල ව්‍යවහාරය සඳහා ඉංග්‍රිසි භාෂාවේ යෙදෙනුයේ 'Conflict'යන්නයි. ගැටුමෙහි ආරම්භය, ගැටුම් සඳහා බලපාන හේතු සාධක, එහි ස්වභාවය, ගැටුමෙහි හේතුඵල සම්බන්ධතාව හා ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා බුදුදහම ඉදිරිපත් කරන විසඳුම් කවරේ ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමය මත පදනම් වී ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතීයික මූලාශ්‍රය මඟින් දත්ත ගවේෂණය කිරීම සිදු කරන ලදි. බෞද්ධ මතය අනුව සියලු යුද්ධ හටගන්නේ මිනිසුන්ගේ සිත් තුළ බව නිරීක්ෂණය විය. පාලි සූත්‍රයන්හි මානසික ක්‍රියාකාරීත්වය හැඳින්වීමට යොදන පද වන්නේ චිත්ත, මනෝ, විඤ්ඤාණ යන ඒවායි. මෙහි අදහස වන්නේ එක ම වූ මානසික ප්‍රවාහය බව සූත්‍ර සාහිත්‍යයේ ම දැක් වේ. බුදු සමයේ ඉගැන්වෙන විමුක්තිය උදාකර ගත හැක්කේ මිනිස් මනසේ ක්‍රියාත්මක වන ඍණාත්මක චිත්තවේග දුරු කරමින් ධනාත්මක චිත්තවේග වර්ධනය කිරීම තුලින් ය. ඒ බව මධුපිණ්ඩික, මහානිදාන, චක්කවත්ති සිහනාද හා අග්ගඤ්ඤ සූත්‍රයන්හි මනාව විසඳ වේ. ගැටුම් අතර යුද්ධය යන ගැටුම පිළිබඳ අවධානය යොමුකළ හොත් ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාකාරීත්වය සාමය වේ. සාමය සැබවින් ම නිර්මාණය විය යුත්තේ බාහිර ලෝකයේ නො ව පුද්ගලයාගේ මනසේ ය. සාමකාමී සමාජ සංස්ථාවක් බිහිවීම මඟින් සාමකාමී රටක් නිර්මාණය කිරීමට සමත් වේ. සිත දියුණු කර ගත් පුද්ගලයා වරදට නොපෙළඹෙන බවත් යුද්ධය මඟින් සදාතනික සාමය ඇතිකළ නොහැකි බවත් සාමය උදාකර ගත හැක්කේ ස්ව උත්සහය තුළින් බව නිගමනය විය.

***ප්‍රමුඛ පදඃ*** සංඝට්ටන, ඝර්ෂණ, ඍණාත්මක චිත්තවේග, ධනාත්මක චිත්තවේග, සාමකාමි මානසිකත්වය

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. rashmikawshalyapriyasad@gmail.com

# ආත්ම පරිත්‍යාගය, ආගමික ත්‍රස්තවාදය සහ ස්වදේශීය ආරක්ෂාව පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඉස්ලාම් සහ ක්‍රිස්තියානි දේවධර්මීය ආගම් ආශ්‍රයෙනි)

*වලවේ තුසිතසිරි හිමි* [1]

අන්‍ය සුභ සිද්ධිය උදෙසා තම ජීවන අරමුණු, අවශ්‍යතා හෝ අභිලාෂ අතහැර දැමීම ආත්ම පරිත්‍යාගය යි. තත්කාලීන සමාජ උන්නතිය උදෙසා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් බොහෝ ආගමික සංස්ථාවන්හි බිහිවීම සහ ස්ථාවරත්වය සිදු වූ නුමුදු අද්‍යතනය වන විට මෙම සංකල්පය අන්තවාදීත්වයෙන් ගෙන පොදු සමාජ අවනතිය පිණිස භාවිත වේ. ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරයන්හි අභිලාෂ පූරණය උදෙසා යොදා ගනිමින් ස්වදේශීය ආරක්ෂාවන් සඳහා ද තර්ජනයක් වෙමිනි. එහෙයින් ආත්ම පරිත්‍යාග සංකල්පය ආගමික ත්‍රස්තවාදයන් උදෙසා අභිප්‍රේරිත වන්නේ කෙලෙස ද යන ගැටලුව පාදක කොට එමඟින් සමකාලීන සමාජයට සිදුකරන බලපෑම පිළිබඳ ව ක්‍රිස්තියානි සහ ඉස්ලාම් දේවධර්මීය ආගම් ප්‍රාමාණික කොට මෙම අධ්‍යයනය සිදුකරන ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයෙහි සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමය පාදක කොට මෙම පර්යේෂණය සිදුකරන ලද අතර දත්ත සම්පාදනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත රැස් කරන ලදි. සත්‍ය ගවේෂණ සිද්ධාන්තය මත පදනම්ව කාලීන සමාජ අවශ්‍යතාව උදෙසා තම දෘෂ්ටියට අනුකූල වූ, ශුද්ධ වූ, උසස් යැයි සම්මත, පොදු යහපත පිණිස වූ අරමුණු උදෙසා ජීවිත පරිත්‍යාගයෙන් පවා කටයුතු කිරීම දේව ධර්මීය ආගම්හි ප්‍රවණතාව විය. නමුත් පශ්චාත් කාලීනව මෙම සංකල්පය ආගමෙහි නාමයෙන් දේශපාලන බලකාමීත්වය සහ පටු අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට ලක්විය. ශුද්ධ වූ කුරාණය සහ ඉස්ලාම් ධර්ම ග්‍රන්ථවල එන ජිහාඩ්, හදීස්, කුර්බානි, ෂරියා සහ ශුද්ධ වූ බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ එන ශුද්ධ යුද්ධය මෙන් ම එළිදරව්ව, ධාර්මිෂ්ඨ කෝපය වැනි ක්‍රිස්තියානි සංකල්ප ත්‍රස්තවාදී ව්‍යාපාරයන් විසින් තම මූලධර්ම ලෙස විකෘති කොට දක්වමින්, යුක්ති සහගත කරමින්, උත්කර්ෂයට නංවමින්, මනෝ මූලික මතවාදී දෘෂ්ටි නිර්මාණය කරමින් ආත්ම පරිත්‍යාග සංකල්පය සියදිවි නසාගැනීමේ උපාය මාර්ගික ක්‍රමවේදයක් ලෙස භාවිත කරයි. ඒ තම ජීවිතය විනාශ කරගැනීම පමණක් නොව අන්‍ය ජීවිත ද විනාශ කරන හෙවත් මරාගෙන මැරෙන ප්‍රහාර දක්වා වන මානසිකත්වයක් පුද්ගලයා තුළ නිර්මාණය කරමිනි. ජාත්‍යන්තර සාධක පසෙක තබා ශ්‍රී ලංකා රාමුව තුළ මෙම සන්දර්භය සාකච්ඡා කළ ද ඒ සඳහා වන සමීපතම උදාහරණ වන බැවින් රාජ්‍ය මැදිහත්වීම මත බුද්ධි අංශවල සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට නව්‍ය උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් සක්‍රීය කිරීම සහ සාමාන්‍ය ජනතාව මේ පිළිබඳ ව සවිඥානික කිරීම කාලීන අවශ්‍යතාවයකි.

***ප්‍රමුඛ පදඃ*** ආගමික ත්‍රස්තවාදය, ආත්ම පරිත්‍යාගය, දේවධර්මීය ආගම්, දේශපාලනය, ස්වදේශීය ආරක්ෂාව

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. wthusihasiri23@gmail.com

# THE FOUR *BRAHMA VIHĀRĀS* IN CHILD SEXUAL ABUSE PREVENTION

*Ven. Kotte Upananda* [1]

Child sexual abuse represents a pervasive global crisis with profound, lasting impacts on survivors, requiring compassionate, multifaceted approaches to prevention and support. This study addresses a gap in child protection frameworks by exploring how the Buddhist ethical principles of the Four *Brahma Vihāras* "*Mettā* (loving-kindness), *Karuṇā* (compassion), *Muditā* (empathetic joy), and *Upekkhā* (equanimity)" can be applied to both the prevention of child sexual abuse and the support of survivors. Grounded in the *Mettā Sutta* (*Saṃyukta Nikāya*) and supported by ethical guidelines in the *Vinaya Piṭaka*, this research investigates the role of these divine abodes as foundations for a spiritually informed, ethically grounded response to child abuse. The methodology includes a qualitative review of primary sources, such as the *Sutta Piṭaka* and *Vinaya Piṭaka* of the *Pāli* Canon, alongside secondary literature and real-time case studies. By examining both theoretical foundations and applied Buddhist practices, the study evaluates the potential of Buddhist ethics, mindfulness (referenced in the *Satipaṭṭhāna Sutta* of the *Majjhima Nikāya*), and loving-kindness (*Mettā Sutta* of the *Khuddakapāṭha*) as healing mechanisms for survivors. The findings reveal that the Four Brahma Vihāras form a unified framework fostering empathy, non-harming intentions, and emotional resilience, which help prevent child abuse and support survivor recovery. Practices such as *Mettā* and mindfulness meditation promote healing by cultivating self-compassion and stability, essential for trauma recovery. While applying these principles across cultures can be challenging, they retain universal relevance through their focus on compassion. This research concludes that integrating the Four *Brahma Vihāras* into child protection offers a compassionate, adaptable approach to address suffering and prevent harm globally, underscoring the need for ethical, spiritually grounded frameworks in child welfare initiatives worldwide.

***Keywords:*** Buddhist ethics, Child abuse prevention, Compassion, Four *Brahma Vihāras*, Mindfulness

[1] Department of Pali and Buddhist Studies, Sri Lanka International Buddhist Academy, Pallekele. tharindukamesh@gmail.com

# ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තීය ඒකාකෘති හා රැකියා තෘප්තිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්.එම්.කේ.ඩබ්ලිව්.කේ. කරුණාරත්න [1], එච්.ඩී.පී. ප්‍රේමරත්න [2]*

රැකියා තෘප්තිය යනු කෙනෙකුගේ රැකියා අත්දැකීම් ඇගයීමේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන්ට තම රැකියාව සම්බන්ධයෙන් දැනෙන තෘප්තිමත් මට්ටම වන අතර එයට සේවා පරිසරය සහ රැකියා භූමිකාවන් ගැලපීම වැනි සාධක බලපායි. ඉහල රැකියා තෘප්තිය ආයතනයේ මෙන්ම සේවක කාර්යසාධනය හා ඵලදායිත්වයට බෙහෙවින් වැදගත් වේ. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ රැකියා ඒකාකෘති යනු පුද්ගලයන්ගේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම්ව ඔවුන්ගේ භූමිකාවන් සහ ලක්ෂණ පිළිබඳ පූර්ව නිගමනයන් වේ. ඒවා රැකියා ස්ථානයේ ගතිකත්වයට, සේවකයන්ගේ අත්දැකීම් හා තෘප්තියට ද බලපායි. දැනට මේ පිළිබඳ සිදු කර ඇති පර්යේෂණ මගින් මෙම විචල්‍යයන් අතර සංකීර්ණ මෙන්ම පරස්පර සම්බන්ධතාවක් හෙළි කරයි. නමුත් බොහෝ අධ්‍යයනයන් රැකියා තෘප්තිය පුළුල් ලෙස ගවේෂණය කර ඇති අතර, රැකියා තෘප්තිය කෙරෙහි ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිවල බලපෑම තවමත් පර්යේෂණයට ලක් වී ඇත්තේ අඩු වශයෙනි. සමහර අධ්‍යයනවලින් කාන්තාවන් පිරිමින්ට වඩා ඉහළ තෘප්තිමත් මට්ටම් වාර්තා කරන අතර අනෙක් අතට වැඩ කොන්දේසි, සේවා තත්ත්වයන් සහ පුද්ගලික අපේක්ෂාවන් වැනි විවිධ සාධක පාලනය කිරීමේදී සැලකිය යුතු වෙනස්කම් නොමැති බව හෙළි කරයි. මෙම පර්යේෂණ හිඩැස ආමන්ත්‍රණය කරන අපගේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෘත්තිය ඒකාකෘති හා රැකියා තෘප්තිය අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීමයි. ප්‍රමාණාත්මක අධ්‍යයන ක්‍රමවේදය මුල්කොට ගනිමින් සංඛ්‍යානමය උපක්‍රම භාවිතයෙන් සිදු කෙරුණු මෙම පර්යේෂණය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේකැලේ පිහිටි කර්මාන්ත උද්‍යානයේ සේවකයන් 260ක නියැදියක් අහඹු ලෙස තෝරා ගැනුණි. පූර්ව පරීක්ෂාවකට ලක් කළ ප්‍රශ්නමාලාවක් යොදා ගනිමින් දත්ත රැස් කළ අතර දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිපායන විශ්ලේෂණ යොදා ගැනුණි. මෙම අධ්‍යයනයෙන් වෘත්තිය ඒකාකෘති සහ රැකියා තෘප්තිය අතර සෘණාත්මක සහ - සම්බන්ධතාවයක් පවතින බව අනාවරණය වූ අතර රැකියා ඒකාකෘති සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තිය ඒකාකෘතීන් අතර පැහැදිලි ලෙස සම්බන්ධතාවයක් නොමැති බව හඳුනා ගැනුනි. මෙම අධ්‍යයනය තුළින් නිගමනය කළ හැක්කේ රැකියා තෘප්තිය කෙරෙහි ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෘත්තීය ඒකාකෘති ප්‍රබල ලෙස සම්බන්ධතාවයක් පෙන්නුම් නොකරන බවයි. නමුත් ආයතනික වශයෙන් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම තුළින් රැකියා තෘප්තිය ඉහළ නැංවිය හැකි බව යෝජනා කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** වෘත්තීය ඒකාකෘති, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය, සේවා පරිසරය, රැකියා තෘප්තිය

[1] සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. kalanisocpdn@gmail.com

[2] සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. pri.hapuarachchi@arts.pdn.ac.lk

# කුලය යන සාධකය වර්තමානය වන විට සක්‍රීයව පවතින්නේද යන්න වීරගුල ග්‍රාමයේ මුල්කරගත් අධ්‍යයනයක්

*කේ.ඒ.ආර්. ශාලිකා [1], ඕ.අයි.ඩී. වීරනායක [2], යූ.කේ.සී.එම්. එදිරිසිංහ [3], එස්.ටී.එම්. සෙනවිරත්න [4], එච්.එම්.එස්. ඉමංශා [5]*

කුලය යන සමාජ ස්ථරායනය පෙන්නුම් කරනු ලබන ප්‍රමුඛතම සාධකයක් ලෙස පෙන්වාදිය හැකිය.ලාංකේය කුල ක්‍රමය හින්දු කුල ක්‍රමයෙන් බිඳී ආ නමුත් ලාංකේය ජන සමාජයට ආවේණිකව සිංහල කුල ක්‍රමය ඉදිරියට පරිණාමය විය.මහනුවර යුගයේදී කුලය යන නෛතික සංස්ථාවක් බවට පත්ව ඇත.වර්තමාන සමාජය තුල කුලය යන සමාජ ස්ථරායන සාධකය විවෘතව සමාජය නැතහොත් කුටුම්භ තුළ විවෘතව කතාබහට ලක්වන කරුණක් නොව.නමුත් ශ්‍රී ලාංකීය සමාජය තුල කුලය යන සාධකය සම්පූර්ණ ලෙස වර්තමාන සමාජ සංස්ථා තුළින් බැහැරව ගොස් නැත.කාන්තාවකගේ හෝ පුරුෂයෙකුගේ ජීවිතයේ "විවාහය" නැමැති සාධකය තුළදී බොහෝ විට කුලය යන සාධකයට ප්‍රමුඛස්ථානයක් ලබා දීම සිදුවේ. වර්තමානයේ නාගරික ප්‍රදේශවලට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රදේශවල කුලය යන සාධකය වැඩි වශයෙන් කතාබහට ලක්වන්නක් ලෙස පෙන්වාදිය හැකිය.මෙහි එන අධ්‍යයන ක්ෂේත්‍රය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වීරගුල ග්‍රාමයේ ගජබා මාවත නොහොත් පණ්ඩිතගම යනුවෙන් හඳුන්වන ප්‍රදේශය ඉලක්ක කර ගනිමින් පර්යේෂණය සිදුකර ඇත.මෙම පර්යේෂණ පත්‍රය මගින් ලංකාවේ කුලය යන සාධකය වර්තමානය වන විට සක්‍රීයව පවතින්නේද යන පර්යේෂණ ගැටලුව පිළිබඳව වීරගුල ග්‍රාමය මුල්කරගත් සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත.මෙහි ප්‍රධාන අරමුණ ලෙස වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුල කුලය මත පදනම් වූ සමාජ වෙනස්කම් පවතින්නේද යන්න සොයා බැලීම පිළිබඳවය.අනු අරමුණු ලෙස අධ්‍යාපන අවස්ථා මත කුලය බලපෑම් ඇති කරන්නේද, සාම්ප්‍රදායික වෘත්තිය වූ කුඹල් කර්මාන්තයෙන් පිට වෙනත් රැකියා කරන්නේද,වෘත්තීන් තෝරා ගැනීමේදී කුලය යන සාධකය බලපෑම් එල්ල කරන්නේ ද, වර්තමාන තරුණ පරපුර කුලය යන්න පිළිබඳ දරන මතවාද මොනවාද යන්න පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අනු අරමුණු වේ.මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර ක්‍රමවේදයක් භාවිතා කරනු ලැබීය.ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත මගින් තොරතුරු ඒකරාශී කරනු ලැබීය.ප්‍රාථමික දත්ත ලෙස නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා මගින් ද ද්විතීක දත්ත ලෙස ග්‍රාම නිලධාරී වාර්තා යොදා ගනු ලැබීය. මෙම පර්යේෂණය සඳහා පවුල් විසිපහක නියැදියක් භාවිතා කර ඇත. නිරීක්ෂණ ක්‍රමවේදය ලෙස සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය මෙහිදී යොදා ගනු ලැබීය. මෙහිදී අරමුණු සහගත නියැදීමේ ක්‍රමයක් භාවිතා කර ඇත.මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස කුලය යන සාධකය විවාහය,දේශපාලනය වැනි සමාජයේ තීරණාත්මක කාර්යයන්හිදී වැඩි වශයෙන්ම ඉස්මතු වන බව පෙනී ගියහ.තරුණ පිරිස් කුලය යන්න වැඩි තැකීමක් නොදක්වන බවද මෙම පර්යේෂණය මගින් සොයාගනු ලැබීය.සාම්ප්‍රදායික සමාජයේ කුලවත් පිරිස් පාරම්පරික වංශවත් බව පෙන්වීමට කුලය අවියක් ලෙස යොදාගන්නා බවට පෙනී ගියහ.ගම අවට සිටින අසල්වාසීන් වැඩි වශයෙන් මෙම පිරිස් සමාජ කොන් කිරීමට ලක්වන බව පෙනී ගියහ.ඒ අනුව මෙමගින් කුලය වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුළ සක්‍රීයව පවතින සංවේදී සමාජ කරුණක් ලෙස නිගමනය කළ හැකි බව පෙන්වා දිය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** ශ්‍රී ලාංකීය සමාජය, කුලය, විවාහය, අධ්‍යාපනය, දේශපාලනය

[12345] සමාජීය විද්‍යා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
ruvinisalikak@gmail.com

# විරැකියාව හමුවේ පීඩාවට පත්වන ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

*කේ.පී.කේ.එච්. කුමාරසිංහ* [1]

වර්තමානය වන විට විරැකියාව සෑම රටකම අභියෝගයක් බවට පත්වී ඇති අතර එය බොහෝ සෙයින් බලපෑම් කරන රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විරැකියාව නිර්වචනය කරනු ලබන්නේ අදාළ කාල පරිච්ඡේදය තුළ වැටුපකට, වේතනයකට, ලාභයකට පවුලේ ආදායම් වැඩි කිරීමට කිසියම් රැකියාවක් සොයමින් සිටින හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින එහෙත් රැකියාවක් නොමැති වීම ලෙසය. රැකියා විරහිත උපාධිධාරීන් මුහුණදෙන ගැටලු මොනවාද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. විරැකියාව හමුවේ පීඩාවට පත්වන උපාධිධාරීන් පිළිබඳ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කර විරැකියාව නිසා ඇති වන ප්‍රතිඵල හඳුනා ගැනීම මෙහි අරමුණ වේ. මෙම පර්යේෂණය මිශ්‍ර ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදුකරන ලදි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යොදා ගත් අතර එහිදී ද්විතීයික දත්ත ලෙස ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ලේඛන, ලෝක බැංකු වාර්තා යොදා ගන්නා ලදි. පර්යේෂණය නියැඳිය ලෙස දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අවුරුදු 25-30 ත් අතර රැකියා විරහිත උපාධිධාරීන් 25 දෙනෙකුගේ දත්ත පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. එහිදී ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස්කර ගන්නා ලදී. විරැකියාව හමුවේ පීඩාවට පත්වන උපාධිධාරීන් අධ්‍යයනය කළ විට වැඩි වශයෙන් විරැකියාවෙන් පෙළෙනුයේ කලා විෂය ධාරාව යටතේ උපාධිය හදාරනු ලබන උපාධිධාරීන් බව පෙනීයයි. පර්යේෂණ අධ්‍යයනයේ නිගමනය වශයෙන් විරැකියාව හමුවේ උපාධිධාරින් මානසික පීඩාවට ලක්වීම, තම දෙමාපියන් රැක බලා ගැනීම පිළිබඳ පසුතැවීම, විවාහය සම්බන්ධ ගැටලු ඇතිවීම, කලකිරීම, ප්‍රචණ්ඩත්වය වැනි සමාජ විරෝධී හැසිරීම් ඇතිවීම හඳුනාගත හැකිය. නවෝත්පාදන හඳුන්වාදීම, රැකියාවට ගැලපෙන පරිදි උපාධිධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම, යල්පැන ගිය අදහස් වලින් මිදී නූතනත්වයට ගැලපෙන පරිදි තාර්කික චින්තනයෙන් යුතුව කටයුතු කිරීමට දිරිදීම, රජයේ රැකියාවන් එකම අපේක්ෂිතාර්ථය නොවී පෞද්ගලික අංශයේ රැකියා වෙත ද යොමු කරවීම, ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණික දැනුම වැඩිදියුණු කරවීම, කලා උපාධිධාරීන්ගේ උපාධි රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි සකස් කරවීම, වර්තමානයට ගැලපෙන පරිදි විෂය සම්භාරය නවීකරණය කරවීම පර්යේෂණ යෝජනා අතර වේ.

***ප්‍රමුඛ පද:*** අභියෝග, උපාධිධාරින්, නවෝත්පාදන , විරැකියාව

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. hasinthakalani572@gmail.com

# නාගරික ප්‍රජාව දෛනිකව ආහාර පාලනය කිරීමේ අරමුණු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*යූ.පී. නිරෝෂා සඳමාලි* [1]

සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම ශ්‍රී ලාංකීය සෑම පුරවැසියෙකුගේ ම අපේක්ෂාව වේ. සෞඛ්‍යමත් ජීවිතයක අවශ්‍යතාවය මිනිසාගේ පැවැත්ම සඳහා අතිශය වැදගත් යුගයක, නාගරිකරණය හා විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමත් ඒ හරහා වෙනස් වූ ආහාර රටා, මිනිසාගේ පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලියේදී, බලපෑමකට ලක්ව ඇති වර්තමාන ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රජාවගෙන් විශාල පිරිසක් වර්තමානය වන විට ආහාර පාලන ක්‍රම වෙත යොමුවී ඇති බවත්, ඔවුන් සාම්ප්‍රදායිකව සම්මත ප්‍රධාන ආහාර වේල් වලට සීමා නොවී ආහාර පාලනය කරන්නේ ඇයි? යන්න පර්යේෂණ ගැටලුව වේ. ඒ අනුව ඔවුන්ගේ ආහාර පාලන අරමුණු හඳුනා ගැනිම ප්‍රධාන අරමුණ වේ. ඒ තුළින් ගොඩනගා ගත හැකි සමාජ ජීවිතය, සෞඛ්‍ය ක්‍රම, නව ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් අනාගත පරපුර දැනුවත් කිරීම මෙම අධ්‍යයනයේ උප අරමුණ වේ. අධ්‍යයන ප්‍රදේශය කොළඹ කුරුඳුවත්ත නිදහස් චතුරස්‍රය ආශ්‍රිත ප්‍රදේශය වේ. නියැදිය එම ස්ථානයට ව්‍යායාම් කටයුතු සඳහා පැමිණෙන පුද්ගලයන් 50 දෙනෙකු වේ. මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලබා ගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලී, නිරීක්ෂණ ක්‍රමය, ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ග්‍රන්ථද, තෘතීයික මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ආදිය ද පරිශීලනය කිරීම මගින් දත්ත ඒකරාශී කර ගැනීම සිදුවිය. ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ පර්යේෂණ සිදු කළ අතර, ගොනු කරගත් දත්ත ආශ්‍රයෙන් නූතන සමාජයේ පැවැත්ම සඳහා සෞඛ්‍යමත් ජීවිතයක අවශ්‍යතාව දැඩිව පවතින බවත්, එම මුඛ්‍ය අරමුණ කේන්ද්‍ර කරගත් නාගරික ප්‍රජාව වෘත්තිමය අවශ්‍යතා 8.9%, ලිංගික ගැටලු සම්බන්ධව, ලෙඩ රෝග වලක්වා ගැනීම හා අවම කර ගැනීම 19.6%, වැනි හේතු මූලික කර ගනිමින් ආහාර පාලන ක්‍රමවේද වෙත යොමු වීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති බව අනාවරණය වීම. නාගරික ජනතාව ආහාර පාලන ක්‍රමවේද වෙත යොමු වීමේ ප්‍රධාන හේතුව සමාජය තුළ කැපී පෙනෙන කඩවසම් පුද්ගලයෙකු ලෙස තම ප්‍රතිරූපය පවත්වා ගැනීම ම පමණක් නොව, ඊට එහා ගිය වෙනත් හේතු ද ඇති බව හඳුනාගත හැකි වීම. ආහාර පාලනය කිරීමේ අරමුණු එකිනෙකාට වෙනස් බවත්, එම සාධක විශ්ලේෂණය කරමින්, ඒ තුළින් මතුවන සමාජ විද්‍යාත්මක න්‍යායන් පිළිබඳ වර්තමාන මෙන්ම අනාගත පරපුර දැනුවත් කිරීම තුළින් පුද්ගල සංවර්ධනයට මෙන්ම, සමාජ සංවර්ධනයට ද දායක විය හැකි සමාජයක් ගොඩනගා ගැනීමට හැකි බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** ආහාර පාලනය, පෝෂණය, සංවර්ධනය, සෞඛ්‍ය, සමාජය

[1] Department of Social Sciences, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. upnsandamali99@gmail.com

# ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක්වන වින්දිතයින්ගේ පුනර්වින්දිතභාවය හා සුරක්ෂණය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

*එච්.පී.බී.සී. සෙව්වන්දි [1], ඒ.වයි.එන්.එච්. තරුෂිකා [2], එස්. නිලුෂිකා දිල්මිණි [3], ඩබ්.එම්.ඒ.ඩී. මුණසිංහ [4]*

වර්තමාන සමාජ සන්දර්භයෙහි ළමා ලිංගික අපයෝජන සුලභ වීම යන තත්ත්වය මූලික කරගනිමින් ළමා වියේදී ලිංගික අපයෝජනයට පත්වූ වින්දිතයකු දීර්ඝ කාලීනව පුනර්වින්දිතභාවයට පත්වීම හා එමගින් වින්දිතයන්ට සිදුවන සමාජ හා සංස්කෘතිකමය බලපෑම පිළිබඳව මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක් වූ වින්දිතයින් පුනර්වින්දිතභාවයට ලක් කරන සමාජ සංස්කෘතික සාධක හඳුනා ගැනීමයි. සෙසු අරමුණු වන්නේ පුනර්වින්දිතභාවය හරහා වින්දිතයාගේ ආකල්ප හා සමාජ අන්තර්ක්‍රියා පැවැත්වීමේ වෙනස්කම් අධ්‍යයනය කිරීම, ළමා ලිංගික අපයෝජනයට ලක්වූ වින්දිතයින් පුනර්වින්දිතභාවයෙන් සුරක්ෂණයට පවතින හිඩැස් හඳුනා ගැනීමයි. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුද්ගලයන් පහළොස් දෙනෙකුගෙන් යුක්ත අරමුණු සහගත නියැදියක් යොදාගෙන ඇති අතර ගුණාත්මක අධ්‍යයන ක්‍රමය ඔස්සේ පර්යේෂණය සිදුකර ඇත. ගැඹුරු සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කර ඇත. සමස්ත අධ්‍යයනය හරහා ළමා වියේදී ලිංගික අපයෝජනයට පත්වන වින්දිතයකු ප්‍රේම සම්බන්ධතා හා විවාහය යන කාරණාවලදී මෙන්ම රැකියාව සමග සම්බන්ධ වීම ආදී සමාජගත වීම්වලදී පුනර්වින්දිතභාවය ගොඩනැගෙන බව හා පුනර්වින්දිතභාවය තුළින් අඛණ්ඩ අධ්‍යාපනය බිඳවැටීම අධ්‍යයනයේදී අනාවරණය විය. එමෙන්ම වින්දිතයා ලේබල්කරණයට ලක් වීම හරහා පුනර්වින්දිතභාවයට ලක්වන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. සුරක්ෂණයේ පවතින හිඩැස් පිළිබඳව අවධානය යොමු කිරීමදී වින්දිතයාගේ මානසික තත්ත්වය සාමාන්‍යකරණයට පත් කිරීම මගින් සමාජගත වීමට බලපාන සෘණාත්මක ආකල්ප අවම කරමින් පෞරුෂත්වය සංවර්ධනය සඳහා මූලිකත්වය ගන්නා ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරීවය පුළුල් විය යුතු බවත්, විශේෂයෙන්ම නෛතික ප්‍රතිපාදන පුළුල් කරමින් නඩු විභාග සඳහා ගතවන කාලසීමාව හැකිතාක් අවම කිරීමට ආයතනික මට්ටමෙන් කටයුතු කිරීම ආදී අවශ්‍යතාවයන් සුරක්ෂණය හිඩැස් ලෙස මතුවිය. පුනර්වින්දිතභාවය මූලික කරගනිමින් වින්දිතයා තුළ පිරිමින්ට ඇති බිය, සමාජගත වීමට ඇති බිය වැනි තත්ත්වයන් මෙන්ම හුදෙකලාවට ඇති කැමැත්ත හා දීර්ඝ කාලීන මානසික වශයෙන් ඇතිවන රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇති බව ප්‍රතිඵල ලෙස අධ්‍යයනයේදී හඳුනාගත හැකි විය. අධ්‍යනයේ නිගමනය වන්නේ ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක්වන වින්දිතයා පුනර්වින්දිතභාවයට පත්වීම වැළැක්වීම හා වින්දිතයාගේ සුරක්ෂණය උදෙසා ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සමාජය, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් තුළ පවතින අවධානය අවම වී ඇති බවයි.

***ප්‍රමුඛ පදඃ*** වින්දිතයා, පුනර්වින්දිතභාවය, සමාජය, ළමා අපයෝජන, සංස්කෘතිය

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. sewwandichammika@gmail.com
[2]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.nilushikadilmini1205@gmail.com

# ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීම සම්බන්ධ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර උත්පලවන්නා ශ්‍රී විෂ්ණු දේවාලය ඇසුරෙන්)

*වී.ජී.ආර්. ලක්ෂාරා [1], බී.ජී.සී.එස්. අභිෂේක් [2]*

මානව අන්තර් සම්බන්ධතාවයේ නිර්මාණයක් වන සමාජය තුළ මුල් බැසගත් දිගුකාලීන සමාජ සංස්ථාවක් ලෙස ආගම හඳුනාගත හැකිය. ආගම වටා කේන්ද්‍රගත වී ඇති භක්තිය, බහුවිධ වූ පිළිගැනීම් හා මානව කේන්ද්‍රීය අදහස් සමාජය තුළ ගැටුම් නිර්මාණයට හේතු වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීම සම්බන්ධයෙන් හඳුනා ගැනීමයි. එමෙන්ම දෙවිනුවර ප්‍රදේශය තුළ ගැටුම් කළමනාකරණයට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීමක් පවතී ද යන පර්යේෂණ ගැටලුව මත පිහිටා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස මාතර දිස්ත්‍රික්කයේ උත්පලවන්නා විෂ්ණු දේවාලය යොදාගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනයට යොදා ගැනිණි. එහිදී දත්ත රැස්කිරීමේදී අරමුණු සහගත නියැදීම භාවිත කරමින් පුද්ගලයන් දස දෙනෙකු අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. එහිදී සම්මුඛ සාකච්ඡා, ඍජු නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයනයක් යොදාගත් අතර ලබාගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයේ අධ්‍යයන අනාවරණයන් ලෙස, අදාළ ප්‍රදේශය තුළ ගැටුම් ඇතිවීම කෙරෙහි මූලිකව දේවාල ක්‍රමය සහ දේවාල උපසංස්කෘතිය හේතු වී ඇත. දේවාල උපසංස්කෘතියේ අංගයක් වන පෙරහැර මංගල්‍යය හා සල්පිල අදාළ ප්‍රදේශය තුළ ගැටුම් නිර්මාණය කෙරෙහි ඍජුව බලපෑම් කර ඇත. එමඟින් අදාළ සමාජයෙහි සමාජ පර්යාය වෙනස් වෙමින් එය විසංවිධානීකරණයට ලක්වී සමාජය තුළ ගැටලු රැසක් උද්ගත වී ඇත. ගැටලු උද්ගතවීම සම්බන්ධ දේවාලයේ මැදිහත්වීම හඳුනා ගැනීමේදී අදාළ අවදානම් කළමනාකරණයට අවශ්‍ය පියවර ගෙන ඇත. එහිදී නීතිරීති පැනවීම, මූල්‍යමය පැහැදිලිතාව, සමාජ තහංචි සහ පරිපාලන ව්‍යුහයේ පවතින ස්වාධීනභාවය කැපී පෙනෙයි. එම පියවර සාධනීය ප්‍රතිඵල ලබා ඇති නමුත් ප්‍රාදේශීය දේවාල පද්ධතිය තම ආගමික ව්‍යුහය ජනප්‍රිය සංස්කෘතිය සමඟ බද්ධ කර ගැනීම තුළ දේවාල පද්ධතියේ සාම්ප්‍රදායික භූමිකාව වෙනස් වී සමාජ ක්‍රමයට බලපෑම් කර ඇති බව හඳුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** උපසංස්කෘතිය, ගැටුම් කළමනාකරණය, දෙවිනුවර උත්පලවන්නා ශ්‍රී විෂ්ණු දේවාලය, මානව කේන්ද්‍රවාදය, සමාජ විසංවිධානීකරණය

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ruvinilakshara2@gmail.com

[2] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. chamodshaminda1234@gmail.com

# KANDY ESALA PERAHERA AND ITS POWER RELATIONS

*Prasadika Rajapaksha [1], Thamali Kithsiri [2]*

Despite the religious and cultural significance, Temple of the Tooth (*Dalada Maligawa*) can be identified as a place where religion and politics are inseparable. The Kandy *Esala Perahera* (procession) at Temple of the Tooth reflects a combination of various rituals, customs, and influential beliefs that represent the Sinhala-Buddhist culture, and it is held annually every August. However, even today, the procession is an event organized and celebrated through various Kandyan power relations. Thus, this study aimed to identify how rituals, symbols, and ceremonial items in the Kandy *Esala Perahera* reflect the hierarchical power relations and the public perception towards it. Using a qualitative research methodology, primary data were gathered through field observations, in-depth interviews with selected dancers and administrative staff at the Temple of the Tooth and focus group discussions with selected young audiences. The results analyzed through the content analysis, explain two major dynamics of power relations in the contemporary Kandy *Esala Perahera*: the modern-day labor-based upcountry caste system and the unequal gender representation. Although significant changes in the labor-based caste system (feudal) have occurred, some [invisible] caste discriminations remain in the procession. Gender inequality in the Kandy *Esala Perahera* and even in Temple of the Tooth has never changed; female representation in the procession and the administration is hardly seen. Nonetheless, locals define the procession as a national identity, which reflects Sinhalese-Buddhist culture, but they do not address or observe the caste system and gender inequality. From the positions of dancers and drummers to the administration of the *Perahera*, it is governed by the Kandyan caste system. Thus, modern Kandy *Esala Perahera* is a cultural identity yet a political space where traditional power relations are maintained. Therefore, this study concludes that Kandy *Esala Perahera* is a modern-day political entity where culture is celebrated through traditional power relations.

***Keywords:*** Caste system, Esala Perahera, Gender, Politics, Power relations

[1] Department of Geography, Faculty of Arts, University of Peradeniya.
rajapakshaprasadika@gmail.com
[2] Department of Geography, Faculty of Arts, University of Peradeniya.
thamali.lk@gmail.com

# වයස්ගතභාවය හමුවේ වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*පී.ජී.එස්.ආර්. බණ්ඩාර* [1]

ලෝක ජනගහන වර්ධන වේගය පිළිබඳ සලකා බැලීමේදී දක්නට ලැබෙන පොදු ප්‍රවණතාවක් වන්නේ ජනගහනය තුළ වයස්ගත වූවන්ගේ ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ යාම වන අතර එය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමාජ ප්‍රගමනයට විශාල බලපෑමක් එල්ල කර ඇත. වයස්ගත වැඩිහිටියන් ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ අවුරුදු 60 ඉක්මවූ ප්‍රජාවයි. 2022 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ආහාර කාණ්ඩයේ උද්ධමනය 94.9% ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එහිදී රැකවරණය අහිමි වූ වැඩිහිටියෝ වඩාත් පීඩාවට පත් සමාජ කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාව වැඩිහිටි ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වන රටක් ලෙස නම් කර ඇති අතර 2031 වන විට ලංකාවේ රැකබලා ගත යුතු වන වයස්ගත ජනගහනය මිලියන පහක් වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇතැයි ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා වල දැක්වේ. වයස්ගත වීම වැළැක්විය හැකි දෙයක් නොවන අතර වැඩිහිටිවියට පා තැබීමත් සමග පුද්ගලයින් මුහුණ දෙන සමාජයීය, ආර්ථික, ශාරීරික සහ මානසික අභියෝග මොනවාද යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකළ පර්යේෂණයක් වන අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ පලාපත්වල සහ කවුඩුපැලැල්ල යන ප්‍රදේශ ආශ්‍රිතව අරමුණු සහගත නියැදීම හරහා තෝරාගත් වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් 25 දෙනෙකුගෙන් යුතු නියැදියක් තුළින් සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත ලබා ගත් අතර ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා පර්යේෂණ සාහිත්‍ය, සඟරා, ලිපි හා අන්තර්ජාලය වැනි ද්විතීයික මූලාශ්‍රයන් භාවිතා කෙරිණි. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව වයස්ගත වීම විවිධ අභියෝග සමග බැඳී පවතින අතර ඒවා අතර සමාජමය හුදකලාභාවය, සුභ සාධන අවශ්‍යතා වෙත ප්‍රවේශ වීම සඳහා ඇති බාධා, මූල්‍ය අනාරක්ෂිතභාවය, ඉච්ඡාභංගත්වය, නොසළකා හැරීම් නිසා ඇතිවන මානසික ගැටලු, සමාජ අවබෝධය හා දැනුවත්භාවය අවම වීම, ශාරීරික වශයෙන් දුර්වල වීම, බෝවන හා බෝ නොවන රෝගවලට ලක් වීම, මානසික ආතතිය, මතකය අඩුවීම හෙවත් ඩිමෙන්ශියා වැනි මානසික රෝගවලට ගොදුරු වීම යනාදී අභියෝග අධ්‍යයනය තුළින් ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි විය. සමාජ අගතීන්, පටු ආකල්ප සහ ප්‍රමාණවත් නීතිමය, සමාජමය රැකවරණයක් නොමැතිකම සහ සමාජ දැනුවත්භාවය සහ සදාචාරාත්මක වටිනාකම් නොමැතිකම වැඩිහිටි විය අභියෝගයකට ලක් කර තිබෙන ආකාරය හඳුනාගත හැකි විය. වයස්ගත වූවන් මුහුණ දෙන මෙම ගැටලු විසඳීම රාජ්‍යයන්ට මෙන්ම ප්‍රජාවටද ඉතා විශාල අභියෝගයක් වී ඇත. ඒ අනුව ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සහ සමාජ දැනුවත්භාවය ඇති කිරීම හා වැඩිහිටියන් රැක බලා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ප්‍රතිපත්තිමය, නීතිමය, සමාජමය සහ ආකල්පමය වර්ධනයක් සිදුකරලීම තුළින් සමාජය තුළ වැඩිහිටියන් මුහුණ දෙන අභියෝගයන්ට තිත තැබිය හැකිවනු පිණිස මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල රුකුලක් වේ යැයි අපේක්ෂා කෙරේ.

***ප්‍රමුඛ පද:*** වැඩිහිටි ප්‍රජාව, සමාජ ප්‍රගමනය, වයස්ගත භාවය, සමාජමය හුදකලාභාවය, ඩිමෙන්ශියාව

[1] සමාජවිද්‍යා අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය.
bandarasachini222@gmail.com

# ඔටිසම් දරුවන්ගේ භාෂා හැකියාව වර්ධනය කිරීමට රැකබලාගන්නන් සිදුකරන සංගීත ප්‍රතිකාරයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*පී.එස්. නේෂලා [1], ආර්.එම්.ජී. කරුණාරත්න [2]*

ඔටිසම් යනු සංවර්ධන අක්‍රමතාවයක් වන අතර,එහිදී ප්‍රධාන තර්ජනයට ලක්වන සංවර්ධන ක්ෂේත්‍රයක් ලෙස භාෂා වර්ධනය සැලකිය හැක. ඔටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කිරීම අසීරු කාර්යයක් වන අතර භාෂාව වර්ධනයට ඔවුන්ගේ රුචිකත්වයට ගැලපෙන භාෂා මැදිහත්කරණ ක්‍රමවේදයක අත්‍යවශ්‍යතාවය ඔටිසම් දරුවන් බහුලව අත්විඳින ගැටලුවකි. මැදිහත්කරණ ක්‍රමවේදයක් ලෙස රැකබලාගන්නන් හා සිදුකරන සංගීත ප්‍රතිකාරයේ බලපෑම ඔටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි බලපෑමක් සිදු කරන්නේද යන්න හඳුනාගැනීම මෙම අධ්‍යයනය තුළින් සිදුකරයි.අධ්‍යනයේ අරමුණු ලෙස ඔටිසම් භාෂාව වර්ධනය කෙරෙහි සංගීත ප්‍රතිකාරයේ බලපෑමක් පවතින්නේද යන්න හඳුනාගැනීම,සංගීත ප්‍රතිකාරයේ බලපෑම ස්ත්‍රී පුරුෂ හා වයස් මට්ටම් අනුව ඔවුන්ගේ භාෂාව වර්ධනයට කුමන ආකාරයේ බලපෑමක් සිදු සිදු සිදුකරන්නේද හඳුනා ගැනීම,භාෂා ග්‍රහණය ප්‍රකාශිත භාෂාව වර්ධනය කෙරෙහි කුමන ආකාරයේ සහසම්බන්ධතාවයක් පවතින්නේ ද යන්න හඳුනාගැනීම උප අරමුණු වේ.පහසු නියැදීමේ ක්‍රමය මත පදනම්ව ගම්පහ දිස්ත්‍රික්කයේ විශේෂ පාසලක් හා කළුබෝවිල රෝහල අනුබද්ධිත ආබාධ පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව වයස 3-7 ඔටිසම් දරුවන් 50 දෙනෙකු සම්බන්ධ කරගත් අතර එහිදී සහභාගිවන ඔටිසම් දරුවන්ගේ දෙමාපියන්ට සංගීත ප්‍රතිකාරය සිදු කරන ආකාරය පිළිබඳ තොරතුරු ලබා දී එම දරුවන්ට දෙමාපියන් හා එකතුව මාස දෙකක සංගීත ප්‍රතිකාරය පුහුණු වීමට අවකාශ සැලසිය. ප්‍රතිකාරය ලබාදීමට පෙර, දෙමාපියන් හා සංගීත ප්‍රතිකාරය පුහුණුව මාස දෙකකට පසු, භාෂා සංවර්ධනය මැනීම සඳහා ආඛ්‍යාන මෙවලමක් භාවිතා කරන ලදි. සංගීත ප්‍රතිකාරයේ ගීතවල වචන හයක් සුවිශේෂී අවධානයකින් යුක්තව ඉගැන්වීම සිදු කරන අතර, ආඛ්‍යාත මෙවලම හරහා භාෂා සංවර්ධනය ලෙස මැනීම සිදුවූයේ ඉහත අවධාරණය කළ සුවිශේෂ වචන වේ. දත්ත විශ්ලේෂණය SPSS සංඛ්‍යාන විද්‍යාත්මක මෘදුකාංගය යොදාගත් අතර, සංගීත ප්‍රතිකාරයට පෙර හා පසු භාෂා සංවර්ධනයේ වෙනසක් ඇති ද යන්න අධ්‍යයනය කිරීම හා සංගීත ප්‍රතිකාරයෙන් පසුව වයස් කාණ්ඩයන් අනුව භාෂා සංවර්ධනයේ වෙනසක් පවතින්නේ ද යන්න අධ්‍යයනය කිරීමට Paired-Samples T-Test යොදා ගත් අතර, එහිදී සංගීත ප්‍රතිකාරයට පෙර හා පසුව භාෂා පරීක්ෂණය හිදී හා සංගීත ප්‍රතිකාරයෙන් පසු එකිනෙකා වයස් කාණ්ඩයන් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් හඳුනා ගන්නා ලදි. සංගීත ප්‍රතිකාරයෙන් පසු ස්ත්‍රී පුරුෂ අනුව භාෂාව වර්ධනයේ වෙනසක් පවතින්නේද යන්න අධ්‍යයනය කිරීමට Independent Sample T-Test යොදාගත් අතර, ඒ අනුව සංගීත ප්‍රතිකාරයෙන් පසුව ස්ත්‍රී පුරුෂ අනුව භාෂා සංවර්ධනයේ සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු වෙනසක් හඳුනා ගන්නා ලදී. භාෂා ග්‍රහණය ප්‍රකාශිත භාෂාව වර්ධනය කෙරෙහි බලපෑම අධ්‍යයනයට පියර්සන් සහ සම්බන්ධතා සංගුණකය භාවිත කර අතර එහිදී සහ සම්බන්ධතාවයක් පවතින බවට හඳුනා ගනී. ඔටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි සාර්ථක මැදිහත්කරණ ක්‍රමවේදයක් ලෙස මෙම ප්‍රතිකාරය භාවිතා කළ හැකි බවත්, ප්‍රතිකාරයේ ගුණාත්මක බව තවදුරටත් වර්ධනය කරමින් ඔටිසම් දරුවන්ගේ භාෂාව වර්ධනය කෙරෙහි යොදා ගැනීම ඔවුන්ට මහත් පිටුවහලක් වනු ඇත.

***ප්‍රමුඛ පද:*** ඔටිසම්, භාෂාව වර්ධනය, රැකබලාගන්නන්, සංගීත ප්‍රතිකාරය

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. neshalasanduni@gmail.com

[2] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය.

# වැව ආශ්‍රයෙන් ගොඩනැගුණු ග්‍රාම නාමකරණයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී.එල්. හේරත් [1]

සාමූහික සත්ත්වයෙකු වූ මිනිසා පැවැත්මේ පහසුව සහ සුරක්ෂිත බව උදෙසා ජනාවාස වීම ආරම්භ කරන ලදි. එම ක්‍රියාවලියේදී ඔවුන් තම ජනාවාස සෙසු ජනාවාසයන්ගෙන් වෙන්කර දැක්වීම උදෙසා ජනාවාස නාමකරණය කිරීම අවශ්‍ය විය. ඒවා පිහිටි බිමෙහි භූගෝලීය සහ ජන සමාජයෙහි විශේෂතා සහ විෂමතා කරණ කොට නිර්මාණය විය. මෙය ලාංකේය ජන සමාජය වෙතත් බලපත්වන ලද කරුණක් වූ අතර මෙරට ප්‍රධාන ජනාවාස ආකෘතියක් වූ ලාංකේය ග්‍රාමයන්හි නම් වහර එවැන්නකි. එකී ලාංකේය ගම් නම් වහර උදෙසා වැව ආශ්‍රය වූයේ කෙසේ ද යන්න පිළිබඳ සොයා බැලීම පර්යේෂණයේ අරමුණ වේ. ඒ අනුව මෙම පර්යේෂණය උතුරුමැද සහ වයඹ යන පළාත්වල තෝරා ගත් ග්‍රාමයන් කිහිපයක ගැමියන්ගෙන් එකී ග්‍රාමයන්හි ගම් නම් වහර සම්බන්ධ ජනප්‍රවාද , ඓතිහාසික තොරතුරු ආදීය විමසා දැන ගැනීමෙනුත් ශ්‍රී ලංකේය ගම් නම් වහර පිළිබඳ වූ මූලාශ්‍රගත තොරතුරු අධ්‍යයන කිරීම යන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන ලදි. වැවක් මූලික කරගනිමින් නිර්මාණය වූ ග්‍රාමයන් ප්‍රධාන වශයෙන් 'වාපි ගම්' සහ 'වැ ගම්' නමින් හඳුන්වනු ලබයි. මේ සඳහා 'පලිවාපිගම' සහ 'වැක' යන ග්‍රාම නාමයන් උදාහරණයන් වේ. මෙකී ග්‍රාම නාම කාණ්ඩයේදී සුලබව දැකගත හැකි නම් විශේෂය නම් වැව යන පදය උපසර්ගානුකූල ව හෝ සන්ධි වීමකින් වෙනත් පදයක් හා එක් වී ගොඩනැගුණු 'මහව', 'ගල වැව', 'කුඩා වැව' ආදි ග්‍රාම නාමයන්ය. තවද මේ පිළිබඳ විමර්ශනය කිරීමේදී තවත් ග්‍රාම නාම ආකෘති කීපයක් හමු වූ අතර ඒවා 'කුඹ', 'කුලම', 'කුලුව' සහ 'කුලිය' යන පද ආබද්ධයෙන් ගොඩනැගුණු ග්‍රාම නාමයන්ය. මේ සඳහා 'කුඹුක්කන්', 'මරදන්කුලිය', 'මදවක්කුලම', 'මොණ්ණෑකුලම' යන ග්‍රාම නාම උදාහරණයන් වේ. මෙහිදි 'කුලම' යන්නෙන් නිර්මාණය වූ නාමයන් සඳහා දමිළ බසෙහි ආභාෂය ලැබී ඇත. එසේම වැව ආශ්‍රයෙන් සුසැදි ග්‍රාම නාමයන් පිළිබඳ මිථ්‍යා මතද වේ. එනම් 'ලැව' යන 'ලැහැබ' යන්නට සමාන අරුත් දෙන වචනය සන්ධි වීමෙන් ගොඩනැගුණු 'දිවුල්ලැව', 'මීවැල්ලැව' ආදි ග්‍රාමනාමයන් උච්චාරණයේදී වැව යන්නට සමාන උච්චාරණයක් සිදුවන බැවින් එම නාමයන් වැවක් මූලික කරගනිමින් සිදු ව ඇතැයි යන විශ්වාසයයි. මෙම කරුණු සියල්ල දෙස බැලීමේදී ලාංකේය ගම් නම් වහර උදෙසා වැව මඟින් පැහැදිලි බලපෑමක් සිදු ව ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** ජනාවාසකරණය, ගම් නම් වහර, වැව, වියළි කලාපය, වාපි ගම්

[1] බෞද්ධ අධ්‍යයන සඳහා නාගානන්ද ජාත්‍යන්තර ආයතනය. buddhikalherath@gmail.com

# ශ්‍රී ලංකාවේ අවිවාහකත්වය කෙරෙහි බලපාන සාධක හා එහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ජේ.පී.එන්.අයි. සඳමාලි [1]*

මානව ශිෂ්ඨාචාරය ආරම්භයේ සිටම විවාහය හා පවුල සමාජ ව්‍යුහය නිර්මාණය කිරීමෙහිලා ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත. සමාජයක අඛණ්ඩ පැවැත්ම සඳහා මිනිසුන් අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සමාජයීය, නීතිමය වශයෙන් අනුමැතිය ලැබෙන්නේ විවාහය තුළිනි. ඒ අනුව විවාහය යනු පුද්ගල හා කාන්තාවක් අතර ශාරීරික, නීතිමය හා සමාජමය වශයෙන් ඇති කරනු ලබන සබඳතාවකටය. කාලානුරූපීව විවිධ සමාජ බලවේගවල බලපෑම නිසා විවාහ සංස්කෘතියද වෙනස් වී ඇත. වර්තමානයේ විවිධ බලවේගවල බලපෑම හේතුවෙන් විවාහ නොවීම කෙරෙහි බලපාන සාධක මොනවාද යන ගැටලුව පදනම් කරගෙන සිදුකළ මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ අවිවාහකත්වය කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමයි. ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සිදුකළ මෙම පරීක්ෂණයේ දත්ත රැස් කිරීමට අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා භාවිතා කළේය. අරමුණු සහගත නියැදි තේරීම යටතේ නියැදිය ලෙස කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වයස අවුරුදු හතලිහට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම තිස් දෙනෙකු තෝරාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා තේමා විශ්ලේෂණ ක්‍රමය යොදාගන්නා ලදී. සොයා ගැනීම් වලට අනුව විවාහ නොවීම කෙරෙහි බලපාන පුද්ගලික සාධක හා සමාජ සාධක ලෙස ප්‍රධාන වර්ග දෙකක් හඳුනාගත හැකි විය. පුද්ගලික සාධක ලෙස අධ්‍යාපනය, දරිද්‍රතාව, රෝගී තත්ව, වයස්ගත වීම ආදියද සමාජ සාධක ලෙස කුලය, දෑවැද්ද, ජාතිය, ගෝලීයකරණය ආදී නවීන සමාජ වෙනස්වීම්වල බලපෑම හඳුනාගත හැකි විය. එසේම අවිවාහකත්වය නිසා පුද්ගලයින් මානසික අවපීඩනය, කාංසාව, සමාජ හුදකලාව ආදී මානසික ආබාධවලවලදී ගොදුරු වන බව අවබෝධ විය. මෙම තත්ත්වයන් පිරිමින්ට වඩා කාන්තාවන් අතර බහුලය. අවිවාහක පුද්ගලයින්ට අදාළ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සිදුකළ යුතු බවත් එමගින් අවිවාහක පුද්ගලයන්ට සිදුවන බලපෑම අවම කිරීමටත් සමාජ ප්‍රගමනයටත් දායක විය හැකි බවත් අවබෝධ විය.

***ප්‍රමුඛ පද:*** පුද්ගලික සාධක, විවාහ නොවීම, සමාජ ප්‍රගමනය, සමාජ වෙනස්වීම, සමාජ සාදක

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. isurikasandamali96@gmail.com

# නව යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම හරහා පවුල් සංස්ථාවට සිදු වී ඇති බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක ඇගයීමක්

*එම්.ඒ. දමීෂා නෙත්මිණි [1]*

ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස සබැඳි ක්‍රීඩාවන් ලාංකේය සමාජයට අවතීර්ණව ඇත. යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමු වීමෙන් ඔවුන් අයත් කුටුම්භයන්ට සිදුව ඇති ධනාත්මක හා ඍණාත්මක බලපෑම් අධ්‍යයනය කිරීම අධ්‍යයනයේ වැදගත්කමයි. යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම තුළ පවුල් සංස්ථාවට සිදු වී ඇති බලපෑමේ ස්වභාවය කවරේද යන්න හඳුනා ගැනිම අධ්‍යනයේ මූලික අරමුණ විය. නව යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩාවලට යොමුවීම හරහා පවුල් සංස්ථාවට සිදුවී ඇති බලපෑම කෙබඳුද යන්න අධ්‍යයන ගැටලුවයි. එහිදී කුටුම්භයට සිදුව ඇති බලපෑම පැතිකඩ ත්‍රිත්වයක් ඔස්සේ එනම්, ක්‍රීඩාවේ නියැලෙන්නන්ට, ඔවුන්ගේ දෙමාපියන්ට, සෙසු සහෝදර සහෝදරියන්ට සිදු වූ බලපෑම වශයෙන් සාකච්ඡාවට ලක් කර ඇත. පර්යේෂණ ක්ෂේත්‍රය වූයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පානමුල්ල ග්‍රාම නිලධාරී වසමයි. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම ක්‍රීඩාවේ නියැලෙන්නන් 15, ඔවුන්ගේ දෙමාපියන් 15, සෙසු පවුලේ දරුවන් 15 බැගින් ප්‍රතිචාරකයින් 45ක් සසම්භාවී නොවන හිමබෝල නියැදිය ඇසුරෙන් දත්ත ලබා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේදී ද්විතීයික සහ ප්‍රායෝගික මට්ටමෙන් ලබාගත් අත්දැකීම් ඇසුරෙන් ඍජු, වක්‍ර, සහභාගීත්ව නිරීක්ෂණයන්, ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඇසුරෙන් ත්‍රිකෝණබද්ධකරණය හරහා තේමා අන්තර්ගත ගුණාත්මක විශ්ලේෂණයත්, SPSS හරහා ප්‍රමාණාත්මක විශ්ලේෂණයත් උපයුක්ත කරගැනුණි. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව ක්‍රීඩාවේ නිරතවන්නන්ට එල්ල වූ බලපෑම් 14කි. එහි ධනාත්මක බලපෑම් මෙන් දෙගුණයකට වඩා වැඩි අගයක් ඍණාත්මක බලපෑම් විය. ප්‍රධානම බලපෑම ලෙස අධියතාර්ථයේ පවතින තත්වයන් ප්‍රායෝගික ජීවිතයේ කොටසක් කරගනිමින් ආකල්පමය වශයෙන්, චර්යාත්මක වශයෙන් ප්‍රචණ්ඩකාරී වීමත්, ධනාත්මක ප්‍රතිඵල ලෙස මානසික තෘප්තිය සහ තර්කානුකූල දැනුම වර්ධනයට ඉවහල් වී ඇත. දෙමාපියන්ට සහ සෙසු දරුවන්ට ඇති වූ බලපෑම් 09කි. එහි සාධනීය බලපෑම් මෙන් තෙගුණයකට වඩා වැඩි අගයක් නිශේධනාත්මකය. ඉන් ප්‍රධානතම බලපෑම ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇති වීමත්, මිල මුදල් නාස්තිය, සෙසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීමත්, සාධනීය බලපෑම් ලෙස නව අදායම් මාර්ගයක් ලෙස කුටුම්භයට අන්තර්ජාල මුදල් හිමිවීමත්, ක්‍රීඩාවල නිරතවන දරුවන් හමුවේ දෙමාපියන්ට නව තාක්ෂණික දැනුම ලැබීමත් ප්‍රතිඵලය. සමස්ත පර්යේෂණය තුළින් යෞවනයන් අන්තර්ජාල ක්‍රීඩා ඇබ්බැහිව භාවිතයෙන් කුටුම්භයට සිදුකර ඇති බලපෑම කෙරෙහි සමාජ පන්තිය, ආර්ථිකය වැඩි වශයෙන් හේතු පාදකව ඇත. අධ්‍යයනයෙහි වැදගත්කම වනුයේ ඉදිරි අනාගතයේදී සමාජගත වීමට සිටින දරුවන්ට නිවැරදි මාධ්‍ය සාක්ෂරතාවයක් ලබාදෙමින් අන්තර්ජාල ක්‍රීඩා භාවිතය ඵලදායි අයුරින් කළමනාකරණය හරහා පවුල් සංස්ථාවට සිදුවන අයහපත අවම කරමින්, ධනාත්මක බලපෑම් කුටුම්භයට අවශෝෂණය කරවමින් පවුල් සංස්ථාව ඔස්සේ සමාජ සංවර්ධන කාර්යයට සහය දැක්වීමට මං පෙත් විවර කරදීමයි.

***ප්‍රමුඛ පද:*** අධ්‍යාපනය, අන්තර්ජාල ක්‍රීඩා, ආර්ථිකය, කායික හා මානසික සෞඛ්‍යය, නව යෞවනයන්

[1] සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලය.
dameeshanethmini55@gmaiil.com

# අකුරණ ගම්මානයේ පිගාඔය පිටාර ගැලීමෙන් ඇතිවන ගංවතුර තර්ජනයේ සමාජීය බලපෑම හා එය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.

*පී.ජී.ඩී.එස්. පිලැස්සගේ [1]*

පිගා ඔය (PO) යනු ශ්‍රී ලංකාවේ විශාලතම ගංගාව වන මහවැලි ගඟේ මැද ඇළ වෙත ළඟා වන අතු ගංගාවකි. පිගා ඔය හි කොටස් පසුගිය දශක කිහිපය තුළ අධික වර්ෂාපතන සිදුවීම් වලදී ගංවතුර සිදුවීම් කිහිපයක් වාර්තාවී තිබේ. ආසන්නතම ගංවතුර වාර්තා වූයේ 2022 දෙසැම්බර් 25 වන දින කුණාටුවකින් පසුව ය. ප්‍රධාන වශයෙන් මහනුවර - යාපනය (A9) මාර්ගය ඔස්සේ අකුරණ සිට කටුගස්තොට දක්වා ජලයෙන් යටවීම පැය 4ක කාලයක් ගමනාගමනයට බාධා එල්ල විය. ඇතැම් ප්‍රදේශවල ජලයෙන් යටවීම මාර්ග මට්ටමේ සිට අඩි 9ක් දක්වා ඉහළ ගොස් ඇත. පසුගිය දශක කිහිපය තුළ වේගවත් අනවසර නාගරීකරණය, ගංගා මායිම්වල ඉදිකිරීම්, පිටාර ගලා යන ප්‍රදේශ පිරවීම සහ පිගා ඔය ජල පෝෂක ප්‍රදේශයේ (කි.මී.83) ඉඩම් පරිහරණ වෙනස්වීම් හඳුනාගෙන ඇත. මේ අනුව, එය මතුපිට ගලා යාම වැඩි කරන අතර එය ගංවතුරට හේතු විය. මෙම ගංවතුර හේතුවෙන් දේපළ හානි, කෘෂිකාර්මික හානි සහ දෛනික ජීවිතය අඩාල වී ඇත. පිගා ඔය පිටාර ගැලීම නිසා ඇතිවන සමාජීය බලපෑම සහ ගංවතුර අවදානම අවම කිරීම සඳහා පුළුල් උපාය මාර්ග සකස් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ගංවතුර ඇතිවීමේ මූල හේතු හඳුනා ගැනීම, ගමේ අවදානම තක්සේරු කිරීම සහ අනාගත ගංවතුර සිදුවීම්වල බලපෑම අවම කිරීම සඳහා ප්‍රායෝගික විසඳුම් යෝජනා කිරීම උප අරමුණුවලට ඇතුළත් විය. අධ්‍යයනය මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් ඉඩම් පරිහරණ රටාවන්, යටිතල පහසුකම් තත්ත්වයන් සහ ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කරන ලද අතර, ප්‍රජා සහභාගීත්ව ක්‍රියාකාරකම් මගින් ගංවතුර සහ හැකි අවම කිරීමේ උපාය මාර්ග පිළිබඳ දේශීය දැනුම සහ ඉදිරි දර්ශන එක්රැස් කරන ලදී. නිර්දේශිත අවම කිරීමේ උපාය මාර්ග අතරට වැව් සහ රැඳවුම් පොකුණු වැනි ගංවතුර පාලන ව්‍යුහයන් ඉදිකිරීම, ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම සහ තිරසාර ඉඩම් පරිහරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය. මෙම යටින් පවතින හේතූන් ආමන්ත්‍රණය කිරීමෙන් සහ අවම කිරීමේ ප්‍රයත්නයන් සඳහා ප්‍රජාවගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමෙන්, අධ්‍යයනය නිගමනය කරන්නේ අකුරණ ගම්මානයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කළ හැකි බවත්, අවසානයේ එහි පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ ගංවතුර අවදානම් කළමනාකරණය සඳහා වඩාත් තිරසාර ප්‍රවේශයකට මඟ පෑදිය හැකි බවත් ය.

***ප්‍රමුඛ පද:*** අකුරණ, පිගාඔය, ගංවතුර, තර්ජන, ජලාපවහන, ප්‍රජා සහභාගීත්වය

[1] සමාජවිද්‍යා අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය. ssh2020326@ssh.rjt.ac.lk

# Tourism
# &
# Hospitality Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# INTERDISCIPLINARY APPROACHES TO ADDRESSING GLOBAL CHALLENGES IN TOURISM AND HOSPITALITY MANAGEMENT

*A.M.V.P.W. Abeykoon [1]*

The tourism and hospitality industry, a major contributor to global economic development, faces unprecedented challenges ranging from climate change and resource depletion to socio-economic disparities and cultural preservation. Addressing these complex and interconnected issues requires an interdisciplinary approach that leverages insights from environmental science, economics, social sciences, and technology. This research explores the integration of diverse disciplines to develop comprehensive strategies for sustainable tourism and hospitality management. By examining case studies from various global regions, the study highlights successful interdisciplinary collaborations that have led to innovative solutions. Key areas of focus include the implementation of green technologies to reduce environmental impact, the promotion of cultural heritage and community-based tourism to enhance socio-economic benefits, and the application of data analytics to optimize resource management and customer experience. The findings underscore the importance of cross-disciplinary cooperation in tackling global challenges. Environmental scientists, economists, sociologists, and technologists must work together to create resilient and adaptive management practices. This holistic approach not only enhances the sustainability of the tourism and hospitality sectors but also contributes to broader goals of economic equity, cultural preservation, and environmental stewardship. This research provides actionable insights for industry practitioners, policymakers, and academic researchers. It advocates for the establishment of interdisciplinary frameworks and educational programs to foster a new generation of tourism and hospitality leaders equipped to navigate and mitigate global challenges. By embracing interdisciplinary collaboration, the tourism and hospitality industry can play a pivotal role in promoting sustainable development and achieving the United Nations SDGs.

***Keywords:*** Interdisciplinary Approaches, Global Challenges, Sustainable Tourism, Environmental Impact, Cultural Heritage

[1] Department of Environmental Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. ssh2020005@ssh.rjt.ac.lk

# INVESTIGATING THE CHALLENGES FACED BY TOURISTS IN KALPITIYA, SRI LANKA

*A.M.P.I. Amarakoon* [1]

Kalpitiya, located on the northwest coast of Sri Lanka, is recognized as one of the island's popular tourist destinations. Its unique appeal attracts both domestic and international tourists, making it a standout location for those seeking relaxation and excitement amidst Sri Lanka's coastal landscapes. However, there are several challenges in Kalpitiya that impact the overall tourist satisfaction and the sustainability of the region's tourism development. The objectives of this study are to identify the key challenges faced by tourists in Kalpitiya and to suggest strategies for the identified issues. The study adopts the qualitative approach, utilizing both primary and secondary data sources. Primary data was collected through site observation and semi-structured interviews with 30 respondents, including tourists, tour operators, hotel operators, and local residents. Secondary data was gathered from previous publications, journal articles, reports, and websites. The collected data was analysed using thematic analysis. The findings of the study revealed that tourists face significant challenges, including mosquito infestations, stray cattle, inadequate sanitation facilities, incomplete highway development, insufficient street lighting, poor maintenance of the beach park area, a lack of a long-term water supply scheme, and the provision of temporary liquor licenses to tourist hotels. These issues cause considerable inconvenience to tourists. To prevent these challenges, the study suggests recommendations such as enhancing sanitation facilities, completing infrastructure projects, better waste management, implementing robust safety measures, and ensuring environmental preservation. They help to ensure a balance between providing a positive visitor experience and preserving local environments and resources for long-term sustainability.

***Keywords:*** Kalpitiya, Challenges, Sustainable Tourism, Tourist Satisfaction, Long-Term Sustainability

[1] Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.
pavaniamarakoon@gmail.com

# INVESTIGATING THE CHALLENGES TO PROMOTE SUSTAINABLE TOURISM IN ELLA, SRI LANKA

*W.A.Y.G. Wickramasinghe* [1]

Ella is a famous tourist destination in Sri Lanka. It is a small town located in the Badulla district of Uva Province. This popular tourist destination faces significant challenges in achieving sustainable tourism due to environmental, economic, and social problems. The objectives of this study are to investigate the challenges to promote sustainable tourism in Ella and suggest strategies for the identified challenges. The study adopts a qualitative approach, utilizing both primary and secondary data sources. Primary data was collected through site observation and semi-structured interviews with 20 respondents. Secondary data was collected using academic articles, reports, and websites. The findings reveal that environmental deterioration is a serious problem, with rising tourism contributing to waste management issues, water contamination, soil erosion, and deforestation. These problems affect the local ecosystem and biodiversity and endanger Ella's natural beauty. When the economic challenges are examined, it appears that tourism has contributed to the overall economic growth of the Ella area, but the benefits are unevenly distributed. Limited support for local entrepreneurs to promote sustainable tourism is also a challenge. This economic disparity limits opportunities for local entrepreneurship and appears to reduce the positive economic impact of tourism on the community. Social challenges include a lack of community participation in tourism planning, local resistance to change, lack of awareness, cultural erosion, and lack of infrastructure. These difficulties make it more difficult to incorporate sustainable tourism practices. Implementing eco-friendly practices, involving locals in tourism planning, awareness of the community, promoting local products, and providing incentives for local businesses can be identified as the solutions for preventing these challenges. This indicates that environmental deterioration, social issues, and economic inequality are the main obstacles to Ella's sustainable tourist promotion. These problems must be resolved to protect the region's natural beauty, guarantee equitable economic gains, and promote long-term communal well-being.

***Keywords:*** Sustainable Tourism, Ella, Environmental Deterioration, Economic Barriers, Community Involvement

[1] Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. gayathriwick1@gmail.com

# ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර සේවා පිළිබඳ විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අධ්‍යයනය (ඇල්ල.සංචාරක ප්‍රදේශය ආශ්‍රයෙන්)

*එම්.ආර්.එම්. උෂාන් [1], එච්.ජී.කේ.එන්. තරුෂි [2]*

සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තීරණාත්මක අංගයක් වේ. මේ වන විට ශ්‍රී ලංකාවට සංචාරක පැමිණීමේ ප්‍රවණතාවක් පවතියි. ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර පිළිබඳ විදේශීය සචාරකයන්ගේ තෘප්තිමත්භාවය සහ ඊට බලපාන බොහෝ වැදගත් සධක සොයා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ආගන්තුක සත්කාර සේවා සම්බන්ධයෙන් විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය කෙසේද යන්න අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන අතර ආගන්තුක සත්කාර සේවා සම්බන්ධයෙන් විදේශීය සංචාරකයන්ගේ සමස්ත තෘප්තිය තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.මෙම අධ්‍යයනය ප්‍රාථමික දත්ත මත පදනම් විය.ශ්‍රී ලංකාවේ ඇල්ල සංචාරක ප්‍රදේශයට පැමිණෙන විදෙස් සංචාරකයන් ගෙන් දත්ත රැස්කිරීම සිදු විය. ඒ යටතේ පහසු නියැදීමේ ක්‍රමය යොදා ගනිමින් තෝරාගත් නියැදිය තුළින් ප්‍රතිචාරකයන් 50 දෙනෙකුගෙන් දත්ත රැස් කරනු ලැබීය. අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් දත්ත රැස් කරන ලදී.සම්මුඛ සාකාච්ඡා සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙය සිදු විය. පර්යේෂණය ගුණාත්මක ප්‍රවේශය ඔස්සේ සිදු වූ අතර පර්යේෂණ සැලසුමද එයට සුදුසු පරිදි සිදු විය. රැස් කරනු ලැබූ දත්ත තේමා විශ්ලේෂණය යටතෙ ඛණ්ඩණය කොට විස්තරාත්මක දත්ත විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය සිදුවිය. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේදය මඟින් දත්තවල ප්‍රථිපල සංසන්දනය කිරීමක් විශ්ලේෂණය තුලදි සිදුවිය. ලාංකේය ආගන්තුක සත්කාර සේවා පිළිබඳ විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය අධ්‍යයන කිරිම සඳහා තෘප්තිමත්භාවය ට බලපාන සාධක ලෙස නවාතැන්, ආරක්ෂාව,සෞඛ්‍ය ආරක්ෂාව,මිල සහ ගෙවීම්, ප්‍රවාහනය, කාර්යාල, මෙහෙයුම් සහ ආහාරපාන යන සාධක මෙහිදි යොදා ගන්නා ලදි. විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අතුරින් නවාතැන්, ආහාරපාන, ප්‍රවාහනය සම්බන්ධයෙන් ඉහළ තෘප්තිමත්භාවයක් ද මිල සහ ගෙවීම්, ආරක්ෂාව සහ සෞඛ්‍ය ආරක්ෂාව, කාර්යාල, මෙහෙයුම් සම්බන්ධයෙන් මධ්‍යස්ථ තෘප්තියක් ද සොයාගැනීම් තුළින් පෙන්නුම් කරයි.සංචාරකයන්ගේ සමස්ථ අත්දැකීම් ගොඩනැගීමේදී ඔවුන්ගේ තෘප්තියට සහ නැවත පැමිණීමේ සම්භාවිතාවට බලපෑම් කිරීම සඳහා ආගන්තුක සත්කාර සේවා ප්‍රධාන කාර්යයභාර්යයක් ඉටු කරයි. උසස් තත්ත්වයේ ආගන්තුක සත්කාර සේවා මඟින් ගමනාන්තයක ආකර්ෂණය වැඩි දියුණු කළ හැකි අතර එය ධනාත්මක මුඛයෙන් ප්‍රවර්ධනය කිරීමට සහ සංචාරක පැමිණීම වැඩි කිරීමට හේතු වේ. සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය වැඩිදියුණු කලයුතු අංග පිළිබඳ සියුම් අවබෝධයක් ලබාගනු වස් මෙම අධ්‍යයනය වැදගත් බවද සඳහන් කල යුතුය.

***ප්‍රමුඛ පදඃ*** ආගන්තුක සත්කාර, සංචාරක තෘප්තිමත්භාවය, ඇල්ල ප්‍රදේශය, ශ්‍රී ලංකාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ushanu450@gmail.com

[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. nethmatharushi1@gmail.com

# ECO - TOURISM: AN ALTERNATIVE TOURISM APPROACH FOR DESTINATION DEVELOPMENT; A STUDY BASED ON THAWALANTHENNA, SRI LANKA

*K.W.M.D.I. Karunathilaka* [1]

Eco - tourism is an alternative tourism practice that can affect positively on the economic, social and cultural sectors of Sri Lanka. As a biodiversity hotspot and a popular tourism hotspot in the world, Sri Lanka has the potential and the resources to enhance the eco - tourism sector of the country. The objectives of this study are to identify the potential for eco - tourism in Thawalanthenna, Kandy, Sri Lanka and to identify how it can help in destination development in the area. Thawalanthenna is situated at the foot of the knuckles mountain range and is home to large tea plantations, attractive waterfalls and magnificent viewpoints. The study was conducted by using the qualitative research methodology. An exploration of amalgamation of qualitative data that was acquired through both primary and secondary data have been used and analyzed. According to the data obtained in the study, it was settled that the Thawalanthenna has a greater potential for ecotourism development and the potential to upgrade socio - economic life of the residents of the area. The results show that eco - tourism development will bring positive destination development outcomes to the environmental, social and economic sectors. It is expected that the unique rural and ecological features of the area are the main contributor in attracting the nature loving destination travelers, both international and local. Major challenges that were identified during the research are the lack of knowledge and awareness about eco - tourism, the lack of proper initiatives in tourism management in the area, the lack of understanding about the positive outcomes that can achieve by promoting eco - tourism, and the misconceptions about tourism among the residents. The study determined that Tawalanthenna has a huge eco - tourism potential that can be utilized and turn the area in to an eco - tourism hotspot and achieve destination development by practical application of the study.

***Keywords:*** Eco - Tourism, Alternative Tourism, Destination Development

[1] Department of Geography, University of Ruhuna. dilharakarunathilaka1@gmail.com

# POTENTIAL OF TRANSFORMING SRI LANKAN FOOD INDUSTRY WITH ROBOTIC TECHNOLOGY IN SRI LANKA

*Anupama Damunupola [1], H.A. Shanika Dilrukshi [2]*

Sri Lanka's food industry is a crucial component of the nation's economy, ranging from small family-run operations to larger commercial enterprises. Following global trends, the integration of robotic technology in the local food supply chain presents an opportunity to enhance operational efficiency, product quality, and streamline management processes. This study explores the feasibility of adopting robotic technology within Sri Lanka's food sector, highlighting its potential to modernize food production, processing, and service practices. The study assessed the feasibility of robotic technology by focusing on cost-efficiency, necessary infrastructure modifications, and its applicability to local food production. Additionally, study examined the extent of current robotic technology usage in Sri Lankan food establishments and gauged employee attitudes towards its implementation. Data was collected through a structured survey in the Negombo area and analyzed using SPSS, with hypothesis testing to evaluate the relationship between variables. The findings reveal a significant positive correlation between the adoption of robotic technology and improvements in operational performance across food businesses. Specially, 24.1% strongly agreed that robotic technology has the potential to transform the Sri Lankan food industry by increasing efficiency and improving product quality. However, challenges such as high initial investment costs, workforce adaptation and financial feasibility were also highlighted. Study revealed that despite increasing awareness of robotic technology, its practical application remains restricted to businesses with the necessary resources to implement such innovations. Furthermore, 65% of the workforce expressed interest in training programs. The recommendations include promoting robotics adoption through policy support, creating affordable solutions for smaller businesses, and investing in workforce training programs.

***Keywords:*** Robotic Technology, Sri Lanka, Food Industry, Automation, Technology Adaptation

[1] Department of Archaeology, Faculty of Social Sciences, University of Kelaniya.
dep.of.archaeology@gmail.com
[2]





URSSSH 2024

4th Undergraduate Research Symposium on Social Sciences and Humanities

ISSN 2719 -2253